# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2023 අංක 17 දරන
## බැංකු (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 සැප්තැම්බර් මස 14 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 සැප්තැම්බර් මස 15 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 180.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2023 අංක 17 දරන
# බැංකු (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2023 සැප්තැම්බර් මස 14 වන දින]

එල්.ඩී.—ඕ. 48/2022

**මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය සහ ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය, බුන්වත්භාවය පිළිබඳ හෝ වෙනත් යම් අවදානමකට යටත් බලපත්‍රලාභී බැංකුවක් කාලීනව නිරාකරණය කිරීම සඳහා මහ බැංකුව සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි නිරාකරණ ක්‍රියාමාර්ග සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කරමින් එවැනි බැංකුවක තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ යහපත සහතික කිරීම සඳහා එකී බැංකුව අඛණ්ඩ පැවැත්මක් සහිතව යළි පණගැන්වීම පිණිස ද; එවැනි බලපත්‍රලාභී බැංකු සඳහා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් සහ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

පනත අදාළ වීම

**2.** තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන, (මේ පනතේ "බලපත්‍රලාභී බැංකු" යනුවෙන් සඳහන් කරනු ලබන) බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකු නිරාකරණය කිරීම සඳහා මහ බැංකුව වෙත පවරා ඇති අධිකාරී බලයට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අදාළ විය යුතු ය.

## I වන කොටස

### මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය

මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය

**3.** මහ බැංකුව, මේ පනත යටතේ, බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන් නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය.

බලපත්‍රලාභී බැංකු නිරාකරණය කිරීමේ කාර්යය සඳහා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම

**4.** (1) මේ පනතේ කාර්ය සඳහා, මහ බැංකුව විසින්, මේ පනත යටතේ නිරාකරණය කිරීමේ අධිකාරී බලයට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිසි පරිදි සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා, මහ බැංකුව යටතේ දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව විසින්, යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍රලාභී බැංකු විෂයයෙහි නියාමන සහ අධීක්ෂණ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සිදු නොකරනු ලැබිය යුතු ය.

මහ බැංකුව විසින් නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම

**5.** (1) මහ බැංකුව විසින්, එහි නිරාකරණය කිරීමේ අධිකාරී බලයට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, නිරාකරණය කිරීමට යටත් වන බලපත්‍රලාභී බැංකුවේ ව්‍යුහය, පරිමාණය, සංකීර්ණත්වය, වෙනත් ආයතන සමග ඇති අන්තර් සම්බන්ධිතභාවය සහ අවදානම් පැතිකඩ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(2) නිරාකරණය කිරීමේ සැලැස්මට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම් සහ ඌණපූරණ සහ ස්ථානීය පරීක්ෂා කිරීම් හරහා එකතු කර ගන්නා ලද තොරතුරු ඇතුළුව, නිරාකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණය කිරීම සහ එම ක්‍රියාමාර්ග විධිමත්ව සකස් කිරීම සඳහා මහ බැංකුවට අවශ්‍ය වන යම් තොරතුරු සපයන ලෙස යම් තැනැත්තකු වෙත නියම කිරීමට මහ බැංකුවට බලය තිබිය යුතු ය.

(3) මේ පනත යටතේ, මහ බැංකුව විසින් යම් නියමයක්, නියෝගයක්, විධානයක්, නිශ්චය කිරීමක්, මාර්ගෝපදේශයක් හෝ උපදෙසක් නිකුත් කරනු ලැබ ඇති හෝ ඉල්ලීමක් කරනු ලැබ ඇති යම් බලපත්‍රලාභී බැංකුවක්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් හෝ වෙනත් යම් තැනැත්තකු, වහාම හෝ එහි නිශ්චිතව දක්වා ඇති

කාලසීමාවට වැඩි නොවන කාලසීමාවක දී, එම නියමය, නියෝගය, විධානය, නිශ්චය කිරීම, මාර්ගෝපදේශය හෝ උපදෙසට හෝ ඉල්ලීමට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) මහ බැංකුවේ සෑම නියාමන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවක් විසින් ම, මේ පනත යටතේ පිළියෙල කරන ලද නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අදාළ නියාමන හෝ අධීක්ෂණ අනුමතයන් සඳහා 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවට පහසුකම් සැලසීමට යුහුසුළුව සහයෝගය ලබා දිය යුතු ය.

වෙනත් ඇතැම් ප්‍රඥප්ති අදාළවීමෙන් බැහැර කිරීම

**6.** (1) නිරාකරණය කිරීමට, ගණන් බේරා වසා දැමීමට හෝ රක්ෂිත තැන්පතුවලට අදාළ මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්ති එකක හෝ වැඩි ගණනක විධිවිධාන හෝ එම විධිවිධානවල කොටසක්, මහ බැංකුව විසින් මේ පනතේ සහ මේ පනත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද හෝ සාදන ලද වෙනත් යම් නියෝගයක, නියමයක, විධානයක, නිශ්චය කිරීමක, මාර්ගෝපදේශයක හෝ උපදෙසක විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමේ දී මේ පනත යටතේ නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් වන සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අදාළ නොවිය යුතු ය.

(2) මහ බැංකුව විසින් මේ පනත යටතේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම නොතකා, බැංකු පනත හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයක්, නියමයක්, විධානයක්, නිශ්චය කිරීමක්, මාර්ගෝපදේශයක් හෝ උපදෙසක් යටතේ යම් බලපත්‍රලාභී බැංකුවකට අදාළ වන නියාමන අවශ්‍යතාවයන්, නිරාකරණය කිරීමට යටත් එකී බලපත්‍රලාභී බැංකුව සම්බන්ධයෙන් අදාළ කර ගැනීම අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

මේ පනතේ මේ කොටසේ විධිවිධාන බලපත්‍රලාභී බැංකුවක පාලක සමාගමක් ආදිය සඳහා අදාළ විය යුතු බව

**7.** (1) මහ බැංකුව විසින් නියාමනය හෝ අධීක්ෂණය නොකරනු ලබන, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභී බැංකුවක පාලක සමාගමක්, බලපත්‍රලාභී බැංකුවක පාලිත හෝ ආශ්‍රිත සමාගමක් හෝ එකී බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය සමූහය හෝ ව්‍යාපාර සමූහය තුළ යම් අස්ථිත්වයක් විසින්-

(අ) එකී නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුව සඳහා හෝ එය වෙනුවෙන්, එකී බලපත්‍රලාභී බැංකුවේ

තීරණාත්මක කර්තව්‍ය ඉටු කිරීම සඳහා වැදගත් වන්නේ යයි සලකනු ලබන යම් සේවා සපයනු ලබන බවට හෝ යම් කාර්ය ඉටුකරනු ලබන බවට; හෝ

(ආ) එකී සේවය හෝ කාර්යය එකී අස්ථිත්ව විසින් අත්හිටුවීම හෝ නතර කිරීම එකී බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ සුභසිද්ධියට අනර්ථකාරී වන බවට හෝ වීමට ඉඩ ඇති බවට හෝ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව අවදානම් තත්ත්වයකට පත් කරන බවට,

මහ බැංකුව සෑහීමට පත් වන අවස්ථාවක දී සහ තීරණාත්මක කර්තව්‍ය ඉටුකිරීමට වැදගත් වන යම් සේවයක් හෝ කාර්යයක් අඛණ්ඩව කරගෙන යාම සහතික කිරීමට එකී බලපත්‍රලාභී බැංකුව සඳහා කිසිදු විකල්පයක් නොපවතින අවස්ථාවක දී, මේ පනතේ මේ කොටසේ විධිවිධාන නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් වෙත අදාළ වන ආකාරයෙන් ම මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සමාගමක් හෝ අස්ථිත්වයක් වෙත මහ බැංකුව විසින් අදාළ කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද යම් සමාගමක් හෝ අස්ථිත්වයක්, මහ බැංකුව හැර යම් මූල්‍ය ක්ෂේත්‍රයේ නියාමකයකු විසින් නියාමනය කරනු ලබන අවස්ථාවක දී, මහ බැංකුව විසින්, මේ පනත යටතේ එකී සමාගම හෝ අස්ථිත්වය නිරාකරණය කිරීම සඳහා යම් ක්‍රියාමාර්ග ගැනීමට පෙරාතුව, එකී නියාමක විමසා එකී ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් එකී නියාමක වෙත නිසි දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

නිරාකරණය කිරීමේ අරමුණු

8. මහ බැංකුව විසින්, මේ පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් සිය නිරාකරණය කිරීමේ අධිකාරී බලයට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී-

(අ) ගෙවීමේ, නිෂ්කාශනය කිරීමේ සහ බේරුම් කිරීමේ පද්ධති ඇතුළු, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය;

(ආ) එම බලපත්‍රලාභී බැංකුවේ තීරණාත්මක කර්තව්‍යයන්හි අඛණ්ඩතාව;

(ඈ) රාජ්‍ය මූල්‍ය ආධාර අවම කිරීම මගින් මහජන අරමුදල්වල ආරක්ෂාව;

(ඇ) එම බලපත්‍රලාභී බැංකුවල තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව; සහ

(ඉ) එම බලපත්‍රලාභී බැංකුවේ වත්කම්වල වටිනාකම විනාශ වීම වැළැක්වීම සහ ණයහිමියන්ට වන අලාභ අවම කිරීම සහ නිරාකරණයේ සමස්ත පිරිවැය අවම කිරීම,

සහතික කිරීමට උත්සාහ දැරිය යුතු ය.

බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිසාධන සැලැස්මක් පිළියෙළ කළ යුතු බව

**9.** (1) සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින් ම, එම බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය තත්ත්වයේ පරිහානියක් සිදුවන අවස්ථාවක දී එම බලපත්‍රලාභී බැංකුව විසින් ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුතු, ප්‍රතිසාධන සැලැස්මක් එහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිසාධන සැලැස්මක් පිළියෙල කිරීමේ දී, බලපත්‍රලාභී බැංකුවක් විසින්, බලපත්‍රලාභී බැංකුවේ විශේෂිත ලක්ෂණවලට අදාළ සැලකිය යුතු මූල්‍යමය සහ සාර්ව ආර්ථික අර්බුද අවස්ථා, පද්ධතිමය අවස්ථා, සමස්තයක් වශයෙන් එම බලපත්‍රලාභී බැංකුවට සහ බැංකු සමූහයේ වෙනත් තනි අස්තිත්වයන්ට විශේෂිත වූ අර්බුද අවස්ථා සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) ප්‍රතිසාධන සැලැස්මක් පිළියෙල කිරීමේ දී, බලපත්‍රලාභී බැංකුවක්, යම් අතිවිශේෂ රාජ්‍ය මූල්‍ය ආධාරයක් වෙත ප්‍රවේශ වීමක් කිසිදු ආකාරයකින් බලාපොරොත්තු තබාගෙන නොසිටිය යුතු ය.

(4) සෑම බලපත්‍රලාභී බැංකුවක් ම, යටත් පිරිසෙයින් වාර්ෂිකව සිය ප්‍රතිසාධන සැලැස්ම යාවත්කාලීන කළ යුතු ය; නැතහොත්, ඒ ප්‍රතිසාධන සැලැස්මට සැලකිය යුතු බලපෑමක් සිදු විය හැකි එම බලපත්‍රලාභී බැංකුවේ සංවිධාන ව්‍යුහයේ හෝ නෛතික ව්‍යුහයේ හෝ ව්‍යාපාර කටයුතුවල හෝ මූල්‍ය තත්ත්වයේ හෝ යම් වෙනසක්

සිදුවන අවස්ථාවක, හෝ එම සැලැස්ම සුළු වශයෙන් වෙනස් කිරීම අවශ්‍ය වන අවස්ථාවක, මහ බැංකුවේ ඉල්ලීම මත එම සැලැස්ම යාවත්කාලීන කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද ප්‍රතිසාධන සැලැස්මක-

(අ) බලපත්‍රලාභී බැංකුවේ සාමාන්‍ය ප්‍රතිසාධන ධාරිතාවය පිළිබඳ ඉදිරිපත් කිරීමක්;

(ආ) බලපත්‍රලාභී බැංකුවේ වෙනත් ආයතනවල ස්වභාවය, පරිමාණය, ව්‍යූහය, සංකීර්ණතාවය සහ බලපත්‍රලාභී බැංකුව එම ආයතනවලට ඇති අන්තර් සම්බන්ධිතභාවය සලකා බලමින්, ප්‍රතිසාධන සැලැස්මේ විෂය පථය;

(ඇ) ප්‍රතිසාධන රාමුව යටතේ ආවරණය කරනු ලබන බැංකු සමූහය ඇතුළත ඇති වෙනත් අස්ථිත්වයන් පිළිබඳ විස්තර;

(ඈ) ප්‍රතිසාධන විකල්ප සම්බන්ධයෙන් සන්නිවේදන සැලසුම් කිරීම පිළිබඳ විස්තර;

(ඉ) සිදු කළ හැකි ප්‍රතිසාධන හෝ නිරාකරණ ක්‍රියාවලීන් යටතේ සම්පූර්ණ බලපත්‍රලාභී බැංකුවකට ම තීරණාත්මක කර්තව්‍ය හෝ තීරණාත්මක හවුල් සේවාවන් අඛණ්ඩව ලබාගත හැකි බව සහතික කරන ආකාරයකින් සංවිධානය කරනු ලබන, බලපත්‍රලාභී බැංකුවේ එම තීරණාත්මක කර්තව්‍ය සහ තීරණාත්මක හවුල් සේවාවන් පිළිබඳ හඳුනා ගැනීමක්;

(ඊ) ප්‍රතිසාධන ක්‍රියාත්මක කිරීම කාලානුරූපීව ක්‍රියාවේ යෙදවීම සහතික කිරීම සඳහා ප්‍රතිසාධන දර්ශක, ප්‍රේරක සහ කාර්ය පටිපාටි පිළිබඳ හඳුනා ගැනීමක්;

(උ) අවස්ථාවෝචිත පරිදි, අස්ථිත්ව විශේෂිත ආතතීන් හෝ වෙළෙඳපොළ ව්‍යාප්ත ආතතීන් හෝ එම ආතතීන් දෙවර්ගය ම තුළින් උද්ගත විය හැකි, ප්‍රාග්ධනය,

ද්‍රවශීලතාවය සහ වෙනත් පැතිකඩ විෂයයෙහි වන කම්පනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පවතින ප්‍රතිසාධන විකල්ප පරාසය;

(ඌ) ප්‍රතිසාධන විකල්ප ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කාලය සහ සම්පත්;

(එ) ප්‍රතිසාධන සැලැස්ම කාර්යක්ෂමව සහ කාලානුරූපීව ක්‍රියාවට නැංවීමට බාධා කළ හැකි සැලකිය යුතු සම්පත් ඌණතා;

(ඒ) ව්‍යාපාර අඛණ්ඩතාව සැලසුම් කිරීමක් තිබීම ද ඇතුළුව, අවහිරතාවලට පිළියම් යෙදීම සඳහා ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග;

(ඔ) ක්‍රියාත්මක කිරීමේ පිරිවැය පිළිබඳ විස්තර;

(ඕ) ප්‍රතිසාධන සැලැස්ම, බලපත්‍රලාභී බැංකුවේ කළමනාකාරීත්වයට ඒකාබද්ධ කරනු ලබන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක්;

(ක) බලපත්‍රලාභී බැංකුවේ ප්‍රතිසාධන සැලැස්ම වැඩි දියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු තැනැත්තන් කවුරුන් ද යන්න;

(ග) ප්‍රතිසාධන සැලැස්ම අනුමත කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි;

(ච) (i) බලපත්‍රලාභී බැංකුවේ අරමුදල් සංරක්ෂණය කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා;

(ii) විභව්‍ය ද්‍රවශීලතා ප්‍රභවයන්, පවතින සුරැකුම් පිළිබඳ තක්සේරුව සහ බැංකු සමූහයේ අස්තිත්වයන් අතර සහ ව්‍යාපාර අතර ද්‍රවශීලතාව මාරු කිරීමේ හැකියාව පිළිබඳ තක්සේරුව ඇතුළුව, හදිසි මූල්‍යකරණ ප්‍රභවයන්ට බලපත්‍රලාභී බැංකුවට ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා;

(iii) බලපත්‍රලාභී බැංකුව විසින්, එහි කටයුතු සහ බැඳීම් කිරීමට සහ ඉටු කිරීමට නියමිත වූ විට, එම කටයුතු අඛණ්ඩව කරගෙන යා හැකි බව සහ බැඳීම් ඉටු කළ හැකි බව සහතික කිරීම සඳහා;

(iv) උත්තෝලක අවදානම සහ බලපෑම අඩු කර ගැනීම සඳහා;

(v) ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා;

(vi) මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම්වලට අඛණ්ඩ ප්‍රවේශය පවත්වාගෙන යාම සඳහා;

(vii) මූල්‍යමය ස්ථායීතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම පිණිස උචිත කාලසීමාවක් තුළ වත්කම් හෝ ව්‍යාපාර විකිණීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා; සහ

(viii) ප්‍රතිසාධන සැලැස්ම කාලානුරූපීව ප්‍රතිආයෝජනයට ඉඩ සැලැස්වීම සඳහා අවශ්‍ය පියවර ඇතුළුව, එය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා,

වන ක්‍රමවේද සහ පියවර;

(ජ) මූල්‍ය ස්ථායීතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම ඉලක්ක කරගත් වෙනත් කළමනාකරණ ක්‍රියාමාර්ග හෝ උපායමාර්ග සහ එම ක්‍රියාමාර්ගවල හෝ උපායමාර්ගවල අපේක්ෂිත මූල්‍ය බලපෑම්;

(ට) බලපත්‍රලාභී බැංකුව විසින්, මහ බැංකුව විසින් පිරිනමනු ලබන මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ විය හැකි සහ සුරැකුම් වශයෙන් සුදුසුකම් ලැබිය හැකි වත්කම් හඳුනා ගැනීම අපේක්ෂා කළ හැකි අවස්ථා පිළිබඳ විශ්ලේෂණයක්;

(ඩ) බලපත්‍රලාභී බැංකුව විසින් සම්මත කරගෙන ඇති හෝ සම්මත කර ගැනීමට අදහස් කරන ප්‍රාරම්භක පියවර; සහ

(ඍ) ප්‍රතිසාධන සැලැස්මක ඇතුළත් විය යුතු බවට, මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චිතව දක්වනු ලැබිය හැකි හෝ නියම කරනු ලැබිය හැකි හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් නියමයන් හෝ තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

(6) මහ බැංකුව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද ප්‍රතිසාධන සැලසුම්, අනුමතය සඳහා, එක් එක් ලිත් වර්ෂය ඉකුත් වීමෙන් මාස එකක කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙසට සියලුම හෝ තෝරාගත් බලපත්‍රලාභී බැංකු වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(7) බලපත්‍රලාභී බැංකුවක් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිසාධන සැලැස්මක ප්‍රධාන අඩුපාඩු ඇති බවට හෝ ප්‍රතිසාධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී බාධක ඇති බවට මහ බැංකුව විසින් සලකනු ලබන අවස්ථාවක දී, මහ බැංකුව විසින් එම අඩුපාඩු හෝ බාධක පිළිබඳව එම බලපත්‍රලාභී බැංකුව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, එම නිවේදනය ලබා දුන් දින සිට මාස එකක කාලයක් ඇතුළත, එම අඩුපාඩු හෝ බාධක මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් විසඳුම් ඇතුළත්, සංශෝධිත ප්‍රතිසාධන සැලැස්මක් ඉදිරිපත් කරන ලෙසට එම බලපත්‍රලාභී බැංකුව වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(8) මහ බැංකුව විසින්, බලපත්‍රලාභී බැංකුවේ ඉල්ලීම මත, (7) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව, (7) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති මාස එකක කාලසීමාව ඉකුත් වන දින සිට දින දාහතරක කාලයක් නොඉක්මවන කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(9) (අ) බලපත්‍රලාභී බැංකුවක් විසින් එහි ආර්ථික කටයුත්තට හඳුන්වා දීමට අවශ්‍ය වෙනස්කම් හඳුනාගෙන නොමැති බව; හෝ

(ආ) එම ප්‍රතිසාධන සැලැස්මෙහි පවතින අඩුපාඩුවලට හෝ බාධකවලට විසඳුම් ලබා දීමට බලපත්‍රලාභී බැංකුව විසින් යෝජනා කරන ලද ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව,

මහ බැංකුවේ මතය වන අවස්ථාවක දී, මහ බැංකුව විසින්, එම අඩුපාඩුවල බරපතළභාවය සහ බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව සිදුකර ගෙනයාම කෙරෙහි අදාළ ක්‍රියාමාර්ගවල බලපෑම සැලකිල්ලට ගනිමින්, (10) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් හෝ අවශ්‍ය සහ සමානුපාතික යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට එම බලපත්‍රලාභී බැංකුව වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(10) (9) වන උපවගන්තියේ දක්වා ඇති ක්‍රියාමාර්ගවලට පහත දැක්වෙන දේ ඇතුළත් විය යුතු යː-

(අ) ද්‍රවශීලතා අවදානම අඩු කිරීම ඇතුළුව, බලපත්‍රලාභී බැංකුවේ අවදානම් පැතිකඩ අඩු කිරීම;

(ආ) කඩිනම් ප්‍රති ප්‍රාග්ධනීකරණ ක්‍රියාමාර්ග අදාළ කිරීම;

(ඇ) බලපත්‍රලාභී බැංකුවේ උපාය මාර්ගය සහ ව්‍යුහය සමාලෝචනය කිරීම;

(ඈ) තීරණාත්මක කර්තව්‍යවල කම්පන ප්‍රතිරෝධ ශක්තිය වැඩි දියුණු කිරීම පිණිස, මූල්‍ය උපායමාර්ගය සුළු වශයෙන් වෙනස් කිරීම; හෝ

(ඉ) බලපත්‍රලාභී බැංකුවේ පරිපාලන ව්‍යුහය සුළු වශයෙන් වෙනස් කිරීම.

ප්‍රතිසාධන සැලසුම් පිළියෙල කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් විධාන නිකුත් කරනු ලැබිය හැකි බව

**10.** (1) මහ බැංකුව විසින්, කලින් කල, යම් බලපත්‍රලාභී බැංකුවක ප්‍රතිසාධන සැලසුම් පිළියෙල කිරීම සම්බන්ධයෙන් එම බලපත්‍රලාභී බැංකුව වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) මහ බැංකුවේ නියාමන හෝ අධීක්ෂණ දෙපාර්තමේන්තු විසින්, බලපත්‍රලාභී බැංකුවල ප්‍රතිසාධන සැලසුම් නැවත තක්සේරු කිරීමක් හෝ යාවත්කාලීන කිරීමක් අවශ්‍ය වන යම් වෙනස් කිරීම් පිළිබඳව 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

මහ බැංකුව විසින් නිරාකරණය කිරීමේ සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු බව

**11.** (1) මහ බැංකුව විසින්, නිරාකරණය කිරීම සඳහා අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහපත් පරිචයන් හා අනුකූලව, පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති එක් එක් බලපත්‍රලාභී බැංකුව සඳහා නිරාකරණය කිරීමේ සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා, යම් බලපත්‍රලාභී බැංකුවක් එහි විශාලත්වය, අන්තර් සම්බන්ධිතභාවය, ආදේශ කිරීමේ හැකියාවක් නොමැති වීම, සංකීර්ණත්වය හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන ඒ හා සමාන නිර්ණායක හේතුවෙන් එම බැංකුවේ බිඳවැටීම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය කෙරෙහි බරපතළ බලපෑමක් ඇතිවිය හැකි හෝ ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවක දී එවැනි යම් බලපත්‍රලාභී බැංකුවක් පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති බලපත්‍රලාභී බැංකුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින්, (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද නිරාකරණය කිරීමේ සැලැස්මක්, කාලානුරූපීව හෝ එම බලපත්‍රලාභී බැංකුවේ සංවිධාන ව්‍යුහයේ හෝ එහි ව්‍යාපාර කටයුතුවල හෝ එහි මූල්‍ය තත්ත්වයේ හෝ යම් වැදගත් වෙනස්කම් සිදු කිරීමෙන් ඉක්බිතිව, ඇගයීමට ලක්කර යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

(3) මහ බැංකුව විසින්, නිරාකරණය කිරීමේ සැලැස්මෙහි, නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වන විකල්පයන් සහ එකී නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

(4) මහ බැංකුවේ ඉල්ලීම මත, බලපත්‍රලාභී බැංකුවක් විසින්, මහ බැංකුව විසින් නිරාකරණය කිරීමේ සැලැස්ම විස්තාරණය කිරීමේ දී සහ යාවත්කාලීන කිරීමේ දී මහ බැංකුව වෙත සහාය ලබා දිය යුතු ය.

(5) මහ බැංකුව විසින් සකස් කරන ලද නිරාකරණය කිරීමේ සැලැස්ම ඇගයීමක් හෝ යාවත්කාලීන කිරීමක් සිදු කිරීමට අවශ්‍ය විය හැකි යම් වෙනස් කිරීම් පිළිබඳව බලපත්‍රලාභී බැංකුව විසින් වහාම මහ බැංකුව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) බලපත්‍රලාභී බැංකුව විසින්, මහ බැංකුවේ ඉල්ලීම මත, නිරාකරණය කිරීමේ සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා-

(අ) අදාළ කර්තව්‍යවලට සහ කටයුතුවලට අදාළව දරනු ලබන සැලකිය යුතු වත්කම් සහ වගකීම් ඇතුළුව එම බලපත්‍රලාභී බැංකුවේ තීරණාත්මක කර්තව්‍ය;

(ආ) බලපත්‍රලාභී බැංකුවේ සහ එහි පාලනය යටතේ පවතින සියලු නෛතික අස්ථිත්වයන්හි ණය පිළිබඳ බැඳීම් අයත් වන්නා වූ පන්තිය හෝ පන්ති පිළිබඳ විස්තරය;

(ඇ) බලපත්‍රලාභී බැංකුවේ සහ බැංකු සමූහය තුළ වෙනත් නෛතික අස්ථිත්වයන්හි ශේෂ පත්‍රයෙන් පරිබාහිර නිරාවරණයන්;

(ඈ) බලපත්‍රලාභී බැංකුවේ සහ බැංකු සමූහය තුළ වෙනත් නෛතික අස්ථිත්වයන්හි අවදානම් ඉදිරි රැකුමන් කිරීම සම්බන්ධයෙන් වන ප්‍රධාන මෙහෙයුම්;

(ඉ) බලපත්‍රලාභී බැංකුවේ හෝ එහි තීරණාත්මක කර්තව්‍යයන්හි ප්‍රධාන ගිවිසුම්ගත ප්‍රතිපාර්ශ්වයන්;

(ඊ) ප්‍රධාන ගිවිසුම්ගත ප්‍රතිපාර්ශ්වයන් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවේ පරිහානියට පත් වූ මූල්‍ය තත්ත්වයේ බලපෑම පිළිබඳ විශ්ලේෂණයක්;

(උ) නෛතික අස්ථිත්වයන් සහ තීරණාත්මක කර්තව්‍ය සමඟ ඔවුන්ගේ ගනුදෙනු කිරීම් හඳුනා ගැනීම ඇතුළුව සංඛ්‍යාව හෝ වටිනාකම ප්‍රකාරව බලපත්‍රලාභී බැංකුව විසින් සැලකිය යුතු ගනුදෙනු සිදුකරනු ලබන එක් එක් පද්ධතිය;

(ඌ) නෛතික අස්ථිත්වයන් සහ තීරණාත්මක කර්තව්‍ය සමඟ ඔවුන්ගේ ගනුදෙනු කිරීම් ඇතුළුව බලපත්‍රලාභී බැංකුව සෘජුව හෝ වක්‍රව සහභාගීවන්නකු වන එක් එක් ගෙවීම්, නිෂ්කාශන හෝ බේරුම් කිරීමේ පද්ධතිය;

(එ) නෛතික අස්ථිත්වයන් සහ තීරණාත්මක කර්තව්‍ය සමඟ ඔවුන්ගේ ගනුදෙනු කිරීම් ඇතුළුව බලපත්‍රලාභී බැංකුව විසින් භාවිත කරනු ලබන ඉන්වෙන්ට්‍රිය, සහ අවදානම් කළමනාකරණය, ගිණුම්කරණය සහ මූල්‍ය සහ ව්‍යවස්ථාපිත වාර්තාකරණය පිළිබඳ ප්‍රධාන තොරතුරු කළමනාකරණ පද්ධති;

(ඒ) නෛතික අස්ථිත්වයන් සහ තීරණාත්මක කර්තව්‍ය සමඟ ඔවුන්ගේ ගනුදෙනු කිරීම් ඇතුළුව සේවා-ආශ්‍රිත තොරතුරු කළමනාකරණ පද්ධති, තොරතුරු තාක්ෂණ පද්ධති සැපයීම හෝ බලපත්‍ර සම්බන්ධව ලියා අත්සන් කරන ලද ගිවිසුම්;

(ඔ) කාර්ය මණ්ඩලය, බෙදාගත් පහසුකම් සහ පද්ධති හෝ ප්‍රාග්ධන මූල්‍යකරණ හෝ ද්‍රවශීලතා යාන්ත්‍රණ, පවතින හෝ අසම්භාව්‍ය ණය නිරාවරණ, දේශාන්තර සමපාර්ශ්වීය සුරැකුම් පිළිබඳ ගිවිසුම්, ප්‍රතිලෝම පැහැර හැරීමේ සමපාර්ශ්වීය සුරැකුම් පිළිබඳ ගිවිසුම් සහ අනුබද්ධ ආයතන අතර දේශාන්තර පියවීම පිළිබඳ ගිවිසුම්, අවදානම් මාරු කිරීමේ වැඩපිළිවෙළ සහ එකකට පසුව එකක් වශයෙන් වන වෙළෙඳ ගිවිසුම් හෝ සේවා සැපයීමේ ගිවිසුම් ඇතුළුව බලපත්‍රලාභී බැංකු සහ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් අතර ඇති අන්තර් සම්බන්ධිතභාවය සහ එකිනෙකා කෙරෙහි රඳා පැවතීම;

(ඕ) බලපත්‍රලාභී බැංකුවේ නිරාකරණය කිරීමේ සැලැස්ම විස්තාරණය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා වගකිව යුතු, බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය;

(ක) නිරාකරණය කිරීමේ සැලැස්මේ කාර්ය සඳහා අවශ්‍ය සියලු තොරතුරු මහ බැංකුව වෙත ලැබෙන බව සහතික කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුව විසින් ක්‍රියාවට නංවා ඇති යාන්ත්‍රණ;

(ග) නිරාකරණ ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් අදාළ කර ගැනීම සඳහා අධිකාරීන් විසින් ගනු ලබන තීරණයක් හේතුවෙන් සිදු කරනු ලැබිය හැකි බලපත්‍රලාභී බැංකුව සහ බැංකු සමූහයේ වෙනත් නෛතික අස්ථිත්වයක් විසින් තෙවන පාර්ශ්වයක් සමඟ ඇතිකර ගනු ලැබ ඇති ගිවිසුම් අවසන් කිරීම් සහ එම ගිවිසුම් අවසන් කිරීමේ ප්‍රතිඵලය හේතුවෙන් එම නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපෑමක් ඉන් ඇති විය හැකි ද යන්න; සහ

(ච) නිරාකරණයට සහය වීම සඳහා පැවතිය හැකි ද්‍රවශීලතා මූලාශ්‍ර,

පිළිබඳ විස්තර ඇතුළුව, අවශ්‍ය සියලු තොරතුරු මහ බැංකුව වෙත සපයනු ලැබිය යුතු ය.

(7) මහ බැංකුවේ සියලු නියාමන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තු සහ මහ බැංකුව හැර මූල්‍ය ක්ෂේත්‍රය නියාමනය කරනු ලබන වෙනත් අධිකාරියක් විසින්, නිරාකරණය කිරීමේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ, එම කාර්ය සඳහා (6) වන උපවගන්තියේ දක්වා ඇති තොරතුරු එකී නියාමන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තු සහ මහ බැංකුව හැර මූල්‍ය ක්ෂේත්‍රය නියාමනය කරනු ලබන වෙනත් අධිකාරියක් විසින් ලබා ගත හැකි බව සහතික කිරීමට, 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව වෙත සහයෝගය ලබා දිය යුතු ය. එකී තොරතුරු පවතින අවස්ථාවක දී, එකී දෙපාර්තමේන්තු සහ අධිකාරීන් විසින් එකී තොරතුරු 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතු ය.

(8) මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් තිබෙන්නේ යයි සලකනු නොලබන බලපත්‍රලාභී බැංකුවක් හෝ බැංකු සඳහා සරල කරන ලද නිරාකරණය කිරීමේ සැලසුම් සකස් කරනු ලැබිය හැකි ය.

නිරාකරණය කිරීමේ හැකියාව පිළිබඳ තක්සේරුව

**12.** (1) මහ බැංකුව විසින්, 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිරාකරණය කිරීමේ සැලැස්මක් පිළියෙල කරනු ලැබ ඇති යම් බලපත්‍රලාභී බැංකුවක පද්ධතිමය වැදගත්කම හෝ බලපෑම සැලකිල්ලට ගනිමින්, එම බලපත්‍රලාභී බැංකුව නිරාකරණය කළ හැකි වන්නේ ද යන්න තක්සේරු කර-

(අ) මේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍යකරණ යාන්ත්‍රණ හැර, අතිවිශේෂ රාජ්‍ය මූල්‍ය ආධාර; සහ

(ආ) සහතික කළ හෝ අන්‍යාකාරයක වුව ද, හදිසි අවස්ථාවන්හි දී මහ බැංකුවෙන් ද්‍රවශීලතා සහාය,

භාවිත නොකරමින් බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීම සඳහා වන විශ්වසනීය උපායමාර්ග සඳහා ඉඩ ලබා දෙන ආකාරයකින්,

එකී එක් එක් බලපත්‍රලාභී බැංකුවක් සඳහා යෝග්‍ය සහ ප්‍රායෝගික යයි සලකනු ලැබිය හැකි යම් නිරාකරණ ක්‍රියාමාර්ග වැඩි දියුණු කරනු ලැබිය යුතු ය.

(2) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට අගතියක් නොවන පරිදි, යම් බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමේ හැකියාව නිර්ණය කිරීමේ දී මහ බැංකුව විසින්, පහත දැක්වෙන පියවර එකක් හෝ වැඩි ගණනක් ඇතුළුව එම බලපත්‍රලාභී බැංකුව වෙත විධාන කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් පියවර ගනු ලැබිය යුතු ය:-

(අ) බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය සමූහයට අදාළ වෙනත් අස්ථිත්වයන් සමග අන්තර් සමූහ මූල්‍ය ආධාර ගිවිසුමක් ප්‍රතිශෝධනය කර අවසානාත්මක කිරීමට;

(ආ) මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුව නිරාකරණය කිරීමට යටත් කරන අවස්ථාවක දී, යම් ගිවිසුම්වලට බලපෑමක් නොවන බව සහතික කිරීම ඉලක්ක කර ගනිමින්, තුන්වන පාර්ශ්වයන් සමඟ සේවා ගිවිසුමකට එළඹීමට හෝ පවතින ගිවිසුම්වලට වගන්ති ඇතුළත් කිරීමට;

(ඇ) එහි නිරාවරණය තනි අස්ථිත්වයකට හෝ ආශ්‍රිත අස්ථිත්ව සමූහයකට සීමා කිරීමට;

(ඈ) නිශ්චිත වත්කම් බැහැර කිරීමට;

(ඉ) නිශ්චිත කටයුතු ඉටු කිරීම හෝ සංවර්ධනය කිරීම හෝ නව කටයුතු ආරම්භ කිරීම සීමා කිරීමට හෝ නතර කිරීමට;

(ඊ) තීරණාත්මක කර්තව්‍ය, නිරාකරණය කිරීමේ ක්‍රියා පටිපාටියේ වෙනත් කර්තව්‍යවලින් වෙන් කරනු ලැබිය හැකි බව සහතික කරමින්, බලපත්‍රලාභී බැංකුවට නිසි නෛතික සහ සංවිධානමය වෙනස්කම් හඳුන්වා දීමට;

(උ) නිශ්චිත අලාභ ආවරණය කිරීම සඳහා රක්ෂණ යාන්ත්‍රණ ඇතුළු යාන්ත්‍රණ ස්ථාපිත කිරීමට; සහ

(ඌ) අලාභ අවශෝෂණ වගකීම් ඇතුළුව, ප්‍රාග්ධන සහ වගකීම් සඳහා වන අවම අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වන යම් පියවර ගැනීමට.

(3) මහ බැංකුව විසින්, කලින් කලට, යම් බලපත්‍රලාභී බැංකුවක නිරාකරණය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් තක්සේරු කිරීමක් සිදුකිරීම සඳහා භාවිත කරනු ලැබිය යුතු ප්‍රධාන අංග, ප්‍රමිතීන් සහ නිර්ණායක නිශ්චිතව දක්වමින්, එකී බලපත්‍රලාභී බැංකුව නිරාකරණය කිරීමේ හැකියාව සහතික කිරීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් බලපත්‍රලාභී බැංකුවක නිරාකරණය කළ හැකි බව තක්සේරු කිරීමේ දී එකී බලපත්‍රලාභී බැංකුවට කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

(5) මහ බැංකුව විසින්, යම් බලපත්‍රලාභී බැංකුවක නිරාකරණය කිරීමේ හැකියාව තක්සේරු කිරීමේ දී මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකන්නේ නම් එම බලපත්‍රලාභී බැංකුවේ සමූහ වශයෙන් වන නිරාවරණය සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

නිරාකරණය කිරීම සඳහා වන කොන්දේසි

13. (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් බලපත්‍රලාභී බැංකුවක් තවදුරටත් ශක්‍ය නොවන බව හෝ ශක්‍ය නොවීමට ඉඩ ඇති බවට සහ (2) වන උපවගන්තියේ දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ ඉදිරියේ දී ශක්‍ය බවට පත්වීමේ කිසිදු සාධාරණ බලාපොරොත්තුවක් නොමැති බවට මහ බැංකුව සෑහීමට පත් වන අවස්ථාවක දී, මහ බැංකුව විසින් මේ පනත යටතේ එකී බලපත්‍රලාභී බැංකුව නිරාකරණය කිරීමට තීරණය කළ හැකි ය.

(2) බලපත්‍රලාභී බැංකුවක් පහත දැක්වෙන අවස්ථානුගත කරුණු එකක් හෝ වැඩි ගණනක් පවතින අවස්ථාවක දී, තවදුරටත් ශක්‍ය නොවන බව හෝ ශක්‍ය නොවීමට ඉඩ ඇති බව සහ ඉදිරියේ දී ශක්‍ය බවට පත්වීමේ කිසිදු සාධාරණ බලාපොරොත්තුවක් නොමැති බවට සලකනු ලැබේ:-

(අ) යම් බලපත්‍රලාභී බැංකුවක් එම බලපත්‍රලාභී බැංකුව වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට මහ බැංකුව වෙත බල කෙරෙන ආකාරයකින්, නියාමන, ප්‍රාග්ධන සහ

ද්‍රවශීලතා නියමයන් ඇතුළුව, බැංකු පනතේ හෝ ඒ යටතේ සාදන ලද, නිකුත් කරන ලද හෝ පනවන ලද යම් නියෝගයක, විධානයක, නිශ්චය කිරීමක, ආඥාවක හෝ යම් නියමයක විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව හෝ අපොහොසත් වීමට ඉඩ ඇති බව මහ බැංකුවේ මතය වන අවස්ථාවක දී;

(ආ) බලපත්‍රලාභී බැංකුවක් බුන්වත්භාවයට පත්වී ඇති බව හෝ පත්වීමට ඉඩ ඇති බව මහ බැංකුවේ මතය වන අවස්ථාවක දී; හෝ

(ඇ) බලපත්‍රලාභී බැංකුවකට එහි තැන්පත්කරුවන් සහ වෙනත් ණයහිමියන් වෙත ඉටුකළ යුතු වන බැඳීම් ඉටුකිරීමට නොහැකි වන්නා වූ විට හෝ එම බලපත්‍රලාභී බැංකුවට එහි තැන්පත්කරුවන් හෝ වෙනත් ණයහිමියන් වෙත ඉටුවිය යුතු එහි බැඳීම් ඉටුකිරීමට නොහැකි බව මහ බැංකුවේ මතය වන අවස්ථාවක දී.

(3) බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් යම් පූර්ව මැදිහත්වීමේ ක්‍රියාමාර්ග හෝ වෙනත් යම් අධීක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, මේ පනත යටතේ මහ බැංකුවට එහි නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව කොන්දේසියක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමට මහ බැංකුව තීරණය කරන අවස්ථාවක දී, මහ බැංකුව විසින් එහි තීරණය ලිඛිතව එකී බලපත්‍රලාභී බැංකුව වෙත දැනුම් දී මේ පනත යටතේ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමට මහ බැංකුව තීරණය කරනු ලබන අවස්ථාවක දී, මහ බැංකුව විසින්, 14 වන වගන්තියේ දක්වා ඇති නිරාකරණය කිරීමේ බලතල එකක් හෝ වැඩි ගණනක් ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය:

එසේ වුව ද, (4) වන උපවගන්තියේ දක්වා ඇති නිවේදනය සිදු කරන ලද දින සිට දින තිහකට නොවැඩි කාලසීමාවක් ඇතුළත, මහ බැංකුව විසින් යටත් පිරිසෙයින් එකී නිරාකරණය කිරීමේ බලතල එකක් හෝ ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

(6) නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් විසින්, මේ පනත යටතේ නිරාකරණ ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලැබීමෙන් පසුව, මහ බැංකුවේ පාලනය යටතේ ස්වකීය ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

මහ බැංකුවේ නිරාකරණය කිරීමේ බලතල

**14.** (1) බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමේ කාර්යය සඳහා-

(අ) එකී බලපත්‍රලාභී බැංකුවට අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමට;

(ආ) එකී බලපත්‍රලාභී බැංකුවේ කොටස් පැවරීමක් ක්‍රියාවට නැංවීමට;

(ඇ) එකී බලපත්‍රලාභී බැංකුවේ සියලුම හෝ යම් තෝරාගත් වත්කම් සහ වගකීම් පැවරීමට;

(ඈ) දැනට සිටින කොටස් හිමියන් සහ අලුත් කොටස් හිමියන් හරහා ප්‍රාග්ධනය වැඩි කිරීමක් බලාත්මක කිරීමට;

(ඉ) සේතු බැංකුවක් පිහිටුවීම සඳහා ප්‍රාග්ධනය සපයන ලෙසට අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීමට; හෝ

(ඊ) තත්කාර්ය සඳහා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මත පදනම් ව, එකී බලපත්‍රලාභී බැංකුව නිරාකරණය කිරීම සඳහා තාවකාලික මූල්‍ය සහාය සපයන ලෙසට අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීමට,

මහ බැංකුවට බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමේ කාර්යය සඳහා, (1) වන උපවගන්තියේ දක්වා ඇති බලතලවලට අමතරව, මහ බැංකුව විසින් සෘජුව හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම හරහා, තනිව හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු සමඟ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි පහත දැක්වෙන බලතල එයට තිබිය යුතු ය:-

(අ) අධ්‍යක්ෂවරයන්, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හෝ එකී බලපත්‍රලාභී බැංකුවේ වෙනත් යම් සේවානියුක්තයකු ඉවත් කිරීමට හෝ ප්‍රතියෝජනය කිරීමට;

(ආ) එකී බලපත්‍රලාභී බැංකුව විසින්, (අ) ඡේදයේ දක්වා ඇති යම් තැනැත්තකු වෙත ගෙවනු ලබන විචල්‍ය පාරිශ්‍රමික අය කර ගැනීමට හෝ ආපසු ලබා ගැනීමට;

(ඇ) යම් ගනුදෙනුවක දී එකී බලපත්‍රලාභී බැංකුවේ කොටස් හිමියන්ගේ අයිතීන් අභිභවනය කිරීමට;

(ඈ) ගිවිසුම් අවසන් කිරීමට, අඛණ්ඩව පවත්වාගෙන යාමට හෝ පැවරීමට, වත්කම් මිල දී ගැනීමට හෝ විකිණීමට, ණය වටිනාකම ලියාහැරීමට සහ බලපත්‍රලාභී බැංකුවේ මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීමට හෝ අවසන් කිරීමට අවශ්‍ය වෙනත් යම් ක්‍රියාමාර්ග ගැනීමට;

(ඉ) (i) තාවකාලික කාලසීමාවක් සඳහා බලපත්‍රලාභී බැංකුව විසින් එහි අනුප්‍රාප්තිකයාට හෝ යම් අත්කර ගැනීමේ සමාගමක් වෙත;

(ii) බලපත්‍රලාභී බැංකුව වෙනුවෙන් අනුබද්ධ නොවන තුන්වන පාර්ශ්වයන්ගෙන් අවශ්‍ය සේවා ප්‍රසම්පාදනය කර ගැනීමෙන්;

(iii) නිරාකරණය කිරීමට පෙරාතුව පවතින නියමයන් සහ කොන්දේසි යටතේ සේතු බැංකුව ඇතුළු පැවරුම්ලාභී බැංකුවක් වෙත බලපත්‍රලාභී බැංකුවේ තීරණාත්මක කර්තව්‍ය අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය වන පරිදි අඛණ්ඩව යම් සේවාවන් සපයන ලෙසට යම් සේවා සපයන්නකු වෙත නියම කිරීමෙන්,

අත්‍යවශ්‍ය සේවා සහ තීරණාත්මක කර්තව්‍ය අඛණ්ඩව සිදු කරගෙන යාම සහතික කිරීමට;

(ඊ) මහ බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර කටයුතු සියල්ලම හෝ කොටසක් අත්හිටුවීමට, සීමා කිරීමට හෝ තහනම් කිරීමට;

(උ) (i) බලපත්‍රලාභී බැංකුව නිරාකරණයට එළඹීම හෝ මේ පනත යටතේ යම් නිරාකරණ බලතල ක්‍රියාත්මක කිරීම ප්‍රකාරව පැන නගින, බලපත්‍රලාභී බැංකුව පාර්ශ්වයක් වන මූල්‍ය ගිවිසුමක් කඩිනම් කිරීමේ අයිතිය, අවසන් කිරීමේ අයිතිය හෝ හිලව් කිරීමේ අයිතිය;

(ii) බලපත්‍රලාභී බැංකුව පාර්ශ්වයක් වන ගිවිසුමක් යටතේ ගෙවීමක් හෝ භාර දීමක් කිරීමට ඇති බැඳීම;

(iii) බලපත්‍රලාභී බැංකුව පාර්ශ්වයක් වන ගිවිසුමක් යටතේ වත්කම් තහනමට ගැනීමට හෝ අන්‍යාකාරයකින් මුදල් හෝ දේපළ එකතු කිරීමට ඇති අයිතිය,

වැඩ කරන දින දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා අත්හිටුවීමට;

(ඌ) බලපත්‍රලාභී බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කිරීමෙන් සහ අලුත් කොටස් හිමියන්ට කොටස් විකිණීමෙන් සහ බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමෙන් බලපත්‍රලාභී බැංකුව ප්‍රතිසංවිධානය කිරීමට;

(එ) බලපත්‍රලාභී බැංකුවේ ශක්‍ය නොවන ව්‍යාපාර කටයුතු වසා දැමීම හෝ එහි කළමනාකාරීත්වය ප්‍රතිසංවිධානය කිරීම ඇතුළු තැන්පත්කරුවන්ගේ යහපත සඳහා කවර හෝ ආකාරයකින් බලපත්‍රලාභී බැංකුව ප්‍රතිසංස්කරණය කිරීමට;

(ඒ) බලපත්‍රලාභී බැංකුවක කොටස්හිමියන්ට සහ යටත් ණයහිමියන්ට වෙන් කළ යුතු අලාභ හඳුනා ගැනීමට;

(ඔ) බලපත්‍රලාභී බැංකුවේ ණය බැඳීම්, ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීමට;

(ඕ) මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ යම් නියම සහ කොන්දේසි මත, බලපත්‍රලාභී බැංකුවේ වියදමෙන්, ස්වාධීන නීතිඥවරයන්, ගණකාධිකාරීවරුන්, විගණකවරයන්, තක්සේරු කිරීමේ විශේෂඥයන් සහ උපදේශකවරයන් යොදවා ගැනීමට;

(ක) මේ පනත යටතේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද වියදම් පියවීමට; හෝ

(ග) මේ වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වන යම් කාරණයකට අදාළව මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් දේවල් කිරීමට.

මූල්‍ය ස්ථායීතා අරමුදල

**15.** (1) 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නිරාකරණය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ 30 වන, 31 වන, 32 වන, 33 වන සහ 34 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති නිරාකරණ ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් මේ පනත යටතේ මූල්‍ය ස්ථායීතා අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මූල්‍ය ස්ථායීතා අරමුදල, මහ බැංකුවේ වෙනත් වත්කම්වලින් සහ මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන වත්කම්වලින් වෙන්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(3) මහ බැංකුවට-

(අ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මූල්‍ය ස්ථායීතා අරමුදල කළමනාකරණය කිරීම, පරිපාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ආ) මූල්‍ය ස්ථායීතා අරමුදලේ සාමාන්‍ය පරිපාලනයට අදාළව ප්‍රතිපත්ති සකස් කිරීම;

(ඇ) මූල්‍ය ස්ථායීතා අරමුදලේ මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි යම් ආයෝජන සිදු කිරීම සහ යම් ගනුදෙනුවකට හෝ ගිවිසුමකට එළඹීම; සහ

(ඈ) 51 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොවන පරිදි, බලපත්‍රලාභී බැංකුවල නිරාකරණය කිරීම්වලට මුදල් සැපයීමට දායක වීම,

සඳහා බලය තිබිය යුතු ය.

(4) පහත දැක්වෙන දේ මූල්‍ය ස්ථායීතා අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය:-

(අ) ආණ්ඩුව විසින් සපයනු ලබන අයවැය වෙන් කිරීම්;

(ආ) ආණ්ඩුවේ දායක මුදල්;

(ඇ) ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් සපයනු ලබන ප්‍රදාන හෝ ණය;

(ඈ) මූල්‍ය ස්ථායීතා අරමුදලේ මුදල්වලින් සහ එම මුදල් ආයෝජනය තුළින් ව්‍යුත්පන්න වන ආයෝජන ආදායම් සහ ලැබීම්;

(ඉ) 33 වන වගන්තියේ (5) වන උපවගන්තියේ කාර්ය සඳහා මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි, බලපත්‍රලාභී බැංකුවලින් ලැබෙන දායක මුදල්; සහ

(ඊ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් මූලාශ්‍රවලින් ලැබෙන යම් ආදායමක්.

නිරාකරණය කිරීමේ කාර්යය සඳහා බලපත්‍රලාභී බැංකුවක වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම

**16.** (1) නිරාකරණය කිරීමේ කාර්යය සඳහා බලපත්‍රලාභී බැංකුවක වත්කම්, වගකීම් හෝ කොටස් තක්සේරු කිරීම පිණිස, මහ බැංකුව විසින්, යම් නිරාකරණ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීමට පෙර යම් අවස්ථාවක දී, මහ බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින් එකී බලපත්‍රලාභී බැංකුවේ වත්කම්, වගකීම් හෝ කොටස් පිළිබඳ විචක්ෂණ සහ යථාර්ථවාදී තක්සේරු කිරීමක් සිදු කිරීමට කටයුතු සලස්වන ලෙසට එකී බලපත්‍රලාභී බැංකුව වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මහ බැංකුව විසින්, බලපත්‍රලාභී බැංකුවක වත්කම්, වගකීම් හෝ කොටස් තක්සේරු කිරීම (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත යම් ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු හරහා සිදු කිරීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

(3) නිරාකරණ ක්‍රියාමාර්ග ගැනීමට ඇති හදිසිභාවය හේතුවෙන් නිරාකරණය කිරීමේ කාර්ය සඳහා නිශ්චිත තක්සේරුවක් සිදු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, මහ බැංකුව විසින්-

(අ) තාවකාලික තක්සේරුවක් සිදු කිරීමට බලපත්‍රලාභී බැංකුවකට විධාන කිරීමට; හෝ

(ආ) සෘජුව ම තාවකාලික තක්සේරුවක් සිදු කිරීමට භාර ගැනීම,

කළ හැකි ය:

එසේ වුව ද, එකී තාවකාලික තක්සේරුව, ප්‍රායෝගිකව හැකි ඉක්මණින්, අවසාන ස්වාධීන තක්සේරුවක් සිදු කිරීමෙන් ඌණපූරණය කරනු ලැබිය යුතු ය.

(4) (1) වන සහ (2) වන උපවගන්ති යටතේ තක්සේරුකරුට කරනු ලැබිය යුතු ගෙවීම්, මහ බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් නියමවලට සහ කොන්දේසිවලට අනුකූලව, බලපත්‍රලාභී බැංකුව විසින් දරනු ලැබිය යුතු ය.

(5) මහ බැංකුවට, මේ වගන්තියේ කාර්ය සඳහා වෘත්තීමය තක්සේරුකරුවන් පත්කොට එම වෘත්තීමය තක්සේරුකරුවන්ගේ ලැයිස්තුවක් පළ කිරීමට අධිකාරී බලය තිබිය යුතු ය.

(6) මහ බැංකුව විසින්, මේ වගන්තියේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, කලින් කලට, විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

බලපත්‍රලාභී බැංකුවට එරෙහිව අධිකරණ නඩු කටයුතු නතර කිරීමේ ආඥාව

**17.** (1) බලපත්‍රලාභී බැංකුවක තැන්පත්කරුවන්ගේ යහපත පිණිස, මේ පනත යටතේ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා එම බලපත්‍රලාභී බැංකුව විසින් එහි ව්‍යාපාර කටයුතු සියල්ලම හෝ කොටසක් සිදු කරගෙන යාම මහ බැංකුව විසින් තහනම් කර ඇති අවස්ථාවක දී, මහ බැංකුව විසින් තත්කාර්යය සඳහා බලය ලබා දී ඇති නිලධරයකු විසින්, බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් එම බලපත්‍රලාභී බැංකුවට විරුද්ධව යම් සිවිල් ස්වභාවයේ නඩු කටයුතු පවත්වාගෙන යාම වැළැක්වීම සඳහා වන ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ඒක පාක්ෂිකව විභාග කිරීමෙන් පසුව, බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් එම බලපත්‍රලාභී බැංකුවට විරුද්ධව යම් සිවිල් ස්වභාවයේ නඩු කටයුතු පවත්වාගෙන යාම මාස තුනකට නොවැඩි කාල සීමාවක් සඳහා නතර කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී, මහ බැංකුව විසින්, ප්‍රායෝගිකව හැකි ඉක්මණින්, එකී ආඥාව පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු ය.

II වන කොටස

**නිරාකරණ ක්‍රියාමාර්ග**

අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම

**18.** (1) මහ බැංකුව විසින්, බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමේ කාර්යය සඳහා, ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලබන නියමයක් මගින්, එකී බලපත්‍රලාභී බැංකුවේ අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන්, (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් පත් කරනු ලැබීමට සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු වන්නේ ද යන්න නිශ්චය කිරීමේ දී, තත්කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුබව සහ යෝග්‍යතාව නිශ්චය කිරීමට භාවිත කරනු ලබන නිර්ණායක, අවශ්‍ය වෙනස්කම් සහිතව, එම තැනැත්තාට අදාළ විය යුතු ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ කටයුතුවල දී සෘජුව ම හෝ වක්‍රාකාරයෙන් කිසිදු මූල්‍යමය හෝ අන්‍යාකාරයක සම්බන්ධතාවක් නොතිබිය යුතු ස්වාධීන

තැනැත්තකු විය යුතු ය. මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රලාභී බැංකුවක අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පත් කරනු ලැබ, එකී පත් කිරීමෙන් පසුව එකී බැංකුවේ කටයුතුවලදී සෘජුව ම හෝ වක්‍රාකාරයෙන් යම් මූල්‍යමය හෝ අන්‍යාකාරයක සම්බන්ධතාවක් අත්කර ගන්නා යම් තැනැත්තකු විසින්, වහාම එම කරුණ මහ බැංකුව වෙත දන්වා ඉන් ඉක්බිතිව ම එකී අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ක්‍රියා කිරීම නතර කරනු ලැබිය යුතු ය.

(4) අද්මිනිස්ත්‍රාසිකරුවකු, පත්කිරීමේ දින සිට මාස හයක කාල සීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතු ය. එකී කාලසීමාව දීර්ඝ කිරීමට අවශ්‍ය වන්නේ නම්, ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලබන නියමයක් මගින්, මහ බැංකුව විසින්, කලින් කලට, එක්වරකට මාස හයක වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරන්නා වූ හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ කාලසීමාව දීර්ඝ කරන්නා වූ මහ බැංකුවේ නියමයක්, අවස්ථාවෝචිත පරිදි, එකී පත්කිරීම හෝ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා වන හේතු නිශ්චිතව දක්වමින්, ලිඛිතව බලපත්‍රලාභී බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

(6) යම් අද්මිනිස්ත්‍රාසිකරුවකු, (2) වන හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් නුසුදුසුකමකට යටත් වන අවස්ථාවක දී, මහ බැංකුව විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(7) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරුවකු වෙත, මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(8) අද්මිනිස්ත්‍රාසිකරු, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන කොටසේ අර්ථානුකූලව සහ එම කොටසේ කාර්ය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, අද්මිනිස්ත්‍රාසිකරු ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ ව්‍යාපාරයක් වන අවස්ථාවක දී,

අවස්ථාවෝචිත පරිදි, එහි අධ්‍යක්ෂවරයන් හෝ කළමනාකරණ හවුල්කරුවන්, එකී කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය ගෙවීම ඇතුළුව, අද්මිනිස්ත්‍රාසිකාරිත්වය හේතුවෙන් මහ බැංකුව විසින් දරනු ලබන සියලු පිරිවැය මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමවලට සහ කොන්දේසිවලට අනුකූලව, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුව විසින් දරනු ලැබිය යුතු අතර, එම බලපත්‍රලාභී බැංකුවෙන් අය කර ගනු ලැබිය යුතු ය. එසේ ගෙවනු ලැබිය යුතු යම් පිරිවැයක්, එකී බලපත්‍රලාභී බැංකුව විසින් මහ බැංකුව වෙත සම්පූර්ණයෙන් ම ගෙවනු ලබන තෙක්, එය මහ බැංකුව වෙත ගෙවිය යුතු ණයක් ලෙස සංයුක්ත විය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු විසින් පාලනය පවරා ගැනීමේ බලපෑම

**19.** (1) 18 වන වගන්තිය යටතේ පත්කරන ලද අද්මිනිස්ත්‍රාසිකරු විසින්, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ සියලු වත්කම්, අයිතිවාසිකම්, ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් පාලනය පවරා ගනු ලැබිය යුතු අතර, එම වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ දක්වා ඇති නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඉකුත් වන තෙක් හෝ එවැනි යම් නියමයක් අවලංගු කරනු ලබන යම් අවස්ථාවක් වන තෙක්, බලපත්‍රලාභී බැංකුව නමින් සහ බලපත්‍රලාභී බැංකුව වෙනුවෙන් එම බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර සහ කටයුතු සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීමෙන් පසුව, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ සියලු දේපළ, ව්‍යාපාර සහ කටයුතු පිළිබඳ විස්තර අද්මිනිස්ත්‍රාසිකරු වෙත භාර දීම සහ එකී දේපළ, ව්‍යාපාර සහ කටයුතුවල පාලනය අද්මිනිස්ත්‍රාසිකරු වෙත පවරා දීම, එකී බලපත්‍රලාභී බැංකුවේ සියලු අධ්‍යක්ෂවරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ වගකීම විය යුතු ය.

(3) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අගතියක් නොවන පරිදි, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂවරයන් සහ සේවානියුක්තයන් විසින්, එකී බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර සහ කටයුතු සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු පහසුකම් අද්මිනිස්ත්‍රාසිකරු වෙත සපයනු ලැබිය යුතු ය.

(4) 18 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් මහ බැංකුව විසින් කරනු ලබන නියමය බලාත්මකව පවතින කාලසීමාව අතරතුර -

(අ) තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ එකී බලපත්‍රලාභී බැංකුවේ, එහි අධ්‍යක්ෂවරයන්ගේ සහ කොටස් හිමියන්ගේ සියලු කාර්ය සහ කර්තව්‍ය සහ එකී බලපත්‍රලාභී බැංකුවේ අදාළ සංරචක ලේඛන අද්මිනිස්ත්‍රාසිකරු වෙත පවරනු ලැබිය යුතු ය;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් නියම කරනු ලැබිය හැකි හෝ බලය පවරනු ලැබිය හැකි පරිදි හැර, එකී බලපත්‍රලාභී බැංකුවේ කිසිදු අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හෝ සේවානියුක්තයකු විසින් සෘජුව හෝ වක්‍රව, බලපත්‍රලාභී බැංකුව සඳහා හෝ වෙනුවෙන් කිසිදු කටයුත්තකට සම්බන්ධ නොවිය යුතු ය; සහ

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව හැර, එකී බලපත්‍රලාභී බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හෝ සේවානියුක්තයකු වෙත කවර හෝ ස්වභාවයක කිසිදු පාරිශ්‍රමිකයක් උපචිත වීම හෝ ගෙවනු ලැබීම සිදු කරනු නොලැබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු විසින් වත්කම් සහ වගකීම් පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් පිළියෙල කරනු ලැබිය යුතු බව

**20.** අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඔහුගේ පත්වීමේ දින සිට දින තිහක් ඇතුළත හෝ මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් දිනයක සිට ස්වකීය පාලනය යටතේ පවතින බලපත්‍රලාභී බැංකුවේ සියලු වත්කම් සහ වගකීම් පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් පිළියෙල කොට මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු විසින් ශක්‍ය නිරාකරණය කිරීමේ විකල්ප සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු බව

**21.** (1) අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඔහුගේ පත්වීමේ දින සිට දින හැටකට පසුව නොවන කාලයක දී, බලපත්‍රලාභී බැංකුව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු වඩාත් ශක්‍ය නිරාකරණය කිරීමේ විකල්ප පිළිබඳව ස්වකීය නිර්දේශ අන්තර්ගත කරමින් ස්වකීය පාලනය යටතේ පවතින එකී බලපත්‍රලාභී බැංකුව පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කොට මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින්, (1) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් පිළියෙල කරන ලද වාර්තාව සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු වඩාත් ශක්‍ය නිරාකරණය කිරීමේ විකල්පය අනුමත කිරීම හෝ, අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසිකරු, බලපත්‍රලාභී බැංකුව, අධ්‍යක්ෂවරයන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත ඒ පිළිබඳ විධාන එකක් හෝ වැඩි ගණනක් නිකුත් කරනු ලැබීම කළ හැකි ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු විසින්, (1) වන උපවගන්තියේ දක්වා ඇති වාර්තාවේ, එකී අද්මිනිස්ත්‍රාසිකරුගේ පාලනය යටතේ පවතින බලපත්‍රලාභී බැංකුව -

(අ) අඛණ්ඩ පැවැත්ම තහවුරු කොට විකුණන ලෙසට;

(ආ) තෝරාගත් වත්කම් සහ වගකීම් පැවරීම හරහා හෝ 30 වන වගන්තිය යටතේ සේතු බැංකුවක් පිහිටුවීම හරහා නිරාකරණය කරන ලෙසට;

(ඇ) එකී බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ අවදානම් පැතිකඩ සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් නිරාකරණය කිරීමේ බලයක් මගින් නිරාකරණය කරන ලෙසට; හෝ

(ඈ) ගණන් බේරා වසා දමන ලෙසට,

නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(4) අද්මිනිස්ත්‍රාසිකරු විසින්, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අදාළ තොරතුරු සම්බන්ධයෙන්, 18 වන වගන්තියේ දක්වා ඇති නියමයේ මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් විධිමත් වාර්තා පිළියෙල කොට මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරු, නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ ලිපිගොනු, තොරතුරු සහ ලේඛන සංවිධානය කොට පවත්වාගෙන යාම සඳහා වගකිවයුතු වන අතර, ඔහුගේ අද්මිනිස්ත්‍රාසිකාරිත්වයේ කාලසීමාව අතරතුර එකී බලපත්‍රලාභී බැංකුව

සම්බන්ධයෙන් ගන්නා ලද සියලු තීරණවලට හෝ ක්‍රියාමාර්ගවලට අදාළ තොරතුරු අන්තර්ගත වන ලේඛනයක් ඔහු විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකාරීත්වය අවසන් කිරීම

**22.** (1) බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමේ කාර්යය සඳහා පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුවකු, පහත දැක්වෙන අවස්ථාවලින් පළමුව එළඹෙන අවස්ථාවේ දී, අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම අවසන් විය යුතු ය:–

(අ) අවස්ථාවෝචිත පරිදි, 18 වන වගන්තියේ (1) වන හෝ (4) වන උපවගන්තියේ දක්වා ඇති නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සම්පූර්ණ කිරීම; හෝ

(ආ) එකී අද්මිනිස්ත්‍රාසිකරුගේ කාලසීමාව අවසන් කිරීමට මහ බැංකුව තීරණය කරනු ලබන අවස්ථාවක.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින්, (1) වන උපවගන්තිය යටතේ පත්වීම අවසන් කිරීමේ දින සිට වැඩ කරන දින විස්සක් ඇතුළත, ඔහුගේ අද්මිනිස්ත්‍රාසිකාරීත්වයේ කටයුතු පිළිබඳ අවසාන වාර්තාවක් පිළියෙල කොට මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

දැනට සිටින කොටස් හිමියන් මගින් ප්‍රාග්ධනය වැඩි කිරීම

**23.** (1) මහ බැංකුව විසින් හෝ මහ බැංකුවේ අනුමතය ඇතිව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, නව කොටස් නිකුතුවක් හරහා නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය:–

(අ) අලාභවල ප්‍රමාණය නිශ්චය කර, එකී අලාභවල මුදල් ප්‍රමාණය, එකී බලපත්‍රලාභී බැංකුවේ ලාභවලින්, සංචිතවලින් සහ අවශ්‍ය නම්, ප්‍රාග්ධනයෙන් ආවරණය කරමින් එකී බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම; සහ

(ආ) බැංකු පනත යටතේ ඇති සියලු ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සමඟ අනුකූල වීම සඳහා එම බලපත්‍රලාභී බැංකුවේ කොටස්වල ආයෝජනය කළ යුතු අතිරේක ප්‍රාග්ධන ප්‍රමාණය නිශ්චය කිරීම සහ ලිඛිත ඉල්ලීමක් මගින්, එම

ඉල්ලීමේ නිශ්චිතව දක්වා ඇති කාලය තුළ, අවශ්‍ය වන සම්පූර්ණ අතිරේක ප්‍රාග්ධනයේ ප්‍රමාණයට හෝ ඉන් යම් කොටසකට සමාන වන අනුගම්‍ය බැඳීම් ඉදිරිපත් කිරීම මගින් අතිරේක කොටස් සඳහා දායකවීමට සහ මිලදී ගැනීමට බලපත්‍රලාභී බැංකුවේ දැනට සිටින කොටස් හිමියන්ගෙන් ඉල්ලා සිටීම:

එසේ වුව ද, මේ ඡේදයේ දක්වා ඇති ඉල්ලීම කිරීමට පෙරාතුව, මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකන්නේ නම්, ශාඛා අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කොට ඇති සහ එම බලපත්‍රලාභී බැංකුවේ අසාර්ථකත්වයට සෘජුව හෝ වක්‍රව දායක වී ඇති කොටස් හිමියන් පරීක්ෂා කර හඳුනා ගෙන එවැනි කොටස් හිමියන්ට මේ වගන්තිය යටතේ ප්‍රාග්ධනය වැඩි කර ගැනීම සඳහා සහභාගී වීමට ඉඩ ලබා නොදිය යුතු ය:

එසේ ම තවදුරටත්, මේ වගන්තිය යටතේ කොටස් හිමියන් විසින් අතිරේක කොටස් සඳහා දායක වන්නේ නම් හෝ අතිරේක කොටස් මිල දී ගන්නේ නම්, එවැනි කොටස් හිමියන්, මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා බලපත්‍රලාභී බැංකුවල කොටස් හිමිකාරත්ව සීමාව සම්බන්ධයෙන් බැංකු පනත යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන විධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක හෝ බලපත්‍රලාභී බැංකුවේ සාංගමික සංස්ථාපත්‍රයේ හෝ වෙනත් යම් සංරචක ලේඛනයක පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවේ දැනට සිටින කොටස් හිමියන්ට එසේ නිකුත් කරන ලද අතිරේක කොටස් මිලදී ගැනීම සඳහා කිසිදු පූර්වක්‍රයක් හෝ වෙනත් යම් අයිතිවාසිකම් නොතිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මහ බැංකුව විසින් මේ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී කොටස් හිමියන්ට සහ යටත් ණයහිමියන්ට වෙන් කළ යුතු අලාභ හඳුනා ගැනීම සඳහා මහ බැංකුවට බලය තිබිය යුතු ය.

අලුත් කොටස් හිමියන් විසින් ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම

**24.** (1) 23 වන වගන්තියේ විධිවිධානවලට අගතිවිරහිතව සහ අලුත් කොටස් හිමියන් විසින් බලපත්‍රලාභී බැංකුවක ප්‍රතිප්‍රාග්ධනීකරණය සිදුකිරීමේ කාර්යය සඳහා, මහ බැංකුව විසින්-

(අ) 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව අලාභවල ප්‍රමාණය දැනටමත් තීරණය කර නොමැති නම්, එම බලපත්‍රලාභී බැංකුවේ අලාභවල ප්‍රමාණය තීරණය කර, එකී අලාභවල ප්‍රමාණය එම බලපත්‍රලාභී බැංකුවේ ලාභ, සංචිත, සහ අවශ්‍ය වන්නේ නම්, ප්‍රාග්ධනය සහ යටත් ණය සහ එකී බැංකුවේ අලාභ අවශෝෂණය කිරීමේ කාර්යය සඳහා නිකුත් කොට ඇති වෙනත් යම් සාධන පත්‍රයක් මගින් ආවරණය කරමින් එම බලපත්‍රලාභී බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබිය යුතු ය;

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අලාභ පෙන්නුම් කිරීම සඳහා ප්‍රකාශිත ප්‍රාග්ධනයේ ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය;

(ඇ) මේ පනත යටතේ ඇති සියලු ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල වීමට එම බලපත්‍රලාභී බැංකුවට අවශ්‍ය වන අරමුදල් ප්‍රමාණය සහ එම අරමුදල් සපයනු ලබන ආකාරය තීරණය කරනු ලැබිය හැකි ය;

(ඈ) තත්කාලයේ බලපවත්නා නීතිය මගින් පනවා ඇති, බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින්, එම බලපත්‍රලාභී බැංකුව විසින් අතිරේක ප්‍රාග්ධනය නිකුත් කරනු ලැබීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීමට සහ සුරැකුම්පත් නිකුත් කරන්නන් විසින් කළ යුතු වෙනත් යම් හෙළිදරව් කිරීම්වලට අදාළව එම බලපත්‍රලාභී බැංකුව විසින් මේ වගන්තියේ විධිවිධාන යටතේ, කොටස් නිකුත් කරනු ලැබීමට මහ බැංකුව විසින් කටයුතු සලස්වනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුව විසින්, මේ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී, කොටස් හිමියන්ට සහ යටත් ණයහිමියන්ට වෙන් කළ යුතු අලාභ හඳුනාගැනීම සඳහා මහ බැංකුවට බලය තිබිය යුතු ය.

කොටස් පැවරීම සහ ඒකාබද්ධ කිරීමක් ක්‍රියාත්මක කිරීම

**25.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මහ බැංකුව විසින්, නිරාකරණයට යටත් යම් බලපත්‍රලාභී බැංකුවක කොටස් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් වෙනත් යම් මූල්‍ය ආයතනයකට පැවරීම හෝ එම බලපත්‍රලාභී බැංකුව වෙනත් යම් මූල්‍ය ආයතනයක් සමග ඒකාබද්ධ කිරීම කරනු ලැබිය හැකි ය.

මේ වගන්තියේ කාර්යය සඳහා, "මූල්‍ය ආයතනය" යන්නෙන්, බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් හෝ මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් හෝ මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ආයතනයක් අදහස් වේ.

(2) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ කොටස් පවරනු ලබන අවස්ථාවේ දී හෝ ඒකාබද්ධ කිරීමක් කරනු ලබන අවස්ථාවේ දී, එම කොටස්වල පැවරුම්ලාභියා නුඹුන්වත් බවට සහ එසේ පවරනු ලබන කොටස් ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා සහ නිරාකරණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රවීණතාවක්, හැකියාවක් සහ සම්පත් තිබිය යුතු වන කොටස් හිමියන්ගේ, අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ යෝග්‍යතාවය සහ සුදුසුකම ඇතුළු බැංකු පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, විධානයක්, නිශ්චය කිරීමක් හෝ නියමයක් යටතේ අදාළ අවශ්‍යතාවයන්ට අනුකූලව එම පැවරුම්ලාභියා කටයුතු කරන බවට මහ බැංකුව විසින් සහතික විය යුතු ය.

(3) 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින් කරනු ලබන එම බලපත්‍රලාභී බැංකුවේ වත්කම් හා වගකීම් පිළිබඳ විචක්ෂණ සහ යථාර්ථවාදී තක්සේරුවක් මත පදනම්ව මහ බැංකුව විසින් (1) වන උපවගන්තිය යටතේ වූ කොටස් පැවරීම හෝ ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක කළ යුතු ය.

(4) මහ බැංකුව විසින්, කලින් කලට නිකුත් කරනු ලබන විධාන මගින්, (1) වන උපවගන්තිය යටතේ කොටස් පැවරීම පිළිබඳ කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) මහ බැංකුව විසින් මේ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී, කොටස් හිමියන්ට සහ යටත් ණයහිමියන්ට වෙන් කළ යුතු අලාභ හඳුනාගැනීම සඳහා මහ බැංකුවට බලය තිබිය යුතු ය.

තෝරාගත් වත්කම් සහ වගකීම් තුන්වන පාර්ශ්වයක් වෙත පැවරීම

**26.** (1) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මහ බැංකුව විසින් (මේ පනතේ මේ කොටසේ "පැවරුම්කාර බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුව වෙත පූර්ව දැන්වීමක් ලබාදීමෙන් පසුව, (මේ පනතේ මේ කොටසේ "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිශ්චිතව දක්වන ලද දිනයක දී පවතින එම පැවරුම්කාර බැංකුවේ පවතින සියලු වත්කම් හෝ වගකීම් හෝ ඒවායින් කොටසක් හෝ වත්කම් හා වගකීම් යන දෙක ම හෝ (මේ පනතේ මේ කොටසේ "පැවරුම්ලාභී" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තුන්වන පාර්ශ්වයක් වෙත පවරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම වගකීම් හෝ එම වගකීම්වලින් කොටසක් තැන්පතු වගකීම්වලින් සමන්විත වන අවස්ථාවක දී, එම තැන්පතු භාරගැනීම සඳහා නීතිය මගින් අවසර ලබා දී නොමැති යම් අස්තිත්වයක් වෙත එවැනි තැන්පතු වගකීම් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පැවරුම්ලාභී නුබුන්වත් විය යුතු අතර, කොටස් හිමියන්, අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා සුදුසුකම් ලැබීමේ යෝග්‍යතාවයට අදාළ අවශ්‍යතා ඇතුළුව, බැංකු පනත හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක්, විධානයක්, නිශ්චය කිරීමක් හෝ නියමයක් යටතේ අදාළ අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය. තව ද, නිරාකරණය කිරීමේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස එසේ පවරන ලද වත්කම් හෝ වගකීම් හෝ එම වත්කම් සහ වගකීම් යන දෙක ම ඵලදායී ලෙස දැරීම සඳහා ප්‍රමාණවත් ප්‍රවීණතාවක්, හැකියාවක් සහ සම්පත් පැවරුම්ලාභී සතුව තිබිය යුතු ය.

(3) 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින් කරනු ලබන එම බලපත්‍රලාභී බැංකුවේ තෝරාගත් වත්කම් සහ වගකීම් පිළිබඳ විචක්ෂණ සහ යථාර්ථවාදී තක්සේරුවක් මත පදනම්ව මහ බැංකුව විසින්, (1) වන උපවගන්තිය යටතේ වත්කම් හා වගකීම් පැවරීම සිදුකරනු ලැබිය යුතු ය.

(4) එම බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ගේ, ණයහිමියන්ගේ සහ කොටස් හිමියන්ගේ බැඳියාවන් පිළිබඳව සැලකිල්ලට ගනිමින් (1) වන උපවගන්තිය යටතේ පැවරීමට නියමිත වත්කම් හා වගකීම් තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ නිර්ණායක, මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධාන මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, ''පැවරුම්කාර බැංකුවක වත්කම් හා වගකීම්'' යන්නට-

(අ) (ණය, මුදල් ශේෂ, සංචිත අරමුදල්, ආයෝජන සහ තැන්පතු ඇතුළු) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවරුම්කාර බැංකුව විසින් අයිතිය දරන ලද නිශ්චල හා චංචල දේපළ සියල්ල හෝ ඉන් කොටසක්;

(ආ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවරුම්කාර බැංකුව විසින් අයිතිය දරන ලද යම් චංචල හෝ නිශ්චල දේපළකින් හෝ ඒ තුළින් පැන නගින අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාරී බලතල සහ බැඳියාවන් සියල්ල හෝ ඉන් කොටසක්;

(ඇ) අදාළ දිනයට පොරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ පැවරුම්කාර බැංකුව සතු යම් නෛතික අයිතිවාසිකම් හෝ බැඳීම්;

(ඈ) 28 වන වගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ පැවරුම්කාර බැංකුවේ නෛතික අයිතිවාසිකම් සහ බැඳීම් ඇතුළු වගකීම් සියල්ල හෝ ඉන් කොටසක්; සහ

(ඉ) ශ්‍රී ලංකාව තුළ එම පැවරුම්කාර බැංකුවට අදාළ වන හෝ සම්බන්ධ වන සියලු පොත්, ගිණුම් සහ ලේඛන,

ඇතුළත් වේ.

(6) (1) වන උපවගන්තියේ දක්වා ඇති පැවරුම්ලාභී -

(අ) පැවරුම්කාර බැංකුවේ සම්බන්ධිත පාර්ශ්වයන් විසින් ඍජුව හෝ වක්‍රව පාලනය කරනු නොලැබිය යුතු ය;

(ආ) බදුවලට අදාළ වගකීම් සහ ශ්‍රමයට අදාළ වගකීම් ඇතුළු වෙනත් යම් වගකීම් හැර, ප්‍රකාශිතව පවරනු ලබන වගකීම් හෝ පැවරුම්ලාභී විසින් ප්‍රකාශිතව එකඟ වන ලද වෙනත් යම් නියම හෝ කොන්දේසි ප්‍රකාරව වූ වගකීම් සඳහා, පැවරුම්කාර බැංකුවේ කොටස් හිමියන් වෙත හෝ වෙනත් යම් ණයහිමියන් වෙත පමණක් වගකියනු ලැබිය යුතු ය;

(ඇ) නිරාකරණයෙහි ඇති වත්කම් හා වගකීම් පැවරීමේ නියමවලට හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට පැවරුම්ලාභියා අපොහොසත් වීම හේතුවෙන් සිදුවන යම් අලාභ සම්බන්ධයෙන් මහ බැංකුව වෙත හෝ 39 වන වගන්තිය යටතේ පිහිටුවන ලද තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය වෙත වන්දි ගෙවීම සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුතු ය.

වත්කම් හා වගකීම් පැවරීම සම්බන්ධයෙන් සපුරාලිය යුතු අවශ්‍යතා

**27.** (අ) පැවරුම්ලාභී නුබුන්වත් බවට සහ අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාකරනු ලබන බවට සහ පැවරීමට යෝජිත පැවරුම්කාර බැංකුවේ ව්‍යාපාර කටයුතු ප්‍රවීණ ආකාරයකින් පවත්වාගෙන යාමට ඊට හැකියාව ඇති බවට සහ පැවරීමට යෝජිත ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධිත හෝ අදාළ වන ස්වකීය තැන්පත්කරුවන් සහ ණයහිමියන් කෙරෙහි වන පැවරුම්කාර බැංකුවේ වගකීම් සපුරාලීමට ඊට හැකියාව ඇති බවට මහ බැංකුව විසින් සෑහීමට පත්වේ නම් මිස;

(ආ) (i) පැවරීමට යෝජිත ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධිත හෝ අදාළ වන පැවරුම්කාර බැංකුවේ පවත්නා යම් වත්කම් භාවිත කරනු ලැබිය යුතු ආකාරයට සහ පැවරීමට යෝජිත ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධිත හෝ අදාළ වන පැවරුම්කාර බැංකුවේ පවත්නා වගකීම් සම්පූර්ණ කරනු ලැබිය යුතු ආකාරයට අදාළව; සහ

(ii) පැවරුම්කාර බැංකුවෙන් ආණ්ඩුවට ගෙවිය යුතු යම් ගෙවීමක් ගෙවනු ලැබිය යුතු ආකාරයට අදාළව,

මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියමවලට හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකරනු ලබන බවට පැවරුම්ලාභී ලිඛිතව එකඟ වේ නම් මිස; සහ

(ඇ) මේ පනත යටතේ, මහ බැංකුව විසින්, කලින් කලට පැවරුම්ලාභී වෙත නිකුත් කරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් විධානවලට අනුකූලව ක්‍රියාකිරීමට එම පැවරුම්ලාභී එකඟ වේ නම් මිස,

මහ බැංකුව විසින් 26 වන වගන්තිය යටතේ වත්කම් හා වගකීම් පැවරීමක් සිදුකරනු නොලැබිය යුතු ය.

වත්කම් හා වගකීම් පැවරීමේ බලපෑම

**28.** මහ බැංකුව විසින් අන්‍යාකාරයකින් තීරණය කරන්නේ නම් මිස, 26 වන වගන්තිය යටතේ පැවරුම්කාර බැංකුවේ වත්කම් හා වගකීම් පැවරුම්ලාභී වෙත පවරා ඇති අවස්ථාවක දී, අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි-

(අ) පැවරුම්කාර බැංකුවේ පවරන ලද වත්කම්වල හා වගකීම්වල පාලනය සහ සන්තකය පැවරුම්ලාභී සතුවිය යුතු ය:

එසේ වුව ද, යම් වත්කම් හෝ වගකීම්, ඒවා පැවරීම සඳහා අදාළ වන නිර්ණායක සපුරා නොමැති අවස්ථාවක දී, ඒ පැවරුම්ලාභී විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව, ඒ පැවරීම සිදුකරනු ලබන අවස්ථාවේ දී නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත, මහ බැංකුව විසින් ඒ වත්කම් හෝ වගකීම් පැවරුම්කාර බැංකුව වෙත ආපසු පවරනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, පැවරුම්කාර බැංකුවෙහි ස්වකීය බැඳියාවන් සහ අයිතිවාසිකම් ඉතිරිව පවතින කොටස් හිමියන්, තැන්පත්කරුවන් සහ ණයහිමියන් සඳහා, පැවරුම්ලාභී වෙත පවරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් කිසිදු අයිතිවාසිකමක් හෝ හිමිකම්පෑමක් නොතිබිය යුතු ය;

(ආ) පැවරුම්ලාභී වෙත පවරා නොමැති ස්වකීය ව්‍යාපාරයේ ඉතිරි කොටස පැවරුම්කාර බැංකුව විසින් කරගෙන යාමට හැකි වනු පිණිස අවශ්‍ය වන තාක් දුරට අදාළ නීති යටතේ මුදල් මණ්ඩලය විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා පැවරුම්කාර බැංකුව වෙත නිකුත් කර ඇති බලපත්‍රය, අවස්ථාවෝචිත පරිදි, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය;

(ඇ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ හෝ බලාත්මක වූ ද සහ පැවරුම්කාර බැංකුව පාර්ශ්වයක් වන හෝ පැවරුම්කාර බැංකුවේ වාසියට පවතින්නා වූ ද, පැවරුම්කාර බැංකුවේ පවරන ලද වත්කම්වලට හා වගකීම්වලට සම්බන්ධ හෝ ඒවාට අදාළ සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජන ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වූ වෙනත් සාධන පත්‍ර අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, පැවරුම්ලාභී සමඟ ඇතුළත් වූ හෝ පැවරුම්ලාභී විසින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජන ප්‍රදාන හෝ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) පවරන ලද වත්කම්වලට හා වගකීම්වලට සම්බන්ධ හෝ ඒවාට අදාළ වන සහ අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින පැවරුම්කාර බැංකුව විසින් හෝ පැවරුම්කාර බැංකුවට එරෙහිව පවරන ලද කවර හෝ ස්වභාවයක වූ සියලු නඩු සහ නඩු කටයුතු අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, පැවරුම්ලාභී විසින් හෝ පැවරුම්ලාභීට එරෙහිව පවරන ලද නඩු සහ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව අඛණ්ඩව පවත්වාගෙන ගොස් බැහැර කරනු ලැබිය හැකි ය;

(ඉ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවරුම්කාර බැංකුවේ සේවයේ නියුක්ත සහ පැවරුම්ලාභී විසින් සේවානියුක්තිය ලබා දී නොමැති, අවස්ථාවෝචිත පරිදි, පැවරුම්ලාභී වෙත පවරා ඇති පැවරුම්කාර බැංකුවේ ව්‍යාපාර කොටසට සම්බන්ධ වී ඇති පැවරුම්කාර බැංකුවේ සියලු නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් හෝ පැවරුම්කාර බැංකුවේ සමස්ත ව්‍යාපාරය ම හෝ පැවරුම්ලාභී වෙත පවරා ඇති අවස්ථාවක දී, ඒ පැවරුම්කාර බැංකුවේ සියලුම නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන්, වන්දි මුදලක් ලබා ගැනීම සඳහා හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, පැවරුම්කාර බැංකුවේ යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු වන්දි මුදලක් ලබා ගැනීම සඳහා හිමිකම් ලබන අවස්ථාවක දී, පැවරුම්ලාභී විසින්,

එම නිලධරයා හෝ සේවානියුක්තයා වෙත ගෙවනු ලැබිය යුතු වන්දි මුදල් ප්‍රමාණය, කම්කරු කොමසාරිස් ජනරාල් විමසා, තීරණය කරනු ලැබිය යුතු ය. එම තීරණය කිරීම, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එම නිලධරයාට හෝ සේවානියුක්තයාට වෙනත් යම් වන්දි මුදලක් ඉල්ලා සිටීම සඳහා වූ අයිතිවාසිකම කෙරෙහි බලපානු නොලැබිය යුතු ය.

විදේශ ව්‍යවහාර මුදල් තැන්පත්කරුවන් සම්බන්ධයෙන් පැවරුම්ලාභීගේ වගකීමේ ප්‍රමාණය

**29.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, පැවරුම්කාර බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු පැවරුම්ලාභී වෙත ලබාදී නොමැති අවස්ථාවක දී, පැවරුම්කාර බැංකුවේ යම් විදේශ ව්‍යවහාර මුදල් තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට පැවරුම්ලාභීට ඇති වගකීම, ඒ තැන්පත්කරුවන්ට සහන ප්‍රදානය කිරීම සඳහා, පැවරුම්කාර බැංකුවේ ව්‍යාපාර කටයුතු සමාලෝචනයකින් පසුව, මහ බැංකුව විසින් සකස් කරනු ලැබිය හැකි යම් යෝජනා ක්‍රමයක සඳහන් නියම හා කොන්දේසි පිළිගැනීමට එකඟ වන තැන්පත්කරුවන් සම්බන්ධයෙන් පමණක් සහ ඒ යෝජනා ක්‍රමයේ දැක්වෙන ප්‍රමාණය දක්වා පමණක් සීමා විය යුතු ය:

එසේ වුව ද, පැවරුම්ලාභී වෙත එම විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ලබා දී ඇති විට හෝ පැවරුම්ලාභී විසින් පැවරුම්කාර බැංකුවේ එම විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හෝ විදේශයන්හි තිබෙන වෙනත් වත්කම් ආපසු ලබාගෙන ඇති අවස්ථාවක දී, එසේ ලබාදෙන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හෝ එසේ ආපසු ලබාගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සහ විදේශයන්හි තිබෙන වෙනත් වත්කම්, එම විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුකරුවන් වෙත ගෙවීම සම්බන්ධයෙන් පැවරුම්ලාභී වෙත විධාන කිරීමට මහ බැංකුව වෙත බලය ඇති අතර, පැවරුම්ලාභී එම විධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

සේතු බැංකුවක් පිහිටුවීම

**30.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මහ බැංකුව විසින් අදාළ අවස්ථානුගත කරුණු පිළිබඳව සලකා බලා, මේ පනත යටතේ නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවක අසාර්ථක වීම පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති කළ හැකි බවට මහ බැංකුවේ මතය වන අවස්ථාවක දී-

(අ) එම බලපත්‍රලාභී බැංකුවේ තීරණාත්මක කර්තව්‍ය සහ ශක්‍ය මෙහෙයුම් සියල්ල හෝ එහි යම් කොටසක් තවදුරටත් මෙහෙයවීමේ කාර්යය සඳහා; හෝ

(ආ) එම බලපත්‍රලාභී බැංකුව විසින්, අයිතිය දරන හෝ නිකුත් කරන ලද කොටස්, යම් වත්කම් එකක් හෝ වැඩිගණනක්, වගකීම්, නෛතික අයිතිවාසිකම් සහ බැඳීම් හෝ වෙනත් දේපළ සාධන පත්‍ර පැවරීමේ කාර්යය සඳහා,

31 වන වගන්තියේ (6) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියමවලට හා කොන්දේසිවලට යටත්ව සහ අමාත්‍යවරයාගේ අනුමතය සහිතව (මේ පනතේ "සේතු බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් ආයතනයක් හෝ ආයතන වැඩි ගණනක් පිහිටුවීම සඳහා මහ බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, සේතු බැංකුවක් වෙත පවරන ලද වගකීම් ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ III වන කොටස මගින් විධිවිධාන සලසා ඇති තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය විසින් ආණ්ඩුව විසින් හෝ පවරන ලද වත්කම් ප්‍රමාණය සහ සපයනු ලබන වෙනත් සම්පත් ප්‍රමාණය කිසිදු ආකාරයකින් ඉක්මවනු නොලැබිය යුතු ය.

(2) සේතු බැංකුව පිහිටුවීමේ දින සිට දින පහක් ඇතුළත මහ බැංකුව විසින් (1) වන උපවගන්තිය යටතේ ගන්නා ලද තීරණය ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු ය.

(3) මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මහ බැංකුව විසින් සේතු බැංකුව වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) සේතු බැංකුව කඩිනම් ආකාරයෙන් පිහිටුවනු ලබන බවට සහ එම පිහිටුවීමේ කාලසීමාව (1) වන උපවගන්තියේ සඳහන් මහ බැංකුවේ තීරණයේ සිට දින දෙකක් නොඉක්මවන බවට මහ බැංකුව විසින් සහතික විය යුතු ය.

(5) සේතු බැංකුව පිහිටුවීම නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවේ ප්‍රාථමික සංරචක ලේඛන මත පදනම් විය යුතු අතර, එම පිහිටුවීමට සම්බන්ධ වෙනත් අදාළ ලේඛන, එම පිහිටුවීමේ දින සිට දින තිහක් ඇතුළත අදාළ අධිකාරීන් වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(6) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රය නිකුත් කිරීමේ දිනයෙන් පසුව එළඹෙන පළමුවන වැඩකරන දින සිට සේතු බැංකුවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

සේතු බැංකුවේ කටයුතු කළමනාකරණය කිරීම

**31.** (1) 30 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේතු බැංකුව සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එහි සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(2)(අ) සේතු බැංකුවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් සාමාජික සංඛ්‍යාවකින් සමන්විත සේතු බැංකුවේ පාලක මණ්ඩලයකට පවරනු ලැබිය යුතු ය.

(ආ) සේතු බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් සුදුසු සහ යෝග්‍ය තැනැත්තන් විය යුතු අතර, මහ බැංකුව විසින් පත් කරනු ලැබිය යුතු ය. පාලක මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් කිරීමට නියමිත තැනැත්තන්ගේ පත්කිරීමට පෙරාතුව, මහ බැංකුව විසින්, (11) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් නිර්ණායක මත පදනම්ව ඔවුන්ගේ සුදුසු බව සහ යෝග්‍යතාවය තක්සේරු කරනු ලැබිය යුතු ය.

(3) (11) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් විධිවිධානවලට යටත්ව, සේතු බැංකුවේ පාලක මණ්ඩලය විසින්, සේතු බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය, මහ බැංකුවේ අනුමතයට යටත්ව පත්කරනු ලැබිය යුතු ය.

(4) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මහ බැංකුවේ යම් නිලධරයකු සේතු බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තකු වශයෙන් පත්කරනු නොලැබිය යුතු ය.

(5) යම් අදාළ ලිඛිත නීතියකට අනුව අවශ්‍ය අරමුදල් විසර්ජනය කිරීමට යටත්ව, ආණ්ඩුව විසින් සේතු බැංකුවේ ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් ම සපයනු ලැබිය යුතු ය. සේතු බැංකුව වෙත මුදල් සම්පාදනය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ඇප සහ ආණ්ඩුවේ සුරැකුම්පත් නිකුත් කිරීම පිළිබඳව තීරණය කිරීම සඳහා ආණ්ඩුවට අයිතිය තිබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් සේතු බැංකුව වෙත හදිසි ද්‍රවශීලතා සහාය ලබාදීමෙන්, සාම්ප්‍රදායික වෙළෙඳපොළ ද්‍රවශීලතා ඇතුළත් කිරීමේ යාන්ත්‍රණ ලබාදීමෙන් හෝ ණය ලබාදීමෙන් මහ බැංකුව වළක්වන බවට තේරුම් ගනු නොලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, මේ වගන්තිය යටතේ ආණ්ඩුව විසින් සේතු බැංකුවක් වෙත ප්‍රාග්ධනය සැපයීම මගින් එවැනි සේතු බැංකුවක් කෙරෙහි පාලනය ක්‍රියාත්මක කිරීමෙන් මහ බැංකුව වළක්වනු නොලැබිය යුතු ය. සේතු බැංකුව ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහපත් පරිචයන් සමඟ අනුකූල වන ප්‍රමිතිගත විචක්ෂණශීලී රීතිවලට යටත් වන බවට මහ බැංකුව විසින් සහතික විය යුතු ය.

(6) සේතු බැංකුවක් පිහිටුවීම සහ මෙහෙයවීම පිළිබඳ නියම වලට හා කොන්දේසි වලට-

(අ) ප්‍රාග්ධනය සැපයීම;

(ආ) මෙහෙයුම් මූල්‍යනය සහ ද්‍රවශීලතා සහාය;

(ඇ) මාස හයක කාලසීමාවක් දක්වා, සේතු බැංකුව වෙත අදාළ වන විචක්ෂණශීලී සහ වෙනත් අධීක්ෂණ සහ නියාමන අවශ්‍යතා සඳහා යම් තාවකාලික වෙනස්කම්;

(ඈ) පාලන රාමුව නිශ්චිතව දක්වනු ලැබීමේ අවශ්‍යතාවය; සහ

(ඉ) සේතු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය,

පිළිබඳව ඇතුළත් විය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යය සඳහා මහ බැංකුවට පහත සඳහන් බලතල තිබිය යුතු ය:-

(අ) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුව විසින් නිකුත් කරනු ලබන, අවස්ථාවෝචිත පරිදි, කොටස්, වත්කම්, වගකීම් හෝ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර සේතු බැංකුවට කලින් කල පැවරීම;

(ආ) (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සේතු බැංකුව විසින් නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුව වෙත වත්කම් හා වගකීම් සියල්ල හෝ කොටසක් පැවරීම ප්‍රතිවර්තනය කිරීම;

(ඇ) තත්කාර්ය සඳහා මහ බැංකුව විසින් විධාන මගින් නිශ්චය කරන ලද සුදුසුකම් පිළිබඳ නිර්ණායකවලට යටත් ව, සේතු බැංකුවෙන් වෙනත් යම් තැනැත්තකු වෙත කොටස්, වත්කම් සහ වගකීම්, නෛතික අයිතිවාසිකම් සහ බැඳීම් පැවරීම; සහ

(ඈ) සේතු බැංකුව වසා දැමීම සහ විධිමත් ගණන් බේරා වසා දැමීම සඳහා පහසුකම් සැලැස්වීම.

(8) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුව වෙත (7) වන උපවගන්තිය යටතේ කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් සහ බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර පැවරීම ප්‍රතිවර්තනය කිරීම පහත දැක්වෙන අවස්ථානුගත කරුණුවලින් යම් එක් කරුණක් යටතේ සිදුකරනු ලැබිය යුතු ය:-

(අ) 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් සේතු බැංකුවක් පිහිටුවීමේ තීරණයෙහි එම ප්‍රතිවර්තනය කිරීම සඳහා ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක දී;

(ආ) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවෙන් සේතු බැංකුව වෙත පවරන ලද කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් යම් හිමිකාරීත්ව සාධන පත්‍ර මගින් ඒ පැවරීමේ කොන්දේසි සපුරාලනු නොලබන අවස්ථාවක දී හෝ සේතු බැංකුව පිහිටුවීමේ තීරණයේ නිශ්චිතව දක්වා ඇති කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර කාණ්ඩවලට එම කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර නොවැටෙන අවස්ථාවක දී; හෝ

(ඇ) කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර පැවරීම කරනු ලබන අවස්ථාවේ දී සිදුවී ඇති තක්සේරු කිරීමේ වැරදි නිවැරදි කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී.

(9) සේතු බැංකුව වෙත සහ සේතු බැංකුවෙන් කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර පැවරීම, 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින් කරනු ලබන තක්සේරු කිරීමක් මත පදනම් විය යුතු ය.

(10) ස්වකීය කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර සේතු බැංකුව වෙත පවරා නොමැති නිරාකරණයකට යටත් බලපත්‍රලාභී බැංකුවක යම් කොටස් හිමියකුට, ණය හිමියකුට හෝ වෙනත් තුන්වන පාර්ශ්වයකට, සේතු බැංකුව වෙත, හෝ එහි පාලක මණ්ඩලය වෙත හෝ මහ බැංකුව වෙත පවරා ඇති කොටස්, වත්කම් හා වගකීම්, නෛතික අයිතිවාසිකම් හා බැඳීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර මත යම් අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

(11) මහ බැංකුව විසින්, තැන්පත්කරුවන්ගේ, ණයහිමියන්ගේ සහ කොටස් හිමියන්ගේ සුබසිද්ධිය පිළිබඳව සැලකිල්ලට ගෙන, කලින් කලට, පහත දැක්වෙන කරුණු නිශ්චිතව දක්වමින් සේතු බැංකුව වෙත අවස්ථාවෝචිත පරිදි, විධාන, මාර්ගෝපදේශ සහ මෙහෙයුම් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවේ ඉතිරි වත්කම් හා වගකීම් ඈවර කිරීමට අවශ්‍ය වන ආකාරය;

(ආ) සේතු බැංකුවේ මෙහෙයුම් පවත්වාගෙන යා යුතු ආකාරය;

(ඇ) සේතු බැංකුව වෙත ප්‍රදානය කරනු ලබන ව්‍යාතිරේක;

(ඈ) සේතු බැංකුව විසින් සපුරාලීමට නියමිත අවම ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අවශ්‍යතාවයන්;

(ඉ) සේතු බැංකුව වෙත අදාළ විය යුතු ආයතනික පාලන ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම;

(ඊ) සේතු බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සුදුසු බව සහ යෝග්‍යතාවය තක්සේරු කිරීම සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු නිර්ණායක;

(උ) සේතු බැංකුව වෙත පැවරිය යුතු වත්කම්වල හා වගකීම්වල තක්සේරු අගය පිළිගැනීම සඳහා වූ නිර්ණායක;

(ඌ) වත්කම් සහ වගකීම්, නෛතික අයිතිවාසිකම් සහ බැඳීම් සහ හිමිකාරීත්ව සාධන පත්‍ර පැවරීමේ දී ප්‍රතිෂ්ඨාව හුවමාරු විය යුතු වන ආකාර; හෝ

(එ) සේතු බැංකුව වෙත මුලින් පවරා ඇති වත්කම් හා වගකීම් සහ වෙනත් හිමිකාරීත්ව සාධන පත්‍ර ප්‍රතිවර්තනය කරනු ලබන ආකාරය සහ අවස්ථානුගත කරුණු.

සේතු බැංකුවක කාලය

**32.** (1) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සේතු බැංකුවේ කාලය, නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවේ කොටස්, වත්කම් හා වගකීම් සහ හිමිකාරීත්ව සාධන පත්‍ර පැවරීමේ අවසාන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති අවුරුදු දෙකක කාලය සම්පූර්ණ වීමෙන් පසුව, නිරාකරණයට අදාළ අරමුණු, සේතු බැංකුව වෙත පවරා ඇති කාර්ය සම්පූර්ණ කිරීම සහ ස්වකීය කුසලතාවය මත වූ වෙනත් යම් කරුණු පිළිබඳව සැලකිල්ලට ගෙන, මහ බැංකුව විසින් ස්වකීය තක්සේරු කිරීමට අනුව, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සේතු බැංකුවේ පැවැත්ම අවසන් කරනු ලැබිය යුතු ය.

(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සේතු බැංකුව තවදුරටත් නිරාකරණයේ අරමුණු ඉටු නොකරන බවට මහ බැංකුව සෑහීමට පත්වන අවස්ථාවක දී, මහ බැංකුව විසින්, අමාත්‍යවරයා වෙත දැනුම් දීමෙන් පසුව-

(අ) සේතු බැංකුව වෙනත් අස්ථිත්වයක් සමඟ ඒකාබද්ධ කරනු ලැබිය හැකි ය;

(ආ) සේතු බැංකුවේ වත්කම්, අයිතිවාසිකම් සහ බැඳීම් සම්පූර්ණයෙන් ම හෝ ඒවායින් කොටසක් තුන්වන පාර්ශ්වයකට අලෙවි කරනු ලැබිය හැකි ය; හෝ

(ඇ) සේතු බැංකුවේ වත්කම් ඇවර කර එහි බැඳීම් සම්පූර්ණයෙන් ගෙවනු ලැබිය හැකි ය.

(4) මහ බැංකුව විසින් එක් වරකට එක් වසරක තවදුරටත් වූ කාලසීමාවක් සඳහා සේතු බැංකුවේ කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, සේතු බැංකුවේ කාලය, සමස්ත වශයෙන් අවුරුදු පහක් නොඉක්මවිය යුතු ය.

(5) (අ) (2) වන, (3) වන සහ (4) වන උපවගන්ති යටතේ වන මහ බැංකුවේ සියලුම තීරණ, ඒ තීරණ සාධාරණීකරණය කරන අවස්ථානුගත කරුණු සහ වෙළෙඳපොළ තත්ත්වයන් පිළිබඳ තක්සේරුවක් මත පදනම් විය යුතු ය.

(ආ) මහ බැංකුව විසින් ඒ තීරණවල දින සිට මාස එකක් ඇතුළත අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. (4) වන උපවගන්තිය යටතේ කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කරන ලද අවස්ථාවක දී, එවැනි දීර්ඝ කිරීමක් අවශ්‍ය වනුයේ මන්ද යන්න පිළිබඳව මහ බැංකුව විසින් හේතු සහිත පැහැදිලි කිරීමක් පළ කරනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ සේතු බැංකුවේ කාලය අවසන් කරනු ලබන අවස්ථාවක දී, මහ බැංකුව විසින්-

(අ) ඒ සේතු බැංකුව වෙත නිකුත් කළ බලපත්‍රය අවලංගු කළ යුතු ය; සහ

(ආ) මේ පනතේ V වන කොටස යටතේ ඒ සේතු බැංකුව ගණන් බේරා වසා දැමිය යුතු ය.

(7) 51 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ වගන්තිය යටතේ සේතු බැංකුවේ මෙහෙයුම් අවසන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ලැබෙන සියලුම ලැබීම් ආණ්ඩුව වෙත පවරනු ලැබිය යුතු ය.

ආණ්ඩුව විසින් තාවකාලික මූල්‍ය සහාය ලබාදීම

33. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තත්කාර්ය සඳහා මහ බැංකුව විසින් අමාත්‍යවරයා වෙත භාරදෙන ලද වාර්තාව සලකා බලා, අවස්ථාවෝචිත පරිදි, ආණ්ඩුව විසින්, බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය සඳහා මුදල් සම්පාදනයට දායක වීමට හෝ සේතු බැංකුවකට, තාවකාලික මූල්‍ය සහාය ලබාදිය හැකි ය.

(2) පහත දැක්වෙන කොන්දේසි සපුරාලන්නේ නම් පමණක් ආණ්ඩුව විසින්, (1) වන උපවගන්තියේ සඳහන් තාවකාලික මූල්‍ය සහාය ලබාදිය යුතු යː-

(අ) මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බාධාවක් ඇතිවීමේ අවදානම වළක්වා ගැනීම සඳහා ඒ මූල්‍ය සහාය අවශ්‍ය වේ නම්;

(ආ) 51 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අවසර දී ඇති පරිදි 49 වන වගන්තිය යටතේ පිහිටුවන ලද තැන්පතු රක්ෂණ අරමුදල මගින් හෝ පෞද්ගලික මූලාශ්‍ර මගින් වූ විකල්ප මූල්‍ය සම්පාදනය ක්ෂය වී ඇත්නම් හෝ ඒ මූලාශ්‍ර ප්‍රමාණවත් නොවේ නම් හෝ සාධාරණ කාලසීමාවක් ඇතුළත ලබාගත නොහැකි වේ නම්;

(ඇ) බලපත්‍රලාභී බැංකුවේ අලාභ අවම වශයෙන් කොටස් හිමියන්ට සහ යටත් ණයහිමියන්ට වෙන් කර ඇත්නම්; සහ

(ඈ) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුව හෝ සේතු බැංකුව නිරාකරණ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමත් සමඟ ශක්තිමත් වනු ඇති බවට මහ බැංකුවේ මතය වන්නේ නම්.

(3) ආණ්ඩුව විසින්-

(අ) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවක් වෙත හෝ 30 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේතු බැංකුවක් වෙත මූල්‍ය සහාය ලබාදීම සඳහා;

(ආ) 36 වන වගන්තිය යටතේ කොටස් හිමියන්ට සහ ණයහිමියන්ට වන්දි මුදල් ගෙවීම සඳහා; හෝ

(ඇ) (අ) වන හෝ (ආ) වන ඡේදයෙහි දක්වා ඇති කාර්ය සඳහා ආනුෂංගික වන හෝ ඒ හා සම්බන්ධ වන වෙනත් යම් පියවර ගැනීම සඳහා,

මේ වගන්තිය යටතේ තාවකාලික මූල්‍ය සහාය ලබාදිය හැකි ය.

(4) (අ) මේ වගන්තිය යටතේ තාවකාලික මූල්‍ය සහාය ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවක හෝ සේතු බැංකුවක පාලනය කිරීමේ බැඳියාවක් දරන්නා බවට ආණ්ඩුව පත්ව ඇති අවස්ථාවක ඒ බලපත්‍රලාභී බැංකුව හෝ සේතු බැංකුව වාණිජමය සහ වෘත්තීයමය පදනමක් මත කළමනාකරණය කරනු ලැබිය යුතු අතර, මහ බැංකුවේ වැඩි දියුණු කළ අධීක්ෂණයට යටත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) වන ඡේදයේ සඳහන්, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභී බැංකුව හෝ සේතු බැංකුව විසින් සාධාරණ කාල රාමුවක් තුළ, ආණ්ඩුවේ පාලනයෙන් බැහැරවීම සඳහා, මහ බැංකුව සෑහීමට පත්වන පරිදි සැලැස්මක් සකස් කළ යුතු ය. අමාත්‍යවරයා විසින්, මහ බැංකුවේ නිර්දේශය මත, කාලය සහ වෙළෙඳපොළ තත්ත්වයන් සහ රහස්‍යභාවය පිළිබඳ අවශ්‍යතා සැලකිල්ලට ගෙන සාධාරණ සහ විනිවිද ආකාරයකින් බැහැරවීමේ විකල්ප භාවිත කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටි නියම කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සපයන ලද යම් තාවකාලික මූල්‍ය සහාය සහ අදාළ පිරිවැය සහ අපේක්ෂිත ශුද්ධ අයකර ගැනීම් 15 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ සියලු බැංකුවලින් අයකර ගනු ලැබිය හැකි ය.

(6) අමාත්‍යවරයා විසින්, මහ බැංකුවේ නිර්දේශය මත, මේ පනත යටතේ තාවකාලික මූල්‍ය සහාය සැපයීම සහ ඒ අරමුදල් පියවා ගැනීම සඳහා වූ රීති නියම කරනු ලැබිය හැකි ය.

පද්ධතිමය බලපෑමක් සහිත බලපත්‍රලාභී බැංකුවක් සඳහා ප්‍රාග්ධනීකරණය

**34.** (1) 30 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, බලපත්‍රලාභී බැංකුවක අසාර්ථකත්වය පද්ධතිමය බලපෑමක් ඇති කළ හැකි බවට ආණ්ඩුවේ මතය වන අවස්ථාවක දී, ඒ බලපත්‍රලාභී බැංකුව නිරාකරණය කිරීම සඳහා ආණ්ඩුවට අධිකාරී බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමේ දී, ආණ්ඩුව විසින්-

(අ) ඒ බලපත්‍රලාභී බැංකුවේ ප්‍රතිප්‍රාග්ධනීකරණය සඳහා ආණ්ඩුව සහභාගීවීම මගින්; හෝ

(ආ) ඒ බලපත්‍රලාභී බැංකුව තාවකාලික පොදු හිමිකාරත්වය යටතට ගැනීම මගින්,

ඒ බලපත්‍රලාභී බැංකුව වෙත ප්‍රාග්ධනය යොදවනු ලැබිය හැකි ය.

(3) 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවක් සඳහා අදාළ විය යුතු ය.

නිරාකරණ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහ බැංකුව විසින් දැනුම් දීම

**35.** (1) මහ බැංකුව විසින් මේ පනත යටතේ සිය නිරාකරණ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව, මහ බැංකුව විසින් උචිත අවස්ථාවල දී අමාත්‍යවරයාට සහ යම් විදේශීය අධීක්ෂණ හෝ නිරාකරණ අධිකාරීන් ඇතුළු වෙනත් අදාළ අධිකාරීන් වෙත දැනුම් දිය හැකි ය.

(2) මේ පනතේ මේ කොටස යටතේ යම් බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් නිරාකරණ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහ බැංකුව විසින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනක දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.

කොටස් හිමියන් සහ ණයහිමියන් සඳහා වන්දි ගෙවීම

**36.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී-

(අ) ආර්ථිකය තුළ බලපත්‍රලාභී බැංකුවක අසාර්ථකත්වය හේතුවෙන් යම් බලපෑමක් ඇතිවීම අවම කිරීමට සහ එවැනි අසාර්ථක වීමක් මූල්‍ය පද්ධතිය පුරා පැතිරයාමෙන් සිදුවිය හැකි ආශ්‍රිත අවදානම වළක්වා ගැනීමට; හෝ

(ආ) බලපත්‍රලාභී බැංකුවක සියලු තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ ප්‍රතිලාභය සඳහා වටිනාකම උපරිම කිරීමට,

අවශ්‍ය යයි මහ බැංකුව සලකන්නේ නම්, නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවක ණයහිමියන් පන්තියකට හෝ පන්තිවලට ආරෝපණය කළ හැකි අලාභවල බලපෑම, එකී බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ බැඳියාවන් සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සැලකිල්ලට ගනිමින්, ඒ බලපත්‍රලාභී බැංකුවේ ණයහිමියන් අතර යම් පුද්ගල පන්තියකට හෝ පන්තිවලට වෙනස් ආකාරයේ සැලකිල්ලක් දැක්වීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) (අ) නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දැමීම හරහා ඇවර කරනු ලැබ තිබුණේ නම්, එහි දී යම් කොටස් හිමියකුට හෝ ණයහිමියකුට දැරීමට සිදුවිය හැකිව තිබූ අලාභයට වඩා වැඩි අලාභයක් ඒ බලපත්‍රලාභී බැංකුව නිරාකරණයට යටත් කිරීම නිසා දරනු ලබන කොටස් හිමියකු හෝ ණයහිමියකු සඳහා එම වෙනස වෙනුවෙන් වන්දි ලබා දිය හැකි ය.

(ආ) 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්දක් සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින්, නිරාකරණය සම්පූර්ණ වීමෙන් පසුව කරනු ලබන තක්සේරු කිරීමක් මත පදනම්ව (අ) වන ඡේදය යටතේ වන්දි වශයෙන් ගෙවිය යුතු වෙනස තීරණය කරනු ලැබිය යුතු ය.

(3) මහ බැංකුව විසින් නිරාකරණය ආරම්භ කිරීමට පෙරාතුව ම එම බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දමනු ලබන බවට වන පදනම මත සහ ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවේ දී ලබාදිය හැකි වටිනාකම මත පදනම් ව (2) වන උපවගන්තියේ සඳහන් තක්සේරු කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, මහ බැංකුව විසින් හෝ ආණ්ඩුව විසින් සපයන ලද යම් පොදු මූල්‍ය සහායක හෝ හදිසි අවස්ථා ද්‍රවශීලතා සහායක ප්‍රතිඵලයක් වශයෙන් ඒ බලපත්‍රලාභී බැංකුවේ ඇති කරන ලද හෝ ආරක්ෂා කරන ලද යම් වටිනාකමක්, ඒ වෙනස ගණනය කිරීමේ දී අඩු කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ දක්වා ඇති වන්දි, 33 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි තාවකාලික මූල්‍ය සහාය හරහා ආණ්ඩුව විසින් ලබා දිය හැකි ය.

(5) මහ බැංකුව විසින්, කලින් කලට, විධාන නිකුත් කිරීම මගින් මේ වගන්තියේ විධිවිධාන බලාත්මක කරනු ලැබිය හැකි ය.

මහ බැංකුව සහ අමාත්‍යාංශය විසින් තොරතුරු හුවමාරු කරගනු ලැබිය හැකි බව

**37.** (1) මේ පනතේ හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ ආණ්ඩුවෙන් මුදල් සම්පාදනය කිරීම අවශ්‍ය වන යම් බලපත්‍රලාභී බැංකුවකට අදාළ නිරාකරණ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම, සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ තොරතුරු මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය විසින් හුවමාරු කරගනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා, ලේකම්වරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, යම් අධ්‍යක්ෂවරයකු, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ කර්තව්‍ය හෝ කටයුතුවල යෙදී සිටින හෝ සේවයේ නියුක්තව සිටින නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ හුවමාරු කරගනු ලබන සියලුම තොරතුරු සම්බන්ධයෙන් දැඩි රහස්‍යභාවයක් පවත්වාගත යුතු අතර-

(අ) අධිකරණයක් මගින් නියම කරනු ලබන පරිදි;

(ආ) මේ පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ දී; හෝ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධාන සමග අනුකූලව ක්‍රියාකිරීමේ දී,

හැර, ඒ තොරතුරු හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

දේශාන්තර සහයෝගීතාවය

**38.** (1) මේ පනතේ හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් අධිකරණ බල ප්‍රදේශවල පිහිටා ඇති බැංකුවල අධීක්ෂණ හෝ නියාමන අධිකාරීන් ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති අදාළ අධිකාරීන් සමග සම්බන්ධීකරණය වීම සඳහා, සහයෝගීව ක්‍රියා කිරීම සඳහා සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ගිවිසුම්වලට, අවබෝධතා ගිවිසුම්වලට සහ වැඩපිළිවෙළවලට ඇතුළත් වීම සඳහා මහ බැංකුවට අධිකාරී බලය තිබිය යුතු ය:

එසේ වුව ද, තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ යුතුකමක් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ඒ යම් අධිකාරියකට නොතිබීමේ හේතුව නිසා යම් රහස්‍ය තොරතුරක් ඒ යම් අධිකාරියක් සමඟ හුවමාරු කරගතහොත් එහි රහස්‍යභාවය ආරක්ෂා කළ නොහැකි බව මහ බැංකුවේ මතය වන්නේ නම්, මහ බැංකුව ඒ තොරතුර ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි එවැනි යම් අධිකාරියක් සමඟ හුවමාරු කරගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි අදාළ අධිකාරීන් සමඟ ඇති කරගනු ලබන ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ වැඩපිළිවෙළවලට පහත දක්වා ඇති දේ ඇතුළත් විය යුතු ය:–

(අ) උපදේශන, පූර්ව දැනුම් දීම්, නියාමන හෝ අධීක්ෂණ අවශ්‍යතා, ප්‍රතිසාධන සැලසුම්, නිරාකරණ හැකියාව පිළිබඳ තක්සේරු කිරීම්, නිරාකරණ සැලසුම්, පූර්ව මැදිහත්වීමේ ක්‍රියාමාර්ග සහ නිරාකරණ ක්‍රියාමාර්ග ඇතුළුව පාර්ශ්වයන් අතර එකඟ වූ කාරණා පිළිබඳ තොරතුරු කාලීනව හුවමාරු කර ගැනීමේ කාර්ය පටිපාටි;

(ආ) නිරාකරණ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය සඳහා වූ කාර්ය පටිපාටි;

(ඇ) විදේශීය නියාමන අධිකාරීන් සහ මහ බැංකුව විසින් ගනු ලබන නිරාකරණ ක්‍රියාමාර්ග පිළිගැනීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා වූ කාර්ය පටිපාටි;

(ඈ) තොරතුරු හුවමාරු කර ගනු ලබන කාර්ය සඳහා හැර වෙනත් කාර්ය සඳහා තොරතුරු භාවිත කිරීම සීමාකිරීම්;

(ඉ) තොරතුරු රහස්‍ය ආකාරයෙන් සලකනු ලැබිය යුතු බවට සහ මහ බැංකුවේ ප්‍රකාශිත කැමැත්තකින් තොරව තවදුරටත් හෙළිදරව් කරනු නොලැබිය යුතු බවට නිශ්චිතව දැක්වීම; සහ

(ඊ) මේ පනත යටතේ නිරාකරණ ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශ්වයන් විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කාරණා.

(3) මහ බැංකුව විසින්, විදේශීය නිරාකරණ අධිකාරියක ඉල්ලීම මත, ඒ විදේශීය අධිකාරියේ නිරාකරණ ක්‍රියාමාර්ගයක බලපෑම ශ්‍රී ලංකාව තුළ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අදාළ වන බවට නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද-

(අ) එහි අරමුණ සහ අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රකාරව, විදේශීය නිරාකරණ ක්‍රියාමාර්ගය මේ පනත යටතේ නිරාකරණ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සැසඳිය නොහැකි බවට;

(ආ) විදේශීය නිරාකරණ අධිකාරියේ අධිකරණ බල ප්‍රදේශයට අයත් අදාළ නීති මගින් මහ බැංකුවේ ඉල්ලීම මත නිරාකරණ ක්‍රියාමාර්ග පිළිගැනීම සඳහා ඉඩ ලබා නොදෙන බවට;

(ඇ) විදේශීය නිරාකරණ ක්‍රියාමාර්ගයක් පිළිගැනීම මේ පනත යටතේ වූ නිරාකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක නොවන බවට;

(ඈ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවේ ණයහිමියන්ට විදේශීය නිරාකරණ කටයුතු යටතේ සාධාරණ ලෙස සලකනු නොලබනු ඇති බවට;

(ඉ) එම පිළිගැනීම මගින් ශ්‍රී ලංකාව තුළ අහිතකර රාජ්‍ය මූල්‍ය අනුම්තීන් ඇති විය හැකි බවට; හෝ

(ඊ) එම පිළිගැනීම මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය උල්ලංඝනය විය හැකි බවට,

මහ බැංකුවේ මතය වන අවස්ථාවක දී, මහ බැංකුව විසින් එවැනි නියමයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

## III වන කොටස

### ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම

**39.** මහ බැංකුව විසින්, මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය නඟාසිටුවීම පිණිස සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා දායක වීම පිණිස (මෙහි මින් මතු

"යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයක්, පහත දැක්වෙන කාර්ය සඳහා මේ පනත යටතේ පිහිටුවනු ලැබිය යුතු ය:-

(අ) (මේ පනතේ මේ කොටසේ "සාමාජික ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යෝජනා ක්‍රමයේ සාමාජිකයකු වන්නා වූ ආයතනයක් වෙත නිකුත් කරන ලද බලපත්‍රය මහ බැංකුව විසින් අවලංගු කරනු ලබන අවස්ථාවක දී, 44 වන වගන්තියේ (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මහ බැංකුව විසින්, කලින් කලට, නිශ්චය කරනු ලබන යම් උපරිම මුදලක් දක්වා තැන්පත්කරුවන් වෙත වන්දි ලබාදීම පිණිස ඒ සාමාජික ආයතනයේ තැන්පත්කරුවන් විසින් සිදු කරනු ලබන තැන්පතු රක්ෂණය කිරීම; සහ

(ආ) නිරාකරණ ක්‍රියාමාර්ගයක් වශයෙන් සාමාජික ආයතනයක වත්කම් හා වගකීම් පැවරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස උචිත මූල්‍ය සහාය ලබා දීම සඳහා ආරක්ෂණයන්ට යටත්ව පද්ධතියක් පිහිටුවීම.

යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම

**40.** (1) මහ බැංකුව, යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අතර යෝජනා ක්‍රමය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මේ පනත යටතේ මහ බැංකුව වෙත පිරිනමන ලද හෝ පනවන ලද හෝ පවරන ලද සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යෝජනාක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින්-

(අ) යෝජනා ක්‍රමයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම;

(ආ) යෝජනා ක්‍රමයේ කර්තව්‍ය සහ මහ බැංකුවේ වෙනත් කර්තව්‍ය අතර, බැඳියාවන් අතර ගැටුමක් හෝ ඇති විය හැකි බැඳියාවන් අතර ගැටුමක් වැළැක්වීම සඳහා යෝජනා

ක්‍රමයට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අදාළ සංවිධානමය වැඩපිළිවෙළ සකස් කිරීම;

(ඇ) අරමුදලේ තිබෙන මුදල් උපයෝගී කර ගනිමින් රක්ෂිත තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රියාපටිපාටිය දක්වමින් රීති සෑදීම; සහ

(ඈ) යෝජනා ක්‍රමයේ ඵලදායී පරිපාලනය සහ කළමනාකරණය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් වැඩපිළිවෙළක් සකස් කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) යෝජනා ක්‍රමයේ එදිනෙදා පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය මහ බැංකුව විසින්, මහ බැංකුවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

යෝජනා ක්‍රමයේ සාමාජිකයන්

**41.** (1) 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් හෝ මහ බැංකුව විසින් බලය පවරනු ලබන වෙනත් යම් නිලධරයකු විසින් යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වන සියලු ආයතනවල ලැයිස්තුවක් වාර්ෂිකව, යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි එක් දිනපතා පුවත්පතකවත් පළ කරනු ලැබිය යුතු ය.

(2) මහ බැංකුව විසින්, විධානයක් මගින් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය පිළිබඳව සාමාජික ආයතන වෙත දැනුම් දිය යුතු ය.

මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, "සාමාජික ආයතනය" යන්නෙන්, බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී මුදල් සමාගමක් හෝ මහ බැංකුව විසින්, කලින් කලට, මේ පනත යටතේ සාමාජික ආයතනයක් ලෙස නිශ්චය කරනු ලබන වෙනත් යම් ආයතනයක් අදහස් වේ.

**42.** (1) මහ බැංකුව විසින්, අවස්ථාවෝචිත පරිදි බැංකු ව්‍යාපාර කටයුතු හෝ මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා සාමාජික ආයතනයක් වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම මත හෝ, ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ කිරීම මත, ඒ සාමාජික ආයතනය යෝජනා ක්‍රමයේ සාමාජිකයකු වීම අවසන් විය යුතු ය.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය අවසන් වීම

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව, මහ බැංකුව විසින්, බැංකු පනත යටතේ හෝ මුදල් ව්‍යාපාර පනත යටතේ, ඒ අවලංගු කිරීමෙන් අනතුරුව ඒ ආයතනය ඒ යෝජනා ක්‍රමයේ සාමාජිකයකු වීම අවසන් වී ඇති බවට මහජනතාව වෙත දැනුම් දිය යුතු ය.

**43.** (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සාමාජික ආයතන විසින්, සියලු සුදුසුකම් ඇති තැන්පතු, යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කරනු ලැබිය යුතු ය.

සාමාජික ආයතන විසින් යෝජනාක්‍රමය යටතේ, තැන්පතු රක්ෂණය කරනු ලැබිය යුතු බව

(2) යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කළ යුතු සුදුසුකම් ඇති තැන්පතුවලට (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තැන්පතු වගකීම් සහ යම් පොරොන්දු නෝට්ටු, දෙමුහුන් හිමිකම් සහ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් ණය සාධන පත්‍ර ඇතුළු ණය සාධන පත්‍ර හැර සාමාජික ආයතනවල ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් ඇතුළත් විය යුතු ය.

(3) පහත දක්වා ඇති තැන්පතු වගකීම්, සුදුසුකම් ඇති තැන්පතු ලෙස සලකනු නොලැබිය යුතු යः-

(අ) වෙනත් සාමාජික ආයතන වෙත පවතින තැන්පතු වගකීම්;

(ආ) සාමාජික ආයතනයක අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය, එම අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සමීප ඥාතීන්, සාමාජික ආයතනයක පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් සහ සාමාජික ආයතනයක යම් අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය

මණ්ඩලයේ හෝ ඒ අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සමීප ඥාතීන්ගේ යම් බැඳියාවක් පවතින ව්‍යාපාරයක් විසින් තනිතනිව හෝ වෙනත් යම් පාර්ශ්වයක් සමඟ ඒකාබද්ධව පවත්වාගෙන යනු ලබන තැන්පතු වගකීම්;

(ඇ) (i) සාමාජික ආයතනයක හිටපු අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන් විසින් ඒ සාමාජික ආයතනයේ ව්‍යාපාර මෙහෙයුම් හෝ කළමනාකරණය පවත්වාගෙන යාමේ දී, ඒ සාමාජික ආයතනයේ තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණයහිමියන්ගේ යහපතට අහිතකර වන යම් අයථා, නුසුදුසු, වංක, රැවටිලිකාරී හෝ වංචනික මූල්‍ය ක්‍රියාකාරකමක යෙදී සිටීම හෝ ඒ හා සම්බන්ධ වී සිටීම හේතුවෙන් මහ බැංකුව විසින් කරනු ලබන විධානයක් මත ස්වකීය ධුරයෙන් ඒ අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන් ඉවත් කර ඇති අවස්ථාවක දී;

(ii) සාමාජික ආයතනයක හිටපු අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ සාමාජික ආයතනයක එවැනි ධුරයක් දැරීම සඳහා සුදුසු හෝ යෝග්‍ය නොවන බවට මහ බැංකුව විසින් නිශ්චය කොට ඇති අවස්ථාවක දී;

(iii) සාමාජික ආයතනයක හිටපු අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන් විසින් තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණයහිමියන්ගේ යහපතට අහිතකර වන අයථා, නුසුදුසු, වංක, රැවටිලිකාරී හෝ වංචනික මූල්‍ය ක්‍රියාකාරකම් හරහා ඒ සාමාජික ආයතනයේ ව්‍යාපාර මෙහෙයුම් හෝ කළමනාකරණය පවත්වාගෙන යාමේ නිරත වීම හෝ නිරත වී සිටීම හෝ සම්බන්ධ වීම හෝ ඒ සඳහා වගකිවයුතු වීම හේතුවෙන් ඒ අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන්

යෝජනා ක්‍රමය යටතේ යම් ප්‍රතිලාභයක් ලැබීමට හිමිකම් නොලබන බවට, පවත්නා කරුණු මත සැහීමකට පත්වීමෙන් හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරුන්ට හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ට, කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව, මහ බැංකුව විසින් ස්වකීය මෙහෙයවීමෙන් තීරණය කරනු ලබන අවස්ථාවක දී,

ඒ සාමාජික ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ගේ තැන්පතු වගකීම්;

(ඈ) මහ බැංකුව විසින් කලින් කලට, නිකුත් කරනු ලබන විධාන ප්‍රකාරව මහ බැංකුව වෙත පවරනු ලැබ ඇති, අවස්ථාවෝචිත පරිදි, බැංකු පනත යටතේ අත්හැර දැමූ දේපළ යන්නෙහි සහ මුදල් ව්‍යාපාර පනත යටතේ අක්‍රීය තැන්පතු යන්නෙහි අර්ථානුකූලව වූ තැන්පතු;

(ඉ) අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් ඇතුළුව ආණ්ඩුවේ ආයතනයක් විසින් දරනු ලබන තැන්පතු; සහ

(ඊ) යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් නොලබන බවට මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන, සාමාජික ආයතනයක වෙනත් යම් තැන්පතු වගකීමක්.

(4) මහ බැංකුව විසින් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම සම්බන්ධයෙන්, කලින් කලට, සාමාජික ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි ය.

තැන්පත්කරුවන් සඳහා වන වන්දි මුදල්

**44.** (1) මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව හෝ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි, රක්ෂිත තැන්පතු සඳහා තැන්පත්කරුවන්ට වන්දි මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් සාමාජික ආයතනයක රක්ෂිත තැන්පතු සඳහා වන්දි මුදල් ගෙවීම ඒ සාමාජික ආයතනයට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ආරම්භ කරනු ලැබිය යුතු ය.

(3) රක්ෂිත තැන්පතුවල තැන්පත්කරුවකු විසින්, සාමාජික ආයතනයට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබූ දින සිට වසර හයක් ඇතුළත වන්දි මුදල් ලබා ගැනීම සඳහා යථා පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම්පෑමක් ඉදිරිපත් කර ඇති තාක් දුරට, ඒ තැන්පත්කරු (1) වන උපවගන්තිය යටතේ වන්දි මුදල් ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන්දි මුදල් ගෙවීමේ කාර්යය සඳහා, ඒ මුදල් ප්‍රමාණ එහි රක්ෂිත තැන්පත්කරුවන්ට සත්‍ය වශයෙන් ම ගෙවනු ලබන දිනය කුමක් වුව ද, ඒ සාමාජික ආයතනය විසින් ගෙවීමට බැඳී සිටින රක්ෂිත තැන්පතු මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයකට, ඒ සාමාජික ආයතනයට එරෙහිව තැන්පත්කරුවන්ට ඇති අයිතිවාසිකම්වලට 49 වන වගන්තිය යටතේ පිහිටුවන ලද තැන්පතු රක්ෂණ අරමුදල ස්වයංක්‍රීයව ම ප්‍රතිනිවේශනය විය යුතු යඃ

එසේ වුව ද, 2021 අගෝස්තු මස 6 වන දිනට පෙරාතුව ස්වකීය බලපත්‍ර අවලංගු කරනු ලැබ ඇති හෝ අත්හිටුවනු ලැබ ඇති සාමාජික ආයතනවල රක්ෂිත තැන්පතුවල තැන්පත්කරුවන් විසින්, ඒ සාමාජික ආයතනවලට නිකුත් කර ඇති බලපත්‍ර අවලංගු කරන ලද නැතහොත් අත්හිටුවන ලද දින සිට වසර හතරක් ගතවීමට පෙර ස්වකීය හිමිකම්පෑම් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, සාමාජික ආයතනයක් විසින්, ඒ සාමාජික ආයතනයේ එක් එක් තැන්පත්කරු සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංකයක් ද සමග ඒ සාමාජික ආයතනයේ සියලුම තැන්පත්කරුවන් සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘති පත්‍රයකට සහ ආකාරයට අනුව එහි සියලුම තැන්පත්කරුවන් පිළිබඳ විස්තර මහ බැංකුව වෙත කාලානුරූපීව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) සාමාජික ආයතනයකට නිකුත් කර ඇති බලපත්‍රයක් මහ බැංකුව විසින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ සාමාජික ආයතනය විසින්, බලපත්‍රය අවලංගු කරනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවන්ට වන්දි මුදල් ගෙවීමේ

කාර්යය සඳහා, ඒ ආයතනයේ තැන්පත්කරුවන් පිළිබඳ ලැයිස්තුවක් (5) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට සහ ආකාරයට අනුව මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ දක්වා ඇති තැන්පත්කරුවන් පිළිබඳ ලැයිස්තුව මහ බැංකුවේ අධීක්ෂණ දෙපාර්තමේන්තුවල අදාළ ප්‍රධානීන් විසින් සහතික කරනු ලැබිය යුතු ය. තැන්පත්කරුවන් පිළිබඳ ලැයිස්තුව සහතික කිරීමේ කාර්යය සඳහා අධීක්ෂණ දෙපාර්තමේන්තුවල අදාළ ප්‍රධානීන් විසින්, අවශ්‍ය නම්, බාහිර විගණකවරයකුගේ සේවය ලබා ගනු ලැබිය හැකි ය.

(8) සාමාජික ආයතනයක රක්ෂිත තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල, ඒ සාමාජික ආයතනයේ බලපත්‍රය අවලංගු කරන ලද දිනට රක්ෂිත තැන්පතු වගකීම් මත උපචිත වූ යම් පොලියක් ද ඇතුළුව, එක් එක් තැන්පත්කරුගේ සියලුම රක්ෂිත තැන්පතු වගකීම් එකතු කිරීමෙන් ගණනය කරනු ලැබිය යුතු අතර, පසුව එළඹෙන කාලසීමාව සඳහා කිසිදු පොලියක් ගෙවනු නොලැබිය යුතු ය.

(9) (8) වන උපවගන්තිය යටතේ තැන්පත්කරුවකුට ගෙවිය යුතු උපරිම වන්දි මුදල් ප්‍රමාණය, යෝජනා ක්‍රමය යටතේ වන රක්ෂිත තැන්පත්කරුවන් බහුතරයකගේ බැඳියාවන් ආරක්ෂා කිරීම, බැංකු පද්ධතියේ සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ තැන්පතු රක්ෂණ අරමුදලේ ඇති මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල නිශ්චය කිරීමේ දී, මහ බැංකුව විසින්, රක්ෂිත තැන්පතුවල ව්‍යවහාර මුදල් වර්ගය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය. ඒ තැන්පතු විදේශ ව්‍යවහාර මුදල්වලින් වේ නම්, ඒ මුදල් ප්‍රමාණයට සමාන වූ ද, මහ බැංකුව විසින් (9) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලබන්නා වූ ද, ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මුදල් ප්‍රමාණයක් ඒ තැන්පත්කරුට ගෙවනු ලැබිය යුතු ය.

(11) වන්දි මුදල් ගෙවීම සඳහා කිසිදු විටෙක මහ බැංකුව විසින් වගකීමක් දරනු නොලැබිය යුතු අතර, තැන්පතු රක්ෂණ අරමුදලේ බැරට ඇති මුළු මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ යම් බැරකමක් සම්බන්ධයෙන් මහ බැංකුව වගකීමට යටත් නොවිය යුතු ය.

(12) තැන්පතු රක්ෂණ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය තැන්පත්කරුවන් සඳහා වන ස්වකීය වගකීම්වලට වඩා අඩු අවස්ථාවක දී, ආණ්ඩුවෙන් හෝ වෙනත් මූලාශ්‍රවලින් ණය ගැනීම් මගින් අතිරේක මුදල් රැස්කර ගනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා, යෝජනා ක්‍රමය සහ මුදල් අමාත්‍යාංශය විසින්, සෑම විටෙක ම ඒ ණය ගැනීම් සඳහා පහසුකම් සැලසීම පිණිස වූ නියම, කොන්දේසි සහ කාර්ය පටිපාටි දැක්වෙන අවබෝධතා ගිවිසුමක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(13) 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, කලින් කල, තැන්පත්කරුවන් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් සාමාජික ආයතන වෙත උපදෙස් නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය.

තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම්වලට යෝජනා ක්‍රමය ප්‍රතිනිවේශනය විය යුතු බව

**45.** (1) 44 වන වගන්තිය යටතේ වන්දි මුදල් ගෙවීමෙන් පසුව, රක්ෂිත තැන්පතුවල මුළු වටිනාකමෙහි ප්‍රමාණයට, බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති සාමාජික ආයතනයට එරෙහි රක්ෂිත තැන්පත්කරුවන්ගේ සියලු අයිතිවාසිකම්වලට යෝජනා ක්‍රමය ප්‍රතිනිවේශනය විය යුතු ය.

(2) මේ වගන්තියේ දක්වා ඇති තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම්වලට ප්‍රතිනිවේශනය වීම මගින්, තැන්පතු රක්ෂණ අරමුදලින් ආවරණය නොවන මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් සාමාජික ආයතනයට එරෙහි තැන්පත්කරුවකුගේ ඉල්ලීම්වලට බලපෑමක් ඇති නොවිය යුතු ය.

වෙනත් බලපත්‍රලාභී බැංකුවක් මගින් වන්දි මුදල් ගෙවිය හැකි බව

**46.** මහ බැංකුව විසින් කෙලින් ම හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වූ ද, ගෙවීම් කිරීමේ බැංකුවක් ලෙස ක්‍රියා කිරීමට කැමැත්ත දක්වන්නා වූ ද, වෙනත් යම් බලපත්‍රලාභී බැංකුවක් මගින් යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවන්ට වන්දි මුදල් ගෙවනු ලැබිය හැකි ය.

වන්දි මුදල් ගෙවීම සම්බන්ධයෙන් වන දැන්වීම

**47.** මහ බැංකුව විසින්, යෝජනා ක්‍රමය යටතේ වන්දි මුදල් ගෙවීම ක්‍රියාත්මක කරන දිනයට පෙරාතුව වූ වැඩ කරන දින හතක් ඇතුළත ඒ ගෙවීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන දැන්වීමක්,

යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු අතර, ඒ දැන්වීමෙහි පහත කරුණු ඇතුළත් විය යුතු ය:-

(අ) ගෙවීම් කිරීමේ බැංකුවේ විස්තර;

(ආ) වන්දි මුදල් ලබා ගැනීම සඳහා තැන්පත්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු විස්තර;

(ඇ) එක් තැන්පත්කරුවකුට ගෙවිය යුතු උපරිම වන්දි මුදල් ප්‍රමාණය; සහ

(ඈ) වන්දි මුදල් ගෙවීම සඳහා තැන්පත්කරුවන් විසින් ඔවුන්ගේ හිමිකම්පෑම් ඉදිරිපත් කළ යුත්තේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් තැන්පත්කරුවන්ට ලබා දෙන වෙනත් උපදෙස්.

සාමාජික ආයතන විසින් වාර්තා කිරීම

**48.** සෑම සාමාජික ආයතනයක් විසින් ම, මහ බැංකුව විසින් කලින් කල අවශ්‍ය කරනු ලැබිය හැකි තොරතුරු, මහ බැංකුව විසින් කලින් කල නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් මහ බැංකුවට හෝ මහ බැංකුව විසින් බලය පවරන ලද යම් නිලධරයකුට සපයනු ලැබිය යුතු ය.

තැන්පතු රක්ෂණ අරමුදල

**49.** (1) මහ බැංකුව විසින්, යෝජනා ක්‍රමයේ මෙහෙයුම්වල කොටසක් වශයෙන් තැන්පතු රක්ෂණ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ තැන්පතු රක්ෂණ අරමුදල මහ බැංකුවේ අනෙකුත් වත්කම්වලින් සහ මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන වත්කම්වලින් වෙන්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) තැන්පතු රක්ෂණ අරමුදල නමින් මහ බැංකුව විසින් හෝ ඊට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය.

තැන්පතු රක්ෂණ අරමුදලට අදාළ මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**50.** (1) මහ බැංකුව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, තැන්පතු රක්ෂණ අරමුදලේ කටයුතු කළමනාකරණය කිරීම, පරිපාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම කරනු ලැබිය යුතු ය.

(2) තැන්පතු රක්ෂණ අරමුදලේ කටයුතු කළමනාකරණය කිරීමේ දී, පරිපාලනය කිරීමේ දී සහ අධීක්ෂණය කිරීමේ දී, මහ බැංකුව විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:-

(අ) තැන්පතු රක්ෂණ අරමුදලේ සාමාන්‍ය පරිපාලනයට සහ ඒ හා සම්බන්ධ වෙනත් කරුණුවලට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම;

(ආ) තැන්පතු රක්ෂණ අරමුදල ඵලදායී ලෙස පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා යම් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් සමඟ තැන්පතු රක්ෂණ අරමුදල නමින් ගිවිසුම්වලට එළඹීම;

(ඇ) මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි, ආණ්ඩුවෙන් හෝ යම් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින්, තැන්පතු රක්ෂණ අරමුදල නමින් යම් ප්‍රදානයක් හෝ ආධාරයක්, හෝ ණයක් පිළිගැනීම;

(ඈ) තැන්පතු රක්ෂණ අරමුදලේ ඇති මුදල් භාවිත කරමින් රක්ෂිත තැන්පතු ආපසු ගෙවීම සඳහා වන කාර්ය පටිපාටි සකස් කිරීම;

(ඉ) තැන්පතු රක්ෂණ අරමුදලේ මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන ආයෝජන සිදු කිරීම සහ ඒ සඳහා වූ යම් ගනුදෙනුවකට හෝ ගිවිසුමකට එළඹීම;

(ඊ) මහ බැංකුව විසින් අවසර දෙන යම් හිමිකම්පෑමක් තැන්පතු රක්ෂණ අරමුදල මඟින් හෝ ඊට එරෙහිව පියවීම හෝ සමථයකට පත් කිරීම;

(උ) 44 වන වගන්තිය යටතේ තැන්පත්කරුවන්ට වන්දි මුදල් ගෙවිය යුතු කාලසීමාව නිශ්චය කිරීම; හෝ

(ඌ) තැන්පතු රක්ෂණ අරමුදල ඵලදායී ලෙස පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි මහ බැංකුව විසින් සලකනු ලබන වෙනත් දේ කිරීම.

තැන්පතු රක්ෂණ අරමුදලේ අරමුදල් මූලාශ්‍ර

**51.** (1) තැන්පතු රක්ෂණ අරමුදලට-

(අ) නියමිත දිනයේ දී, තත්කාලයේ බලපවත්නා නීති යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ වන තැන්පතු රක්ෂණ අරමුදලේ බැරට ඇති මුදල්;

(ආ) සාමාජික ආයතන විසින් ගෙවන ලද වාරික මුදල් සහ දඩ මුදල්;

(ඈ) තැන්පතු රක්ෂණ අරමුදලේ මුදල්වලින් කරන ලද ආයෝජන මගින් ව්‍යුත්පන්න වූ ආයෝජන ආදායම සහ ලැබීම්;

(ඈ) තත්කාලයේ බලපවත්නා නීති යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ යම් සාමාජික ආයතනවලට ප්‍රදානය කරන ලද සුරක්ෂිත අත්තිකාරම් මුදල් හෝ ණය මුදල් ආපසු අයකර ගැනීම්;

(ඉ) සාමාජික ආයතනයකට එරෙහිව පවරන ලද ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු අතරතුර ඒ සාමාජික ආයතනයේ වත්කම්වලින් සහ ඒ සාමාජික ආයතනයේ වත්කම් මගින් තැන්පත්කරුවන්ට ගෙවන ලද වන්දි මුදල් ආපසු අයකර ගැනීමෙන් ලත් මුදල් ප්‍රමාණ;

(ඊ) බැංකු පනත යටතේ මහ බැංකුවට මාරු කර ඇති, අවස්ථාවෝචිත පරිදි, සාමාජික ආයතනවල අත්හැර දැමූ දේපළ හෝ අක්‍රීය තැන්පතු මගින් විසර්ජනය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණ;

(උ) මේ පනතේ මේ කොටස යටතේ සාමාජික ආයතන විසින් ගෙවන ලද අතිරේක වාරික මුදල් සහ දඩ මුදල් වශයෙන් ලැබුණු මුදල්;

(ඌ) ආණ්ඩුවෙන් හෝ මහ බැංකුව විසින් අනුමත කරනු ලැබිය හැකි යම් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් ණයට ගත් මුදල්; සහ

(එ) මහ බැංකුව විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් ආදායම් මූලාශ්‍රවලින් ලැබුණු වෙනත් යම් ලැබීම්,

බැර කරනු ලැබිය යුතු ය.

(2) තැන්පතු රක්ෂණ අරමුදල-

(අ) සාමාජික ආයතනවල රක්ෂිත තැන්පතුවල තැන්පත්කරුවන් සඳහා වන වන්දි මුදල්;

(ආ) තැන්පතු රක්ෂණ අරමුදලේ බැරට ඇති, සාමාජික ආයතනවල අත්හැර දැමූ දේපළ හෝ අක්‍රීය තැන්පතු;

(ඇ) ආණ්ඩුවෙන් හෝ යම් ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් ණයට ගත් මුදල් ආපසු ගෙවීම; සහ

(ඈ) මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි, යෝජනා ක්‍රමයේ මෙහෙයුම් වියදම්,

සම්බන්ධයෙන් ගෙවීම් සිදු කිරීම සඳහා භාවිත කරනු ලැබිය යුතු ය.

(3) පැවරුම්ලාභියකු හෝ සේතු බැංකුවක් වෙත වත්කම් සහ වගකීම් පැවරීම මගින් එසේ පවරන ලද වත්කම් සහ වගකීම් අතර පවතින යම් වෙනසක් ගෙවීම මගින් හෝ ඇපකරයක් නිකුත් කිරීම මගින් හෝ පවරන ලද වත්කම්වලට සහ වගකීම්වලට අදාළ අලාභ හානි පූර්ණය කිරීම මගින් බලපත්‍රලාභී බැංකුවක් නිරාකරණය කිරීමට ඵලදායී ලෙස පහසුකම් සැපයීම සඳහා අරමුදල් සපයන ලෙස මහ බැංකුව විසින් යෝජනා ක්‍රමය වෙත නියම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ සපයනු ලබන මුළු අරමුදල් ප්‍රමාණය 44 වන වගන්තිය යටතේ ඒ බැංකුවේ තැන්පත්කරුවන්ට ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය නො ඉක්මවිය යුතු අතර, ඒ අරමුදල් සැපයීම, වත්කම් සහ වගකීම් පැවරීමෙන් පසුව ශක්‍යතාවක් ඇති බැංකුවක් විසින් රක්ෂිත තැන්පතු ගෙවීමට බැඳී සිටින බවට මහ බැංකුව විසින් කරනු ලබන සහතික කිරීමකට යටත් විය යුතු ය:

එසේ ම තවදුරටත්, සියලුම පන්තිවලට අයත් කොටස් ප්‍රාග්ධනය දරන්නන් සහ යටත් ණයහිමියන් විසින් අලාභ අවශෝෂණය කර තිබිය යුතු ය; නැතහොත් අලාභ අවශෝෂණය කරනු ලැබිය යුතු ය.

(4) (අ) නිරාකරණය කිරීමට යටත් බලපත්‍රලාභී බැංකුවට (3) වන උපවගන්තිය යටතේ යෝජනා ක්‍රමය මගින් සපයන ලද මුළු අරමුදල් ප්‍රමාණය ඒ බැංකුවෙන් ආපසු අයකර ගැනීමට මහ බැංකුවට අයිතිවාසිකම තිබිය යුතු ය.

(ආ) බලපත්‍රලාභී බැංකුවෙන් යෝජනා ක්‍රමය වෙත අයකරගනු ලැබිය යුතු අරමුදල් ප්‍රමාණය, රක්ෂිත තැන්පතු සහ 45 වන වගන්තිය යටතේ රක්ෂිත තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ප්‍රතිනිවේශනය කිරීම මගින් පැනනගින තැන්පතු රක්ෂණ අරමුදලේ හිමිකම්පෑම් හා සමානව ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය.

**52.** ආයෝජනවල සුරක්ෂිතබව, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභය සැලකිල්ලට ගනිමින්, තැන්පතු රක්ෂණ අරමුදලේ මුදල් ආයෝජනය කිරීමට අදාළව මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන ප්‍රතිපත්තිවලට සහ මාර්ගෝපදේශවලට අනුකූලව, මහ බැංකුව විසින්, තැන්පතු රක්ෂණ අරමුදලේ බැරට ඇති සියලුම මුදල්, භාණ්ඩාගාර බිල්පත්වල, භාණ්ඩාගාර බැඳුම්කරවල සහ වෙනත් අලෙවි කළ හැකි සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය යුතු ය. තැන්පතු රක්ෂණ අරමුදලේ මුදල් ආයෝජනය කිරීම

**53.** තැන්පතු රක්ෂණ අරමුදලේ ඇති ද්‍රවශීල අරමුදල් යෝජනා ක්‍රමයේ ගෙවීම් අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවන බවට සලකනු ලබන කවර වූ හෝ විටෙක දී, මහ බැංකුව විසින්, මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව සහ ඒ යම් කාලසීමාවක් සඳහා, තැන්පතු රක්ෂණ අරමුදලේ දැනට ඇති සමපාර්ශ්වීය සුරැකුම්වලට එරෙහිව හෝ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ඇපකරයකට එරෙහිව තැන්පතු රක්ෂණ අරමුදලට ද්‍රවශීලතා පහසුකමක් සපයනු ලැබිය හැකි ය. මහ බැංකුවෙන් තැන්පතු රක්ෂණ අරමුදලට අරමුදල් මාරු කිරීම

**54.** (1) තැන්පතු රක්ෂණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. තැන්පතු රක්ෂණ අරමුදලේ ගිණුම් මහ බැංකුව විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකට සහ ආකාරයකට අනුව පවත්වාගෙන යනු ලැබිය යුතු ය. ඒ මූල්‍ය ප්‍රකාශ වෙනම පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල කොටසක් ලෙස සලකනු නොලැබිය යුතු ය. තැන්පතු රක්ෂණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

(2) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස තුනක් ඇතුළත තැන්පතු රක්ෂණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම මහ බැංකුවේ වගකීම විය යුතු ය. ඒ මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මහ බැංකුව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හතරක් ඇතුළත තැන්පතු රක්ෂණ අරමුදලේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ, යටත් පිරිසෙයින් එක්වරක්වත්, ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනක සහ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් ආකාරයකින් පළ කරනු ලැබිය යුතු ය.

සාමාජික ආයතන විසින් තැන්පතු රක්ෂණ අරමුදලට වාරික මුදලක් ගෙවිය යුතු බව

**55.** (1) එක් එක් සාමාජික ආයතනයක් විසින්, සුදුසුකම් ඇති මුළු රක්ෂිත තැන්පතු මුදල් ප්‍රමාණය අනුව ගණනය කරන ලද වාරික මුදලක්, මහ බැංකුව විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමා සඳහා, යම් අනුපාතයක් මත, යම් අවස්ථාවල දී සහ යම් ආකාරයකින් තැන්පතු රක්ෂණ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වාරික මුදල් ගෙවීම යම් සාමාජික ආයතනයක් විසින් පැහැර හැර ඇති අවස්ථාවක දී, ඒ ගෙවීම පැහැර හැර ඇති කාලසීමාව සඳහා මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුපාතයක් මත මහ බැංකුවට දඩයක් ගෙවීමට ඒ සාමාජික ආයතනය යටත් විය යුතු ය.

(3) විශේෂ අවස්ථානුගත කරුණුවල දී, මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත යම් අතිරේක වාරික මුදලක් තැන්පතු රක්ෂණ අරමුදලට ගෙවන ලෙස සාමාජික ආයතනවලට නියම කිරීමට මහ බැංකුවට අධිකාරී බලය තිබිය යුතු ය.

(4) නිශ්චිතව දක්වන ලද කාලසීමාව ඇතුළත (3) වන උපවගන්තියේ දක්වා ඇති අතිරේක වාරික මුදල ගෙවීම යම් සාමාජික ආයතනයක් විසින් පැහැර හරින අවස්ථාවක, මහ බැංකුව විසින්, එක් එක් අවස්ථාව මත පදනම්ව-

(අ) ඒ සාමාජික ආයතනය විසින් පැහැදිලි කරනු ලබන හේතු සැලකිල්ලට ගනිමින්, ඒ අතිරේක වාරික මුදල ගෙවීමට ඒ සාමාජික ආයතනයට අතිරේක කාලයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) පැහැර හැර ඇති වාරික මුදල සඳහා මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් අනුපාතයක් මත, ඒ සාමාජික ආයතනයට ප්‍රමාද ගාස්තුවක් පනවනු ලැබිය හැකි ය.

(5) සාමාජික ආයතනයක් නොවන කිසිම තැනැත්තකු විසින්, ඒ තැනැත්තා යෝජනා ක්‍රමයේ සාමාජිකයකු බවට ද, ස්වකීය තැන්පතු වගකීම් මේ පනත යටතේ රක්ෂණය කර ඇති බවට ද, මහජනතාවට නිරූපණය කරනු නොලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ වසර තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු අතර, ඊට අමතරව, ඒ උල්ලංඝනය කිරීම නොකඩවා පවතින එක් එක් දිනය සඳහා රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

සාමාජික ආයතන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම

**56.** මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට හෝ මහ බැංකුව විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකුට යම් සාමාජික ආයතනයක කටයුතු පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා බලය තිබිය යුතු ය.

මේ පනතේ ඇතැම් විධිවිධාන බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළ වීම

**57.** (1) මහ බැංකුව විසින්-

(අ) මුදල් සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව ප්‍රවර්ධනය කිරීම; හෝ

(ආ) ඒ පන්තියට හෝ කාණ්ඩයට අයත් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය හෝ කටයුතු සම්බන්ධයෙන් මහජන යහපත ආරක්ෂා කිරීම,

සඳහා එසේ කිරීම අවශ්‍ය යයි මහ බැංකුව සෑහීමට පත් වන අවස්ථාවක, මහ බැංකුව විසින්, කලින් කලට, නියමයක් මගින්, බලපත්‍රලාභී බැංකු නිරාකරණය කිරීමට අදාළ මේ පනතේ I වන කොටසේ සහ II වන කොටසේ විධිවිධාන, (මෙහි මින් මතු "බැංකු නොවන මූල්‍ය ආයතන" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුව විසින් බලපත්‍ර දෙන ලද හෝ පත් කරන ලද, සහ මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන යම් පන්තියකට හෝ කාණ්ඩයකට අයත් බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළ විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මහ බැංකුව විසින් මේ වගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, මේ පනතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට කරන ලද යම් සඳහනක්, උචිත අවස්ථාවල දී, මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට කර ඇති සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව

මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව

**58.** (1) පද්ධතිමය ස්වභාවයේ මූල්‍ය අර්බුදවල බලපෑම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ සහ අවම කිරීමේ කාර්යය සඳහා මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විය යුතු, මහ බැංකුවේ අධිපතිවරයා;

(ආ) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ නියෝජ්‍ය සභාපතිවරයා විය යුතු, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා;

(ඇ) මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති, මහ බැංකුවේ පාලක මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු;

(ඈ) මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා; සහ

(ඉ) රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් භාර මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා.

මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ කාර්ය සහ කර්තව්‍ය

**59.** (1) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව විසින්-

(අ) අර්බුදකාරී කාල හඳුනා ගැනීම;

(ආ) අර්බුද සඳහා පෙර සූදානම් වීම සහ අර්බුද කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කිරීම;

(ඇ) 60 වන වගන්තිය යටතේ පත් කරනු ලබන මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවට සාමාජිකයන් පත් කිරීම;

(ඈ) අර්බුදකාරී කාලවල දී සහ අර්බුදකාරී නොවන කාලවල දී මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවේ කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කිරීම; සහ

(ඉ) ලේකම් කාර්යාලයේ කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කිරීම,

සඳහා වන කාර්ය පටිපාටි ඇතුළු කාර්ය පටිපාටි සකස් කිරීම සහ අනුමත කිරීම කරනු ලැබිය යුතු ය.

(2) අර්බුදකාරී නොවන කාලවල දී, මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය පද්ධතියේ අස්ථායීතාවයක් ඇති කිරීමට හේතුවිය හැකි අනාගත අර්බුද පිළිබඳ අවදානම මඟහරවාලීම, පාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා වූ පෙර සූදානම සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම පිණිස එහි අර්බුද කළමනාකරණ බලතල, නිපුණතාව සහ සම්පත් ශක්තිමත් කිරීමේ අරමුණින් අඛණ්ඩ පදනමක් මත තීරණ ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) අර්බුදකාරී කාලවල දී, මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව විසින්, මූල්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් අධිකාරීන් විමසා, සමස්ත අර්බුද කළමනාකරණ උපායමාර්ග අනුමත කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සහ ඒ අධිකාරීන්වල බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට සහ ස්වාධීනත්වයට අගතියක් නොමැතිව ඒ අර්බුද කළමනාකරණය සහ පාලනය කිරීම සඳහා තීරණ ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව

**60.** (1) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවට සහාය වීම සඳහා මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන තාක්ෂණික කමිටුවක් තිබිය යුතු අතර, එය අර්බුදකාරී කාලවල දී සහ අර්බුදකාරී නොවන කාලවල දී ක්‍රියාත්මක විය යුතු ය.

(2) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව විසින් මහ බැංකුව සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය නියෝජනය වන පරිදි පත් කරනු

ලබන සාමාජික සංඛ්‍යාවකින් මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව සමන්විත විය යුතු ය.

(3) 59 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවේ සභාපති ධුරය මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා විසින් දරනු ලැබිය යුතු ය.

කමිටුවල ලේකම් කාර්යාලය

**61.** මහ බැංකුව, මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ සහ මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස කටයුතු කළ යුතු ය.

මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ රැස්වීම්

**62.** (1) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුව විසින්, අවශ්‍ය වන කවර වූ හෝ විටෙක දී, එහෙත් එය අර්බුදකාරී කාලවල දී ක්‍රියාත්මක වන විට, යටත් පිරිසෙයින් මාසයකට එක් වරක්වත් ද, අර්බුදකාරී නොවන කාලවල දී යටත් පිරිසෙයින් සෑම කාර්තුවකට ම එක් වරක්වත් ද, එහි රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(2) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා විසින්, අවස්ථානුගත කරුණු සහ අවශ්‍යතා අනුව අතිවිශේෂ රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

(3) මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය සභාපතිවරයා හෝ සභාපතිවරයා ලෙස කටයුතු කරන තැනැත්තා සහ සෙසු සාමාජිකයන්ගේ සරල බහුතරය පැමිණ සිටීම මගින් සංස්ථාපනය විය යුතු ය.

(4) සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී, නියෝජ්‍ය සභාපතිවරයා ඒ රැස්වීමෙහි මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා යන දෙදෙනා ම යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතරින් වෙනත් යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

**63.** මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ සහ මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවේ සභාපතිවරුන් විසින්, අවශ්‍ය වන කවර වූ හෝ විටෙක දී, අවස්ථානුගත කරුණු සහ අවශ්‍යතා අනුව අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නිරීක්ෂකයන් ලෙස ඒ කමිටුවල රැස්වීම්වලට පැමිණෙන ලෙස, ඒ කමිටු විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ අදාළ උනන්දුවක් දක්වන තැනැත්තන්ට ආරාධනා කරනු ලැබිය හැකි ය.

කමිටු විසින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ උනන්දුවක් දක්වන තැනැත්තන්ට රැස්වීම් සඳහා ආරාධනා කළ හැකි බව

**64.** මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණ කමිටුවේ සහ මූල්‍ය ක්ෂේත්‍ර අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවේ එක් එක් සාමාජිකයකු සහ ලේකම් කාර්යාලයේ නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් විසින් ඒ කමිටුවල සාමාජිකයන් විසින් ප්‍රකාශ කරන ලද අදහස් ද ඇතුළුව, ඒ කමිටුවල කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කිරීමේ දී, ඒ කමිටු විසින් ලබා ගත් සහ රැස්කර ගත් තොරතුරු සම්බන්ධයෙන් දැඩි රහස්‍යභාවයක් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, හුදෙක් ම අදාළ කමිටුවල කාර්ය සඳහා පමණක් ඒ තොරතුරු භාවිත කරනු ලැබිය යුතු ය.

කමිටුවල තොරතුරුවල රහස්‍යභාවය

## V වන කොටස

### බලපත්‍රලාභී බැංකු ගණන් බේරා වසා දැමීම

**65.** මේ පනතේ මේ කොටසේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ මේ කොටසේ විධිවිධාන සහ බැංකු පනතේ, මුදල් නීති පනතේ, මුදල් ව්‍යාපාර පනතේ, සමාගම් පනතේ හෝ සමාගම්වල බුන්වත්භාවය සම්බන්ධයෙන් තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ පනතේ මේ කොටසේ විධිවිධාන වෙනත් යම් නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව

**66.** (1) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් මත මහ බැංකුව විසින්, බලපත්‍රලාභී බැංකුවක් ගණන් බේරා වසා දමනු ලැබිය හැකි ය :-

බලපත්‍රලාභී බැංකුවක් ගණන් බේරා වසා දැමීම

(අ) මේ පනතේ II වන කොටසේ දක්වා ඇති නිරාකරණ ක්‍රියාමාර්ග මගින් 8 වන වගන්තියේ දක්වා ඇති අරමුණු එකක් හෝ ඊට වැඩි ගණනක් මුදුන් පමුණුවා ගැනීමට නොහැකි බවට මහ බැංකුව සෑහීමට පත්වීම;

(ආ) 21 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දමනු ලැබිය යුතු යයි අද්මිනිස්ත්‍රාසිකරු විසින් නිර්දේශ කිරීම;

(ඇ) මේ පනතේ II වන කොටසේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී බැංකුවක වත්කම් සහ වගකීම්, සේතු බැංකුවක් ඇතුළුව පැවරුම්ලාභියකුට අර්ධ වශයෙන් පවරනු ලැබීම; හෝ

(ඈ) මේ පනතේ II වන කොටසේ විධිවිධාන යටතේ සාර්ථක නිරාකරණයක් සිදු කිරීමට ඇති ඉඩකඩ අවම බව නිරාකරණ ක්‍රියාවලියේ දී මහ බැංකුව විසින් නිගමනය කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කවර හෝ හේතුවක් මත බලපත්‍රලාභී බැංකුවක් ගණන් බේරා වසා දමනු ලැබිය යුතු බවට මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, මහ බැංකුව විසින් ඒ බලපත්‍රලාභී බැංකුවට කරුණු කියාපෑමට අවස්ථාවක් ලබා දී ඒ බලපත්‍රලාභී බැංකුව වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට පියවර ගනු ලැබිය යුතු අතර, මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව එය ගණන් බේරා වසා දැමීම සඳහා නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව ඒ බලපත්‍රලාභී බැංකුව විසින්, ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්වකීය ව්‍යාපාරය කරගෙන යාම වහාම නතර කරනු ලැබිය යුතු ය.

ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම

**67.** (1) බලපත්‍රලාභී බැංකුවක් වෙත නිකුත් කර ඇති බලපත්‍රය 66 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින්, ඒ බලපත්‍රලාභී බැංකුවට එරෙහිව ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව කරන ලද පෙත්සමක් මාර්ගයෙන් විය යුතු ය. ගණන් බේරා වසා දැමීම සඳහා වන හේතු සනාථ කිරීම සඳහා ඒ පෙත්සම ලේඛනගත සාක්ෂි මගින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, ගණන් බේරා වසා දැමීමේ පෙත්සම තහවුරු කිරීම සඳහා දිනයක් නියම කළ යුතු අතර, ඒ දිනය, (2) වන උපවගන්තිය යටතේ ගොනු කරන ලද ගණන් බේරා වසා දැමීමේ පෙත්සමේ දිනයේ සිට මාස දෙකක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(4) 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් පෙත්සම තහවුරු කිරීම සඳහා දිනයක් නියම කිරීමට කැඳවන ලද දිනයේ සිට වැඩකරන දින දහහතරක් ඇතුළත, (3) වන උපවගන්තිය යටතේ ගණන් බේරා වසා දැමීමේ පෙත්සම තහවුරු කිරීම සඳහා නියම කරන ලද දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නිවේදනයෙන් (1) වන උපවගන්තිය යටතේ ගොනු කරන ලද ගණන් බේරා වසා දැමීමේ පෙත්සමට (මේ පනතේ "මැදිහත් වන පාර්ශ්වකරුවන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ශ්වකරුවන් ලෙස මැදිහත් වන්නේ ද යන්න ඒ නිවේදනයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘති පත්‍රයකින් සහ කාලසීමාවක් ඇතුළත තමා වෙත දැනුම් දෙන ලෙස ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ ණයහිමියන්ට හෝ වෙනත් යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයකට නියම කළ යුතු ය. එසේ දැනුම් දීම සඳහා මැදිහත් වන පාර්ශ්වකරුවන්ට දෙනු ලබන කාලසීමාව, ඒ ගැසට් පත්‍රයේ දිනයේ සිට දින දහහතරක් නොඉක්මවිය යුතු ය. මේ වගන්තිය යටතේ දැනුම් දීම් සිදු කළ මැදිහත් වන පාර්ශ්වකරුවන් පිළිබඳ විස්තර, ගණන් බේරා වසා දැමීමේ පෙත්සම තහවුරු කිරීම සඳහා නියම කරන ලද දිනයේ දී අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කිසිදු තැනැත්තකු ඒ පෙත්සම තහවුරු කරනු ලබන දිනයට පෙරාතුව ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතුවලට මැදිහත් නොවිය යුතු ය.

(6) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම සහ මැදිහත් වන පාර්ශ්වකරුවන්ගේ සැලකිරීම් සලකා බැලීමෙන් පසුව ඒ බලපත්‍රලාභී බැංකුවට එරෙහිව ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා (මේ පනතේ "ගණන් බේරා වසා දැමීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(7) ඒ ගණන් බේරා වසා දැමීමේ ආඥාව, ඒ ආඥාවේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(8) 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ මැදිහත් වන පාර්ශ්වකරුවන්ගේ සැලකිරීම් සලකා බැලීමෙන් පසුව, බලපත්‍රලාභී බැංකුව බුන්වත් නොවන බවට අධිකරණයේ මතය වන්නේ නම්, කොන්දේසි රහිතව හෝ මහජන යහපත හෝ බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ගේ හෝ වෙනත් ණයහිමියන්ගේ යහපත උදෙසා අධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලබන කොන්දේසිවලට යටත්ව, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට බලපත්‍රලාභී බැංකුවට අවසර දෙමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(9) ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වීමෙන් පසු ව, බලපත්‍රලාභී බැංකුවේ පොත්පත්වල හෝ වාර්තාවල වාර්තාගත කර ඇති ස්වකීය අයිතිවාසිකම්වලට, හිමිකම්වලට හෝ සම්බන්ධතාවලට ප්‍රවේශ වීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට යම් තැන්පත්කරුවකුට, ණයහිමියකුට හෝ යම් ගිවිසුම්කාර ප්‍රතිපාර්ශ්වයකට ඇති අයිතිවාසිකම වහාම අත්හිටුවනු ලැබිය යුතු ය.

(10) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක වත්කම් සහ වගකීම්වල වටිනාකම අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(11) මේ වගන්තිය යටතේ අධිකරණය විසින් කරනු ලබන සෑම ආඥාවක් ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කිරීමට යටත් විය යුතු අතර, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ අභියාචනයකට අදාළ විධිවිධාන ඒ යම් අභියාචනයක් සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

ඇවරකරුවකු පත් කිරීම

**68.** (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාව ප්‍රකාර ව, බලපත්‍රලාභී බැංකුවේ මෙහෙයුම් ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා, අධිකරණය විසින්, එය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා මහ බැංකුව විසින් නම් කරන ලද තැනැත්තකු ඇවරකරු ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඇවරකරු පත් කිරීමෙන් ඉක්බිතිව ම, මහ බැංකුව විසින්, ගණන් බේරා වසා දැමීමේ ආඥාව සහ (1) වන උපවගන්තිය යටතේ ඇවරකරු පත් කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුව වෙත දැන්වීමක් කරනු ලැබිය යුතු අතර, ඒ දැන්වීම ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු ය.

ඇවරකරුවකුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**69.** (1) 68 වන වගන්තිය යටතේ පත් කරන ලද ඇවරකරු ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ තනි නෛතික නියෝජිතයා විය යුතු අතර, බලපත්‍රලාභී බැංකුව කළමනාකරණය කිරීම, පාලනය කිරීම, මෙහෙයවීම සහ ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු බලතල ඇතුළුව, බලපත්‍රලාභී බැංකුවේ කොටස් හිමියන්ගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් නිලධරයන්ගේ සියලු අයිතිවාසිකම්වලට සහ බලතලවලට අනුප්‍රාප්ත විය යුතු ය:

එසේ වුව ද, ඇවරකරු විසින්, මහ බැංකුවේ එකඟත්වය ඇතිව, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ වත්කම් සහ වගකීම් සියල්ල ම හෝ ඉන් කොටසක් වෙනත් බලපත්‍රලාභී බැංකුවකට පැවරීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) ඇවරකරු විසින්, අධිකරණයේ සහ මහ බැංකුවේ විධානය සහ අධීක්ෂණය යටතේ ගණන් බේරා වසා දැමීමට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම, සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඇවරකරුට ලබා දෙන යම් විධානයක් මගින් ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය අතරතුර අධිකරණය විසින් දෙනු ලබන විධාන, ආඥා, නඩු තීන්දු සහ උපදෙස් උල්ලංඝනය නොවන බවට මහ බැංකුව විසින් වගබලා ගත යුතු ය.

(3) ඈවරකරු විසින් මහ බැංකුවේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ කාර්යාල, පොත්පත්, වාර්තා සහ වෙනත් තොරතුරු සහ වත්කම් සිය භාරයට ගනු ලැබිය යුතු ය.

(4) ඈවරකරුවකු විසින්, බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දැමීමට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටුකිරීමේ කාර්යය සඳහා, බලපත්‍රලාභී බැංකුවේ වියදමින්, ස්වාධීන නීතිඥවරුන්, ගණකාධිකාරීවරුන්, විගණකවරුන්, උපදේශකවරුන්, තක්සේරුකරුවන් හෝ වෙනත් එවැනි තැනැත්තන් සමඟ ලිඛිතව ගිවිසගනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, ඒ තැනැත්තන්ගේ සේවා ලබා ගත හැකි ය.

(5) මේ පනතේ මේ කොටස යටතේ වන ස්වකීය පෞද්ගලික වගකීම් සම්බන්ධයෙන්, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ දේපළවලින් හානිපූරණය කරගැනීමට ඈවරකරු හිමිකම් ලැබිය යුතු ය.

ඈවරකරුගේ පාරිශ්‍රමික

**70.** (1) ඈවරකරුට, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ වත්කම්වල වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි හෝ අධිකරණය විසින් අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලබන පාරිශ්‍රමිකය සහ බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලියේ දී ඈවරකරු විසින් දරන ලද සාධාරණ සහ ආනුෂංගික වියදම් ඒ බලපත්‍රලාභී බැංකුවේ පවත්නා වත්කම්වලින් ගෙවනු ලැබිය යුතු ය.

ඈවරකරු ඉවත් කිරීම

**71.** (1) ඈවරකරු-

(අ) මිය ගොස් ඇති හෝ ඈවරකරු ලෙස කටයුතු කිරීමට නොහැකි අශක්නුතාවකට පත්ව ඇති අවස්ථාවක;

(ආ) ඉල්ලා අස්වීමේ ලිපියක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක;

(ඇ) මහ බැංකුවේ මතය අනුව, ඒ ඈවරකරුගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම හෝ මේ පනතේ මේ කොටස යටතේ ඒ ඈවරකරු වෙත පනවන ලද නියමවලට සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති අවස්ථාවක; හෝ

(ඈ) වෙනත් යම් ආකාරයකින් ඒ තත්ත්වයෙහි කටයුතු කිරීමට නුසුදුස්සකු වූ අවස්ථාවක,

අධිකරණය විසින්, 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, ඈවරකරු ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ඈවරකරු ඉවත් කිරීමෙන් පසු ව, අධිකරණය විසින්, මහ බැංකුව විසින් නම් කරනු ලබන වෙනත් තැනැත්තකු ඈවරකරු ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඈවරකරු පත් කිරීමෙන් ඉක්බිතිව ම, මහ බැංකුව විසින්, අලුත් ඈවරකරු පත් කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුව වෙත දැන්වීමක් කරනු ලැබිය යුතු අතර, ඒ දැන්වීම ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු ය.

(4) 69 වන සහ 70 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද ඈවරකරු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඈවරකරු විසින් ගණන් බේරා වසා දැමීමේ සැලැස්මක් පිළියෙල කළ යුතු බව

**72.** (1) 67 වන වගන්තිය යටතේ කරන ලද ගණන් බේරා වසා දැමීමේ ආඥාවේ දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත, ඈවරකරු විසින්, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුව සඳහා වූ විස්තරාත්මක ගණන් බේරා වසා දැමීමේ සැලැස්මක් පිළියෙල කර, ඒ සැලැස්ම මහ බැංකුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති ගණන් බේරා වසා දැමීමේ සැලැස්මට -

(අ) බලපත්‍රලාභී බැංකුවේ වත්කම් සහ වගකීම් දැක්වෙන තත්කාලීන මූල්‍ය තත්ත්වය පිළිබඳ නාමමාත්‍ර ප්‍රකාශයක්;

(ආ) බලපත්‍රලාභී බැංකුවේ පෙරාතුව ම වූ වසර දෙකක කාලසීමාවේ ආදායම සහ වියදම පිළිබඳ සහ ඉක්බිතිව ම එළඹෙන වසර දෙකක කාලසීමාව සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම සහ වියදම පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශ;

(ඇ) බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන වත්කම් හෝ වත්කම් කාණ්ඩ විකිණීම සහ විකිණීම සඳහා වන සැලසුම් පිළිබඳ ප්‍රගති වාර්තාවක්;

(ඈ) වංචනිකව කරන ලද විකිණීම් ශුන්‍ය කිරීමට හෝ ඒවා අවලංගු බවට ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් සහ සිදුකරන ලද පැවරීම් සහ ඒවා මඟින් ඇතිකරන ලද අයිතිවාසිකම් ඇතුළුව, බලපත්‍රලාභී බැංකුවේ හිමිකම්පෑම් සම්බන්ධයෙන් වන අධිකරණ හෝ බහීර් අධිකරණ කටයුතු පිළිබඳ වාර්තාවක්;

(ඉ) බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ හෝ නිලධරයන්ගේ වැරදි සහ වෙනත් නීත්‍යනුකූල නොවන ක්‍රියාකාරකම් සහ ඒ අධ්‍යක්ෂවරුන්ගෙන් හෝ නිලධරයන්ගෙන් බලපත්‍රලාභී බැංකුවට වන්දි මුදල් ලබා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක්;

(ඊ) බලපත්‍රලාභී බැංකුවේ සේවානියුක්තයන් සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ද ඇතුළුව, රක්ෂණ, සේවානියුක්ති සහ සේවා ගිවිසුම් වැනි බලපත්‍රලාභී බැංකුවේ පවත්නා ගිවිසුම් තවදුරටත් පවත්වාගෙන යාම හෝ අවසන් කිරීම පිළිබඳ වාර්තාවක්;

(උ) බලපත්‍රලාභී බැංකුවේ වගකීම් පිළිබඳ වාර්තාවක් සහ ඉක්බිතිව ම එළඹෙන මාස තුනක කාලසීමාව තුළ බලපත්‍රලාභී බැංකුවේ ණයහිමියන්ට සිදු කිරීමට අපේක්ෂිත ගෙවීම් පිළිබඳ උපලේඛනයක්; සහ

(ඌ) පිළිවෙළින්, පෙරාතුව ම වූ වසර දෙකක කාලසීමාව සඳහා සහ ඉක්බිතිව ම එළඹෙන වසර දෙකක කාලසීමාව සඳහා සත්‍ය, අතීතයේ දරන ලද සහ ඇස්තමේන්තුගත අනාගත පිරිවැය සහ ගණන් බේරා වසා දැමීමේ වියදම් පිළිබඳ වාර්තාවක්,

ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ගණන් බේරා වසා දැමීමේ සැලැස්මේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් මහ බැංකුව සෑහීමට පත් වන්නේ නම්, මහ බැංකුව විසින්, ඒ සැලැස්ම අනුමත කර ඒ අනුමතය පිළිබඳව ඈවරකරු වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් ගණන් බේරා වසා දැමීමේ සැලැස්ම අනුමත කිරීමෙන් පසුව, ඈවරකරු විසින්, මහ බැංකුව විසින් දෙන ලද අනුමතය ද සමඟ ඒ ගණන් බේරා වසා දැමීමේ සැලැස්ම අනුමතය සඳහා අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) ගණන් බේරා වසා දැමීමේ සැලැස්ම සඳහා අධිකරණයේ අනුමතය ලැබීමෙන් පසුව, ඈවරකරු විසින්, ගණන් බේරා වසා දැමීමේ සැලැස්ම සහ එහි යාවත්කාලීන කිරීම්, 79 වන වගන්තිය යටතේ ස්වකීය ඉල්ලීම් ලියාපදිංචි කර ඇත්තා වූ, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ ඉල්ලුම්කරුවන්ට පරීක්ෂා කර බැලීම පිණිස තබනු ලබන දිනය සහ ස්ථානය පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතු දැන්වීමක්, යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් සතියට එක්වරක් බැගින් අනුගාමී සති තුනක් පළ කරනු ලැබිය යුතු ය.

(6) අධිකරණය විසින් අනුමත කරන ලද ගණන් බේරා වසා දැමීමේ සැලැස්ම ඈවරකරු විසින් ත්‍රෛමාසිකව යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

(7) ඈවරකරු විසින්, ගණන් බේරා වසා දැමීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඇතුළුව නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු අතර,

ඒවා 4 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ තත්කාර්යය සඳහා මහ බැංකුව විසින් බලය දෙන ලද යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවට විරුද්ධව නඩු කටයුතු පිළිබඳ තහනම

**73.** (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් ප්‍රකාරව බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් ගණන් බේරා වසාදැමීමේ නඩුකටයුතු ආරම්භ කරනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රලාභී බැංකුවට විරුද්ධව යම් අධිකරණ කටයුත්තක් ආරම්භ කරනු නොලැබිය යුතු අතර, ඒ බලපත්‍රලාභී බැංකුවට විරුද්ධව අවසන් නොවී පවතින සියලු අධිකරණ කටයුතු ඒ අධිකරණයේ අවසරය ඇතිව සහ ඒ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි නියමවලට යටත්ව වහාම නවත්වනු ලැබිය යුතු ය.

(2) ගණන් බේරා වසා දැමීමේ ආඥාව ප්‍රකාරව, සුරක්ෂිත ණයහිමියකු නොවන යම් ණයහිමියකුට ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවට එරෙහිව ඔහුගේ කවර හෝ පෞද්ගලික අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ක්‍රියාත්මක කිරීමට හෝ එහි වත්කම් මත වෙනත් යම් සීමා කිරීම් පැනවීමට හිමිකම නොතිබිය යුතු ය.

(3) ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වන දිනයට පසුව ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ වත්කම් සම්බන්ධයෙන් කරන ලද සියලු තහනම් කිරීම් සහ ඇස්කීසි ක්‍රියාත්මක කිරීම්, උගසක් හෝ ලියමක් මගින් පිළිබැඳුනු වත්කම් උපලබ්ධි කිරීමක දී හැර, ඒ වත්කම් මගින් සුරක්ෂිත කරන ලද ණයවල ප්‍රමාණයට බල රහිත විය යුතු ය.

(4) ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වන දිනයේ දී හෝ ඉන් පසුව බලපත්‍රලාභී බැංකුවක වගකීම් මත යම් පොලියක් හෝ වෙනත් ගාස්තුවක් උපචිත නොවිය යුතු ය.

ඇතැම් ක්‍රියා ශූන්‍ය කිරීම සඳහා ආඥාවක් කරන ලෙස ඇවරකරු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ යුතු බව

**74.** (1) ඇවරකරු විසින් මහ බැංකුව විමසා සහ ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවට දැන්වීමක් කිරීමෙන් පසුව, ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වන දිනයට පෙරාතුව වූ දින අනූවක කාලසීමාව ඇතුළත ඒ බලපත්‍රලාභී බැංකුව විසින් සිදුකරන ලද යම් ක්‍රියාවක් ඇතුළුව, එහෙත් ඊට සීමා නොවන, වෙනත් යම් ක්‍රියාවක් ශූන්‍ය සහ බලරහිත බවට ප්‍රකාශ කරන ලෙසට වූ ඉල්ලීමක් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව සහ ඒ ඉල්ලීමේ නම් සඳහන් කරන ලද පාර්ශ්වකරුවන්ගෙන් කරුණු විභාග කිරීමෙන් පසුව, ඒ ක්‍රියාව සිදු කරන ලද අවස්ථාවේ දී, ඒ ක්‍රියාව මගින් ඒ බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ගේ හෝ වෙනත් ණයහිමියන්ගේ බැඳියාවන්ට හානියක් සිදුවීමට ඉඩ ඇති බවට ඒ බලපත්‍රලාභී බැංකුවට සහ ඒ ක්‍රියාවට සම්බන්ධ වූ පාර්ශ්වකරුවන්ට දැනුමක් තිබුණු බවට හෝ දැනගත යුතු ව තිබුණු බවට අධිකරණය සෑහීමට පත්වේ නම්, අධිකරණය විසින්, ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වන දිනයට පෙරාතුව වූ දින අනූවක කාලසීමාව ඇතුළත සිදු කරන ලද ඒ ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ යම් ගනුදෙනුවක් ඇතුළුව, එහෙත් ඊට සීමා නොවන යම් ක්‍රියාවක් ශූන්‍ය සහ බලරහිත බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් දැනුම, ඒ ක්‍රියාව -

(අ) ප්‍රතිෂ්ඨාවක් නොමැතිව යම් තැනැත්තකුට ලබා දෙන ත්‍යාගයකින් හෝ වෙනත් පැවරීමකින්;

(ආ) ඒ බලපත්‍රලාභී බැංකුවේ හෝ ඒ බලපත්‍රලාභී බැංකුවේ කොටස් හිමියකුගේ, අධ්‍යක්ෂවරයකුගේ, අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තකුගේ හෝ සේවානියුක්තයකුගේ මුදල් ගෙවීමකින් හෝ වත්කම් හෝ වෙනත් යම් බැඳියාවන් පැවරීමකින් සමන්විත වන විට-

(i) ඒ තැනැත්තා සද්භාවී ප්‍රතිපාර්ශ්වකරුවකු ලෙස ඒ මුදල් ගෙවීම හෝ ඒ බලපත්‍රලාභී බැංකුවේ වත්කම් හෝ බැඳියාවන් පැවරීම කරන ලද බව;

(ii) බලපත්‍රලාභී බැංකුව විසින් තත්කාර්යය සඳහා කරන ලද කරුණු ඉදිරිපත් කිරීම් අනුව, අවස්ථාවෝචිත පරිදි, ඒ මුදල් ගෙවීම හෝ ඒ බලපත්‍රලාභී බැංකුවේ වත්කම් හෝ බැඳියාවන් පැවරීම සත්‍ය බව විශ්වාස කිරීමට ඒ තැනැත්තාට සාධාරණ හේතු තිබූ බව; සහ

(iii) ඒ මුදල් ගෙවීම හෝ ඒ බලපත්‍රලාභී බැංකුවේ වත්කම් හෝ බැඳියාවන් පැවරීම මගින් ඒ බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ බැඳියාවන්වලට හානිවනු ඇති බව ඒ තැනැත්තා නොදැන සිටි බව,

මහ බැංකුවේ අදහස් සැලකිල්ලට ගනිමින් අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් මිස, මුදල් ගෙවීමකින් හෝ ඒ බලපත්‍රලාභී බැංකුවේ, කොටස් හිමියාගේ, අධ්‍යක්ෂවරයාගේ, අද්මිනිස්ත්‍රාසිකරුවාගේ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තැනැත්තකුගේ හෝ සේවානියුක්තයාගේ වත්කම් හෝ වෙනත් යම් බැඳියාවන් පැවරීමකින්;

(ඈ) නියමිත දිනයට පෙරාතුව කරන ලද ගෙවීමකින් හෝ පැවරීමකින් හෝ ණයක් ගෙවිය යුතු බවට පත්වන දිනයට පෙරාතුව ඒ ණය සඳහා වන සමපාර්ශ්වීය සුරැකුමක් පැවරීමකින්;

(ඇ) ගිවිසුමේ අනෙක් පාර්ශ්වයට හෝ පාර්ශ්වකරුවන්ට පනවන ලද බැඳීම්වලට වඩා සැලකිය යුතු තරම් භාරදූර බැඳීම් බලපත්‍රලාභී බැංකුව මත පනවන ගිවිසුමක් අවසන් කිරීමකින් හෝ ඉටු කිරීමකින්;

(ඉ) ගණන් බේරා වසා දැමීමේ ආඥාව නිකුත් කිරීමට පෙරාතුව බලපත්‍රලාභී බැංකුවේ අයිතිවාසිකම් සහ බැඳීම් හිලව් කිරීමට අවසර දෙන මූල්‍යමය ගිවිසුමක් නොවන බලපත්‍රලාභී බැංකුව සහ වෙනත් එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් අතර වූ වැඩපිළිවෙළකින්;

(ඊ) බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකුවක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇත්තා වූ ඒ බැංකුවේ ප්‍රධාන කාර්යාලය, ශාඛා සහ පාලිත සමාගම් අතර වූ අන්තර් බැංකු පැවරීමකින්; හෝ

(ඌ) බලපත්‍රලාභී බැංකුවක් සහ එහි සම්බන්ධිත පාර්ශ්වකරුවන් අතර පැවරීමකින්,

සමන්විත වන කවර හෝ අවස්ථාවක, පූර්වානුමාන කරනු ලැබිය යුතු ය.

පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් ඉටුකරන කර්තව්‍ය අවසන් කිරීම

**75.** ඇවරකරු විසින් -

(අ) පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් බලපත්‍රලාභී බැංකුව විසින් ඉටු කරන සියලු කර්තව්‍ය නැවැත්වීමට සහ අවසන් කිරීමට;

(ආ) පීත කොමිස් භාරකාර තත්ත්වයෙන් හෝ උපනිධානයක් යටතේ හෝ ආරක්ෂිත තැන්පතු පෙට්ටියක උපනිධායකයකු ලෙස බලපත්‍රලාභී බැංකුවක් විසින් දරන සියලු අරමුදල් සහ වෙනත් දේපළ, අවස්ථාවෝචිත පරිදි, ඒ අරමුදල්වල හෝ දේපළවල අයිතියට නීත්‍යනුකූලව හිමිකම් ඇති තැනැත්තන්ට හෝ ඔවුන්ගේ නීත්‍යනුකූල උරුමකරුවන්ට හෝ අනුයෝජිතයන්ට ආපසු ලබා දීමට; සහ

(ඇ) බලපත්‍රලාභී බැංකුවේ පීත කොමිස් භාරකාර ගිණුම් පියවීමට,

ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් පියවර ගත යුතු ය.

පවත්නා ගිවිසුම් අවසන් කිරීම

**76.** (1) ගණන් බේරා වසා දැමීමේ ආඥාවේ දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත, අධිකරණයේ අනුමතය ඇතිව සහ දින අනූවක පූර්ව ලිඛිත දැන්වීමක් නිකුත් කිරීමට යටත්ව සහ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත් ව, ඇවරකරු විසින් -

(අ) ඒ බලපත්‍රලාභී බැංකුව සමඟ ඇතුළත් වී ඇති යම් සේවානියුක්ති ගිවිසුමක්;

(ආ) ඒ බලපත්‍රලාභී බැංකුව පාර්ශ්වයක් වන යම් සේවාවන් සඳහා වූ ගිවිසුමක්; හෝ

(ඇ) (i) බලපත්‍රලාභී බැංකුව විසින් සපයනු ලබන යම් ණය පහසුකමක් යටතේ;

(ii) බදු ගැනුම්කරුවකු වශයෙන්;

(iii) සුරැකුම්පත්, ගෙවීම් සාධන පත්‍ර හෝ විදේශීය ව්‍යවහාර මුදල් භාර දීම හෝ භාර ගැනීම සඳහා;

(iv) ණයවර ලිපි යටතේ: හෝ

(v) ඇපකර, මනාප සහ වෙනත් සම්භාවී වගකීම් යටතේ,

වන යම් වගකීම් ඇතොත් ඒ වගකීම් ද ඇතුළුව, එහෙත් ඊට සීමා නොවන බලපත්‍රලාභී බැංකුවේ යම් වගකීම්,

අවසන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ බද්දක් අවසන් කිරීම පිළිබඳව දින අනුවක පූර්ව දැන්වීමක් ලැබී ඇති බදු දීමනාකරුවකුට, බද්ද අවසන් කරන දිනය තෙක් උපචිත වූ බදු කුලිය හැර වෙනත් කිසිදු බදු කුලියක් සඳහා හෝ ඒ අවසන් කිරීම හේතුකොට ගෙන වන අලාභ සඳහා හෝ ඉල්ලීමක් නොතිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අනුමතය දීම සඳහා වූ අධිකරණයේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකුට, ඒ උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමේ දිනයේ සිට දින හතළිස්පහක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකි අතර, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ අභියාචනයට සහ ඒ අභියාචනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ගෙවීම්, නිශ්කාෂණ සහ පියවීමේ පද්ධතිවල අවසානාත්මක භාවය

**77.** (1) මේ පනතේ හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක ඇතුළත් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද-

(අ) මහ බැංකුව විසින් ගෙවීම් හෝ සුරැකුම්පත් පියවීමේ පද්ධතියක් වශයෙන් පිළිගත් ගෙවීම් හෝ සුරැකුම්පත් පියවීමේ පද්ධතියකට බලපත්‍රලාභී බැංකුවක් විසින් ඇතුළත් කරන ලද යම් අවලංගු කළ නොහැකි මුදල් හෝ

සුරැකුම්පත් පැවරුම් අණකරයක්, ඒ පැවරුම් අණකරය ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වීමට පෙරාතුව අවලංගු කළ නොහැකි බවට පත් වී ඇත්නම්, ඒ බලපත්‍රලාභී බැංකුවට එරෙහිව ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් නිකුත් කිරීම නොතකා, නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි විය යුතු අතර, තුන්වන පාර්ශ්ව විෂයයෙහි අනුගම්‍ය විය යුතු ය; හෝ

(ආ) බලපත්‍රලාභී බැංකුවකට එරෙහිව නිකුත් කරන ලද ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මක වීමෙන් පසුව ඒ බලපත්‍රලාභී බැංකුව විසින් ගෙවීම් හෝ සුරැකුම්පත් පියවීමේ පද්ධතියකට යම් අවලංගු කළ නොහැකි මුදල් හෝ සුරැකුම්පත් පැවරුම් අණකරයක් ඇතුළත් කරන අවස්ථාවක දී, සහ ඒ ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මකභාවයට පැමිණෙන දිනයේ දී ඒ පැවරුම් අණකරය ක්‍රියාත්මක කරන අවස්ථාවක දී ඒ පැවරුම් අණකරය නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි විය යුතු අතර, ඕනෑම තුන්වන පාර්ශ්වයක් විෂයයෙහි අනුගම්‍ය විය යුතු ය.

(2) ගණන් බේරා වසා දැමීමේ ආඥාව බලාත්මකභාවයට පැමිණීමට පෙරාතුව ඇතුළත් වූ හෝ ඇති කරගන්නා ලද, ගිවිසුම් සහ ගනුදෙනු ඉවත් කිරීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක්, මහ බැංකුව විසින් පිළිගත් ගෙවීම් හෝ පියවීමේ පද්ධතියක් මගින් ශුද්ධ අගය තීරණය කිරීම ආපසු හැරවීම සම්බන්ධයෙන් බල නොපෑ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ) ගෙවීම් හෝ සුරැකුම්පත් පියවීමේ පද්ධතියකට ඇතුළත් කරන ලද පැවරුම් අණකරයක් ඒ පද්ධතියට අදාළ නීති, රීති හෝ නියෝග මගින් අර්ථ නිරූපණය කර ඇති වේලාවේ දී අවලංගු කළ නොහැකි බවට පත් වන්නේ ය; සහ

(ආ) "ශුද්ධ අගය තීරණය කිරීම" යන්නෙන්, ප්‍රතිඵලය ලෙස ශුද්ධ ඉල්ලීමක් හෝ ශුද්ධ වගකීමක් පමණක් ඉතිරි වන,

පියවීමේ පද්ධතියක සහභාගීකරුවකු හෝ සහභාගීකරුවන් විසින් ඒ පද්ධතියේ වෙනත් එක් සහභාගීකරුවකුට හෝ ඊට වැඩි සහභාගීකරුවන් ගණනකට නිකුත් කරන හෝ වෙනත් එක් සහභාගීකරුවකුගෙන් හෝ ඊට වැඩි සහභාගීකරුවන් ගණනකගෙන් ලබාගන්නා පැවරුම් අණකරවලින් පැන නගින සියලු ඉල්ලීම් හෝ වගකීම් එක් ශුද්ධ ඉල්ලීමක් හෝ එක් ශුද්ධ වගකීමක් බවට පරිවර්තනය කිරීම අදහස් වේ.

ඈවරකරු විසින් වාර්තා භාරදිය යුතු බව

**78.** (1) 69 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කවර වූ හෝ ආකාරයකින් වත්කම්, පොත්පත්, වාර්තා සහ වෙනත් තොරතුරු ඈවරකරු විසින් සිය භාරයට ගත් දිනයේ සිට මාස එකක් ඇතුළත ඈවරකරු විසින් ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ සියලු වත්කම්, හිමිකම්පෑම් ගිවිසුම් සහ ප්‍රධාන ගනුදෙනු අන්තර්ගත කරමින් අතුරු වාර්තාවක් මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ වත්කම් සහ වගකීම් හඳුනා ගැනීමට අවශ්‍ය විය හැකි, මහ බැංකුව විසින් බලය දෙන ලද යම් නිලධරයකු භාරයේ පවතින ඒ බලපත්‍රලාභී බැංකුවේ වත්කම් සහ වගකීම් පිළිබඳ යම් තොරතුරු, ඒ බලයලත් නිලධරයා විසින් ඈවරකරු වෙත ඉදිරිපත් කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ දක්වා ඇති අතුරු වාර්තාවේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත, ඈවරකරු විසින්-

(අ) වත්කම්වල පොත්වල වටිනාකම් සහ ඒවායේ ඇස්තමේන්තුගත ඈවර කිරීමේ වටිනාකම් ද සමඟ බලපත්‍රලාභී බැංකුවේ කොටස් ප්‍රාග්ධනයේ නොගෙවූ දායක මුදල් හා සම්බන්ධ හිමිකම් පෑම්, ණය සහ ඇපකර ගිවිසුම් සහ මිල දී ගැනීමේ හෝ විකිණීමේ ගිවිසුම් ඇතුළුව බලපත්‍රලාභී බැංකුවේ සියලු වත්කම්;

(ආ) ගණන් බේරා වසා දැමීමේ ආඥාවේ දිනයට පෙරාතුව ම වූ දින අනූවක කාලසීමාව තුළ දී බලපත්‍රලාභී බැංකුව විසින් ඇතුළත් වූ ප්‍රධාන ගනුදෙනු;

(ඈ) විකුණුම්, කුලී, බදු සහ එවැනි වෙනත් සමපාර්ශ්වීය සුරැකුම් පිළිබඳ ගිවිසුම් ඇතුළුව, බලපත්‍රලාභී බැංකුවේ යම් දේපළ වෙනත් පාර්ශ්වයන් විසින් දරන්නේ හෝ දැරිය හැක්කේ යම් ගිවිසුම් ප්‍රකාරව ද, ඒ ගිවිසුම්; සහ

(ඈ) බලපත්‍රලාභී බැංකුව තෙවන පාර්ශ්වවලින් සේවා ලබාගන්නේ යම් ගිවිසුම් ප්‍රකාරව ද, ඒ ගිවිසුම්,

පිළිබඳ අවසාන වාර්තාවක් මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමෙන් දින දහහතරක් ඇතුළත මහ බැංකුව විසින් ඊට අනුමතය දීම හෝ ඈවරකරු විමසා එය තවදුරටත් දියුණු කිරීම කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් අනුමත කරන ලද අවසාන වාර්තාවේ සහතික කළ පිටපතක් ඈවරකරු විසින් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.

(6) ඈවරකරු විසින් (5) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉදිරිපත් කළ වාර්තාව මහ බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි කාලීනව යාවත්කාලීන කර මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ යාවත්කාලීන කරන ලද වාර්තාව සම්බන්ධයෙන් (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

හිමිකම්පෑම් ලියාපදිංචි කිරීම

**79.** (1) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් සම්බන්ධයෙන් වූ යම් හිමිකම්පෑමක් ගණන් බේරා වසා දැමීමේ ආඥාවේ දිනයේ සිට මාස හතරක් ඇතුළත ඈවරකරු වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් හිමිකම්පෑමක්, අවම වශයෙන් පහත දැක්වෙන තොරතුරු ඇතුළුව, ඒ හිමිකම්පෑමට අදාළ ලේඛනගත සාක්ෂි සමඟ ඉදිරිපත් කළ යුතු ය :-

(අ) ණයහිමියාගේ නම සහ ලිපිනය;

(ආ) හිමිකම්පෑමේ මුල් මුදලේ ඇතුළත් කරන ලද පොලිය සහ වෙනත් ගාස්තු, දණ්ඩන සහ බදු මුදල් ප්‍රමාණ ඇතුළුව හිමිකම්පෑමේ ස්වභාවය; සහ

(ඇ) යම් ඇපකරුවකුගේ නම සහ ලිපිනය ඇතුළුව, හිමිකම්පෑම සුරක්ෂිත කරන යම් උකසක්, ලියමක් හෝ ඇපයක් පිළිබඳ තොරතුරු.

(3) 80 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඇවරකරු විසින් (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද එක් එක් හිමිකම්පෑම ලියාපදිංචි කර, ඒ ලියාපදිංචි කිරීම සනාථ කිරීම සඳහා, මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් ආකෘතියකින් රිසිට්පතක් නිකුත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දක්වා ඇති රිසිට්පත, හිමිකම්පෑමක් ලියාපදිංචි කිරීම පිළිබඳව බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(5) මේ වගන්තියේ ඇතුළත් කිසිවක්, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක පොත්වල හෝ වාර්තාවල සටහන් කර ඇති තැන්පතුවක් සම්බන්ධයෙන් තැන්පත්කරුවකු විසින් භාරදෙන ලද යම් හිමිකම්පෑමක් සඳහා අදාළ නොවිය යුතු අතර, ගණන් බේරා වසා දැමීමේ ආඥාවට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා ඒ හිමිකම්පෑම එසේ සටහන් කර ඇති මුදල සඳහා ආවේශ්‍ය කර ගත යුතු ය.

හිමිකම්පෑම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම

**80.** (1) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ඇවරකරු වෙත ලියාපදිංචි කරන ලද හිමිකම්පෑම් පමණක්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර සාක්ෂි නොමැතිව, බලපත්‍රලාභී බැංකුවක ගණන් බේරා වසා දැමීමේ කටයුතුවලට බලාත්මකභාවයක් ලබාදීමේ කාර්යය සඳහා ඇවරකරු විසින් සලකා බලනු ලැබිය යුතු ය.

(2) උකසකින් හෝ ලියමකින් සුරක්ෂිත කරන ලද හිමිකම්පෑමක් ඇති බලපත්‍රලාභී බැංකුවේ යම් ණයහිමියකු විසින්, ඒ ඉල්ලීම 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින් නිශ්චය

කරනු ලැබිය හැකි පරිදි වූ, ප්‍රසිද්ධ වෙන්දේසියක දී ඒ වත්කම විකිණිය හැකි අපේක්ෂිත වටිනාකම ඉක්මවන මුදලක් සඳහා හෝ වෙළෙඳපොළ වටිනාකමට ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලබන හිමිකම්පෑමක් ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමෙන් පසුව පමණක් ඈවරකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

(4) වටිනාකම අවිනිශ්චිත වූ යම් හිමිකම්පෑමක්, 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විමසා, ඈවරකරු විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ වටිනාකමක් සඳහා ඈවරකරු විසින් පිළිගනු ලැබිය හැකි ය.

(5) ඈවරකරු විසින් 79 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද එක් එක් හිමිකම්පෑම පරීක්ෂා කර බැලීමෙන් පසුව, ඒ හිමිකම්පෑම් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලැබිය යුතු ය :-

(අ) ඈවරකරු විසින් පිළිගත් හිමිකම්පෑම්; සහ

(ආ) ඈවරකරු විසින් ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම්.

(6) ඈවරකරු විසින්, (5) වන උපවගන්තිය යටතේ වර්ගීකරණය කරන ලද හිමිකම්පෑම් සටහන් කිරීමේ කාර්යය සඳහා, වෙන් වෙන් වශයෙන් ලැයිස්තු දෙකක් පවත්වා ගෙන යා යුතු ය. (5) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම්පෑම් සම්බන්ධයෙන්, ඒ හිමිකම්පෑම් ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් ලෙස වර්ගීකරණය කිරීම සඳහා වූ හේතු ඈවරකරු විසින් ඒ ලැයිස්තුවේ සටහන් කළ යුතු ය.

(7) (6) වන උපවගන්තියේ දක්වා ඇති ලැයිස්තු දෙකෙහි ම -

(අ) එක් එක් හිමිකම්පාන්නා සම්බන්ධයෙන්, නම සහ ලිපිනය, හිමිකම්පාන මුදල, ඒ හිමිකම්පෑම සමපාර්ශ්වීය සුරැකුම් මගින් සුරක්ෂිත කෙරෙන්නේ ද යන්න නිශ්චිතව සඳහන් කළ යුතු ය; සහ

(ආ) සමාන ශ්‍රේණිවල හිමිකම්පෑම්, ඒවා ගෙවීමේ ප්‍රමුඛතාවේ අනුපිළිවෙළ අනුව එකට ලැයිස්තුගත කළ යුතු ය.

(8) (6) වන උපවගන්තියේ සඳහන් ලැයිස්තු දෙක ම, හිමිකම්පෑම් ලියාපදිංචි කිරීමේ අවසාන දිනය ලෙස නිශ්චිතව සඳහන් කර ඇති දිනයේ සිට වැඩ කරන දින තිහක කාලසීමාවක් ඇතුළත සම්පූර්ණ කොට අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(9) ඇවරකරු විසින් (6) වන උපවගන්තියේ දක්වා ඇති ලැයිස්තුවල පළමු කට්ටලය භාර දීමෙන් පසුව ඒ වාර්තා කාලීනව යාවත්කාලීන කළ යුතු අතර, අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ යම් කාලවල දී ඒ යාවත්කාලීන කරන ලද ලැයිස්තු අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(10) ඇවරකරු විසින්, (5) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම්පෑම්වල සෑම හිමිකම්පාන්නකුට ම ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව 79 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වූ රිසිට්පත නිකුත් කිරීමේ දිනයේ සිට මාස එකක කාලසීමාවක් ඇතුළත ලිඛිතව දැනුම් දිය යුතු ය.

ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම්වලට එරෙහි අභියාචනා

**81.** (1) 80 වන වගන්තියේ විධිවිධාන යටතේ හිමිකම්පෑම ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් යම් හිමිකම්පාන්නකු විසින්, 80 වන වගන්තියේ (10) වන උපවගන්තිය යටතේ වූ දැන්වීම ලැබුණු දිනයේ සිට මාස එකක කාලසීමාවක් ඇතුළත ඒ හිමිකම්පෑම පිළිගන්නා ලෙසට වූ ආඥාවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, ඒ හිමිකම්පෑම පිළිගනිමින් හෝ ප්‍රතික්ෂේප කරමින් ආඥාවක් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් පිළිගත් යම් හිමිකම්පෑමක්, 80 වන වගන්තියේ (6) වන උපවගන්තියේ දක්වා ඇති ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් සටහන් කරන ලද ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, එවැනි සෑම හිමිකම්පෑමක් ම අධිකරණය සහ ඇවරකරු විසින් එක්ව පවත්වාගෙන යා යුතු, වෙනම පිළිගත් හිමිකම්පෑම් ලැයිස්තුවක සටහන් කළ යුතු ය.

(4) අධිකරණය විසින් ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් වෙනුවෙන් ඇවරකරු විසින් කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතු ය.

(5) අධිකරණය විසින් ප්‍රතික්ෂේප කළ යම් හිමිකම්පෑමක හිමිකම්පාන්නා විසින් ඒ තීරණයේ දිනයේ සිට දින හතළිස්පහක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකි අතර, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ අභියාචනාවලට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඒ අභියාචනයට සහ ඒ අභියාචනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ගණන් බේරා වසා දැමීමේ දී, වත්කම්, වගකීම් හෝ කොටස් ආදිය බැහැර කිරීම

**82.** 84 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඇවරකරු විසින් මහ බැංකුවේ එකඟත්වය ඇතිව සහ අධිකරණයේ අනුමතය ඇතිව, මේ පනතේ මේ කොටස යටතේ ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමෙන් පසුව බලපත්‍රලාභී බැංකුවේ වත්කම්, වගකීම්, නීත්‍යනුකූල අයිතිවාසිකම් සහ වගකීම් හෝ යම් දේපළ සියල්ල ම හෝ ඉන් යම් කොටසක් බැහැර කළ හැකි ය.

හිලව් කිරීම සහ ශුද්ධ අගය තීරණය කිරීම

**83.** (1) මේ පනතේ විධිවිධානවල ඇතුළත් කිසිවක් මගින් සහ ඒ යටතේ ගනු ලැබූ යම් තීරණයක් මගින් ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් සහ එහි ගිවිසුම්ගත ප්‍රතිපාර්ශ්වකරුවන් අතර වූ වගකීම් හිලව් කිරීම, නීතිය ක්‍රියාත්මක වීම හේතුවෙන් වැළැක්වීම හෝ තහනම් කිරීම සිදු නොවිය යුතු ය.

(2) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් සහ එහි ගිවිසුම්ගත ප්‍රතිපාර්ශ්වකරුවන් අතර අයිතිවාසිකම් සහ වගකීම් තීරණය කිරීමේ දී, ඒ බලපත්‍රලාභී බැංකුව සහ අදාළ ගිවිසුම්ගත ප්‍රතිපාර්ශ්වකරුවන් අතර වූ මූල්‍යමය ගිවිසුම්වල ඇතුළත් අවසානාත්මක ශුද්ධ අගය තීරණය කිරීමේ සහ හිලව් කිරීමේ විධිවිධාන සැලකිල්ලට ගත යුතු ය.

(3) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුව සහ අදාළ ගිවිසුම්ගත ප්‍රතිපාර්ශ්වය අතර වූ මූල්‍යමය ගිවිසුමට අනුකූලව තීරණය කරන ලද ශුද්ධ සමාපන අගය ඒ ප්‍රතිපාර්ශ්වය විෂයයෙහි ඒ බලපත්‍රලාභී බැංකුවේ හිමිකම්පෑමක් විය යුතු ය; නැතහොත් එය ලියාපදිංචි කිරීමෙන් පසුව 79 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ බලපත්‍රලාභී බැංකුව විෂයයෙහි ප්‍රතිපාර්ශ්වයේ හිමිකම්පෑමක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, "ශුද්ධ සමාපන අගය" යන්නෙන්, මූල්‍යමය ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර වූ අන්‍යෝන්‍ය වගකීම්, ඒ ගිවිසුමේ නියමවලට සහ කොන්දේසිවලට අනුකූලව හිලව් කිරීමෙන් පසුව ලබාගත් ශුද්ධ අගය අදහස් වේ.

(5) මහ බැංකුව විසින්, කලින් කලට, විධාන නිකුත් කිරීම මගින් මූල්‍යමය ගිවිසුම් ද ඇතුළුව, හිලව් කිරීමට සහ ශුද්ධ අගය තීරණය කිරීමට අදාළ කාරණා නිශ්චිතව සඳහන් කළ යුතු ය.

ගණන් බේරා වසා දැමීමක දී වත්කම් විකිණීම

**84.** (1) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවකට එරෙහි සුරක්ෂිත ණයහිමියන්ගේ අනුමත හිමිකම්පෑම් සුරක්ෂිත කරන වත්කම් හැර, ඒ බලපත්‍රලාභී බැංකුවේ සියලු වත්කම් සහ ඒ බලපත්‍රලාභී බැංකුවේ හිමිකම්පෑම් සුරක්ෂිත කරන සියලු වත්කම් ඈවරකරු විසින් වාණිජමය වශයෙන් සාධාරණ ආකාරයකට විකුණනු ලැබිය යුතු ය.

(2) සමපාර්ශ්වීය සුරැකුම් ඇතුළු වත්කම් පහත දැක්වෙන පරිදි බැහැර කරනු ලබන විටෙක දී, ඒ වත්කම් (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි වාණිජමය වශයෙන් සාධාරණ ආකාරයකට විකුණනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය:-

(අ) සුරැකුම්පත්, විදේශීය ව්‍යවහාර මුදල් සහ පහසුවෙන් විකිණිය හැකි වෙනත් වත්කම්, ඒවා අලෙවි කරනු ලබන වෙළෙඳපොළවල දී වෙළෙඳපොළ මිලට විකුණනු ලබන විට; සහ

(ආ) ඒ වත්කම් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකුණනු ලබන විට:

එසේ වුව ද, ප්‍රසිද්ධ වෙන්දේසියක දී, වත්කම් සඳහා සාධාරණ මිලක් ලබාගත නොහැකි බවට ඈවරකරු විසින් නිශ්චය කරන්නේ නම්, ඈවරකරු විසින් වත්කම් පෞද්ගලිකව විකිණීම සඳහා අධිකරණයේ අනුමතය ඉල්ලා සිටිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ දක්වා ඇති වත්කම් හැර ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක වත්කම්,

ඇවරකරුගේ ඉල්ලීමකින් පසුව, වහාම සුදුස්සක් කිරීම පිණිස ඇවරකරු භාරයට පත් කරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලීමක් සුරක්ෂිත කරන වත්කමක වටිනාකම සම්බන්ධයෙන් ඇවරකරු සහ සුරක්ෂිත ණයහිමියකු අතර ඇති වන යම් ආරාවුලක්, ඒ වත්කම, අවස්ථාවෝචිත පරිදි, 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන වෘත්තීමය තක්සේරුකරුවකු විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ වෙළෙඳපොළ වටිනාකමට හෝ ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකුණනු ලබන්නේ නම් මිස, මහ බැංකුව විසින් නිරාකරණය කළ යුතු අතර, එහි දී ඒ වෙළෙඳපොළ වටිනාකම හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ දී තීරණය වූ විකුණුම් මිල, වත්කමේ වටිනාකම සම්බන්ධයෙන් තීරණාත්මක විය යුතු ය.

ගණන් බේරා වසා දැමීමක දී වත්කම් බෙදාහැරීම සඳහා වූ ඉල්ලීම්වල ප්‍රමුඛතාව

**85.** (1) ඇවරකරු විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලීම්වල ප්‍රමුඛතාවට අනුකූලව ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක වත්කම් බෙදාහැරිය යුතු ය.

(2) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක වත්කම්, පහත දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙළට බෙදාහරිනු ලැබිය යුතු ය :-

(අ) බුන්වත්භාවය පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ඇවරකරු විසින් දරන ලද සියලු සාධාරණ පිරිවැය සහ වියදම්;

(ආ) තැන්පතු රක්ෂණ අරමුදලට අයවිය යුතු නොගෙවූ වාරික මුදල්;

(ඇ) රක්ෂිත තැන්පතු සහ වන්දි ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙස 45 වන වගන්තිය යටතේ රක්ෂිත තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ප්‍රතිනිවේශනය කිරීමේ දී හෝ 51 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති නිරාකරණ මුල්‍යනයක ප්‍රතිඵලයක් ලෙස පැනනගින රක්ෂිත තැන්පතු සහ තැන්පතු රක්ෂණ අරමුදලේ හිමිකම්පෑම්;

(ඇ) 44 වන වගන්තිය යටතේ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන රක්ෂිත සීමාවට වඩා වැඩි තැන්පතු;

(ඉ) 67 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ කරන ලද ගණන් බේරා වසා දැමීමේ ආඥාවේ දිනයට උපචිත වූ බලපත්‍රලාභී බැංකුවේ නිලධරයන්ගේ සහ වෙනත් සේවානියුක්තයන්ගේ වැටුප් සහ වේතන;

(ඊ) මේ පනත යටතේ වූ නිරාකරණයක් මූල්‍යනය කිරීම වෙනුවෙන් ආණ්ඩුවට අයවිය යුතු මුදල්;

(උ) 67 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ කරන ලද ගණන් බේරා වසා දැමීමේ ආඥාවේ දිනයට පෙරාතුව ම වූ එක් වසරකට නොවැඩි කාලසීමාවක් තිස්සේ නොගෙවා ඇති, බලපත්‍රලාභී බැංකුවෙන් ආණ්ඩුවට සහ පළාත් පාලන ආයතනවලට අයවිය යුතු බදු, වරිපනම් සහ තැන්පතු;

(ඌ) බලපත්‍රලාභී බැංකුවේ යම් නිලධරයකුට හෝ වෙනත් සේවානියුක්තයකුට හෝ යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු වෙනුවෙන් ගෙවිය යුතු කාර්මික අධිකරණ ප්‍රදාන සහ වෙනත් යම් ව්‍යවස්ථාපිත අයවීම්;

(එ) නිරාකරණය සම්බන්ධයෙන් වන බලපත්‍රලාභී බැංකුවේ වගකීම් සහ මහ බැංකුවට සහ තැන්පතු රක්ෂණ අරමුදලට ලැබිය යුතු සහ අයවිය යුතු වෙනත් යම් වගකීම්;

(ඒ) තැන්පත්කරුවන් හැර සුරක්ෂිත නොකළ ණයහිමියන්ගේ හිමිකම් පෑම්;

(ක) මේ උපවගන්තියේ (අ) වන ඡේදයේ සිට (ඒ) වන ඡේදය දක්වා වූ ඡේද යටතේ නොගෙවන ලද වෙනත් යම් හිමිකම්පෑමක්.

ගණන් බේරා වසා දැමීමක දී ගෙවීම් බෙදාහැරීමේ උපලේඛනය

**86.** (1) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක තැන්පත්කරුවන්ට හෝ වෙනත් ණයහිමියන්ට ඔවුන්ගේ ඉල්ලීම් සඳහා ගෙවීමේ දී මහ බැංකුව විසින් අනුමත කරන ලද බෙදාහැරීමේ උපලේඛනයක ලැයිස්තුගත කළ මුදල් ප්‍රමාණ සඳහා පමණක් ගෙවීම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා 80 වන සහ 81 වන වගන්ති යටතේ පිළිගත් හිමිකම්පෑම්වලින් සමන්විත, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ට සහ වෙනත් ණයහිමියන්ට කළ යුතු ගෙවීම් පිළිබඳ බෙදාහැරීමේ උපලේඛනයක් ඇවරකරු විසින් පිළියෙල කර, එය මහ බැංකුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(3) එක් එක් ගෙවීම් පිළිබඳ බෙදාහැරීමේ උපලේඛනවල-

(අ) ඇතුළත් කළ යුතු හිමිකම්පෑම්වලට වඩා ඉහළ ප්‍රමුඛතා ශ්‍රේණියක අනුමත කළ හිමිකම්පෑම් වෙනුවෙන් ගෙවිය යුතු සියලු ගෙවීම් ඊට පෙර වූ ගෙවීම් පිළිබඳ බෙදාහැරීමේ උපලේඛනයක් යටතේ සම්පූර්ණයෙන් ගෙවනු ලැබ ඇත්නම්, හෝ මෙම ගෙවීම් පිළිබඳ බෙදාහැරීමේ උපලේඛනය යටතේ සම්පූර්ණයෙන් ම ගෙවනු ලැබිය හැකි නම් පමණක්; සහ

(ආ) ඇතුළත් කළ යුතු සහ මෙතෙක් අනුමත කර නොමැති හිමිකම්පෑම්වලට වඩා ඉහළ ප්‍රමුඛතා ශ්‍රේණියක හිමිකම්පෑම් සම්පූර්ණයෙන් ගෙවීම සඳහා සහ ඇතුළත් කළ යුතු සහ මෙතෙක් අනුමත කර නොමැති හිමිකම්පෑම්වලට සමාන ප්‍රමුඛතා ශ්‍රේණියක හිමිකම්පෑම්වලට සමාන සැලකීමක් සහතික කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කරනු ලැබ ඇත්නම් පමණක්,

85 වන වගන්තියේ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති පරිදි ඒවායේ ගෙවීමේ ප්‍රමුඛතාවට අනුකූලව අනුමත කළ හිමිකම්පෑම් වෙනුවෙන් කළ යුතු ගෙවීම් ශ්‍රේණිගත කර ඒකාබද්ධ කිරීම කළ යුතු ය.

(4) පවතින අරමුදල් යම් ප්‍රමුඛතා ශ්‍රේණියක ඇති සියලු හිමිකම්පෑම් සම්පූර්ණයෙන් ම පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, ඒ අරමුදල් ප්‍රමාණය ඒ හිමිකම්පෑම් වෙනුවෙන් වූ ගෙවීම් අතරෙහි සමානුපාතිකව බෙදාහැරිය යුතු අතර, පළමුව සඳහන් කළ හිමිකම්පෑම් වෙනුවෙන් ඒ ගෙවීම සම්පූර්ණයෙන් ම ගෙවීමට හැකි නම් මිස පහළ ප්‍රමුඛතා ශ්‍රේණියක හිමිකම්පෑම් වෙනුවෙන් වූ ගෙවීම් සඳහා කිසිදු අරමුදල් ප්‍රමාණයක් වෙන් කරනු නොලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ගෙවීම් පිළිබඳ බෙදාහැරීමේ උපලේඛනයක් මහ බැංකුව විසින් අනුමත කිරීමෙන් ඉක්බිතිවම, ඈවරකරු විසින්, අනුමත කළ හිමිකම්පෑම්වලට හිමිකම් ලබන තැනැත්තන්ට ගෙවීම් ලබාගත හැක්කේ කවර දිනයක සහ කිනම් ස්ථානයක දී ද යන්න හෝ හිමිකම් ලබන තැනැත්තන්ට ඒ බෙදාහැරීමේ උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති ගෙවීම් ලබාගත හැකි වෙනත් යම් ආකාරයක් පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් දැන්වීමක් යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් අනුක්‍රමික සති තුනක් සතියකට එක් වරක් පළ කළ යුතු ය.

(6) බෙදාහැරීමේ උපලේඛනයේ ඇතුළත් කරන ලද්දා වූ ද අදාළ තැන්පත්කරුවන් සහ ණයහිමියන් හඳුනාගැනීමට හෝ සම්බන්ධ කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් නොගෙවන ලද්දා වූ ද යම් මුදල් ප්‍රමාණයක් මහ බැංකුව විසින් ඒ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන විශේෂිත ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකුවේ තැන්පත්කරුවන්ට හෝ ණයහිමියන්ට කරන ලද අවසාන බෙදාහැරීමේ දිනයෙන් පසු වසර දහයක කාලසීමාවක් ඇතුළත අයිතිකරුවකු විසින් හිමිකම් නොපාන ලද (6) වන උපවගන්තිය යටතේ තැන්පත් කරන ලද යම් අරමුදල්, බැංකු පනත යටතේ අත්හැර දැමූ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) ආරාවුල් සහිත සියලු හිමිකම්පෑම් අධිකරණය විසින් අනුමත කරනු ලැබීමෙන් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසුව සහ අනුමත කළ හිමිකම්පෑම් වෙනුවෙන් කළ හැකි සියලු ගෙවීම් ගෙවනු ලැබීමෙන් පසුව සහ ගෙවිය නොහැකි වූ සියලු මුදල් ප්‍රමාණ (6) වන උපවගන්තිය යටතේ තැන්පත් කරනු ලැබීමෙන් පසුව, ඉතිරිව ඇත්තා වූ ගණන් බේරා වසා දැමීමෙහි යම් ශුද්ධ මුදල් ශේෂයක්-

(අ) කොටස් හිමියන්ගේ පන්ති අතරෙහි වූ වරණයන්ට පමණක් යටත්ව, කොටස් හිමියන්ගේ අදාළ කොටස් හිමිකාරීත්වයේ නාමික අගයට ප්‍රමාණානුකූලව, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ සියලුම කොටස් හිමියන් අතරෙහි බෙදා හරිනු ලැබිය යුතු ය;

(ආ) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුව රාජ්‍ය සංස්ථාවක් වන අවස්ථාවක දී ආණ්ඩුවට ගෙවනු ලැබිය යුතු ය; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති, ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන කාර්යාලයට ගෙවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකුවකට අදාළව ගණන් බේරා වසා දැමීමේ කටයුතු

87. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකුවක් -

(අ) ඒ බලපත්‍රලාභී බැංකුව, මහ බැංකුවේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාරික කටයුතු වසා දැමීමට අදහස් කරන්නේ නම්;

(ආ) ඒ බලපත්‍රලාභී බැංකුව වෙන ම නෛතික පුද්ගලයකු වූවාක් මෙන් ඊට 66 වන වගන්තියේ ලැයිස්තුගත කර ඇති හේතු කිසිවක් අදාළ වේ නම්; හෝ

(ඇ) ඒ බලපත්‍රලාභී බැංකුව සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති හෝ ඒ බලපත්‍රලාභී බැංකුව ව්‍යාපාරික කටයුතු ප්‍රධාන වශයෙන් කරගෙන යන රට තුළ ඒ බලපත්‍රලාභී බැංකුවට එරෙහිව ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත්නම්, මහ බැංකුව පෙත්සමක් මගින් කරන ඉල්ලීමක් මත,

ඒ බලපත්‍රලාභී බැංකුවට එරෙහිව ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි ය.

(2) බලපත්‍රලාභී බැංකුවක් ගණන් බේරා වසා දැමීමට අදාළ මේ පනතේ මේ කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කර ඇති බලපත්‍රලාභී බැංකුවකට අදාළ වන පරිද්දෙන් ම, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකුවක් ගණන් බේරා වසා දැමීමක දී අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන අදාළ කරගන්නා විට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකුවක්

විසින් ශ්‍රී ලංකාව තුළ කරගෙන යන ව්‍යාපාරයෙන් පැනනගින හෝ අන්‍යාකාරයකින් ඒ ව්‍යාපාරයට අදාළ වන ඒ බලපත්‍රලාභී බැංකුවේ සියලු වත්කම්, වගකීම්, ක්‍රියා සහ නොකර හැරීම්, ඒ බලපත්‍රලාභී බැංකුවට ආරෝපණය කරනු ලැබිය යුතු ය.

(4) ඒ බලපත්‍රලාභී බැංකුව, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කර ඇති බලපත්‍රලාභී බැංකුවක් මෙන්, ඒ බලපත්‍රලාභී බැංකුව සම්බන්ධයෙන් ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට ඇවරකරුට බලය තිබිය යුතු ය.

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකුවකට එරෙහිව ගණන් බේරා වසා දැමීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා වූ අධිකරණයේ ආඥාව භාර දුන් අවස්ථාවේ දී, ඒ බලපත්‍රලාභී බැංකුවට ඇවරකරුගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව කරගෙන යාමට අවසරය ඇති කටයුතු හැර, ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලැබූ එහි සියලු කටයුතු ඒ බලපත්‍රලාභී බැංකුව විසින් නැවැත්විය යුතු ය.

(6) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකුවකට එරෙහිව වූ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ කර ගැනීමේ දී, ඒ බලපත්‍රලාභී බැංකුවේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරයෙන් පැනනගින හෝ අන්‍යාකාරයකින් ඒ ව්‍යාපාරයට අදාළ වන වගකීම් හිලව් කිරීම සම්බන්ධයෙන් සහ වගකීම්වල ශුද්ධ අගය තීරණය කිරීම සම්බන්ධයෙන් 83 වන වගන්තියේ විධිවිධාන පමණක් අදාළ විය යුතු ය.

(7) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති හෝ පිහිටුවා ඇති ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක් විසින්, බැංකු පනත යටතේ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රය ලබාගන්නා අවස්ථාවේ දී, මහ බැංකුවට දෙන ලද පොරොන්දුවට අනුව ඒ බලපත්‍රලාභී බැංකුව විසින් දරන ලද සියලු බැඳීම් සහ වගකීම් ඒ පොරොන්දුව අනුව සම්පූර්ණ කරනු ලබන තෙක්, ඒ බලපත්‍රලාභී බැංකුවට අයත් කිසිදු වත්කමක් ශ්‍රී ලංකාවෙන් ඉවත් නොකරන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ඇවරකරු විසින් ගනු ලැබිය යුතු ය.

88. (1) ගණන් බේරා වසා දැමීම අවසන් කිරීමෙන් පසුව, ඈවරකරු විසින්, බාහිර විගණකවරයකුගේ මතය සමග ඒ බලපත්‍රලාභී බැංකුවේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් සහ ගණන් බේරා වසා දැමීම පිළිබඳ වාර්තාවක් සකස් කර අනුමතය සඳහා අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. ගණන් බේරා වසා දැමීමේ කටයුතු අවසන් කිරීම සහ බලපත්‍රය අවලංගු කිරීම

(2)(1) වන උපවගන්තියේ දක්වා ඇති විගණනය විගණකාධිපතිවරයා විමසා මහ බැංකුව විසින් පත්කරනු ලබන බාහිර විගණකවරයකු විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රලාභී බැංකුවේ වත්කම්වලින් බාහිර විගණකවරයාට පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ දක්වා ඇති බාහිර විගණකවරයාගේ මතයෙහි -

(අ) ඈවරකරුගේ ගිණුම් ප්‍රකාශය සත්‍ය සහ සාධාරණ ද යන්න සහ නිසි පරිදි පිළියෙල කර තිබේ ද යන්න;

(ආ) බලපත්‍රලාභී බැංකුවේ වත්කම් සමග සිදු කරන ලද ඈවරකරුගේ ගනුදෙනුවල සත්‍ය සහ නිවැරදි ප්‍රකාශයක් ඈවරුකරුගේ ගිණුම් ප්‍රකාශයෙන් පිළිබිඹු වන්නේ ද යන්න;

(ඇ) ඒ බාහිර විගණකවරයා විසින් ඈවරකරුගෙන් යම් පැහැදිලි කිරීමක් හෝ තොරතුරක් කැඳවා ඇති අවස්ථාවක, ඈවරකරු විසින් සපයන ලද පැහැදිලි කිරීම හෝ තොරතුර පිළිබඳව සෑහීමකට පත්වන්නේ ද යන්න; සහ

(ඈ) ඈවරකරු මහ බැංකුව මගින් දෙන ලද විධානවලට අනුකූලව ක්‍රියාකර තිබේ ද යන්න,

සඳහන් කළ යුතු ය.

(5) අධිකරණය විසින්, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සහ ගණන් බේරා වසා දැමීම පිළිබඳ වාර්තාව අනුමත කර, අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි යම් ස්ථානයක ඒ බලපත්‍රලාභී බැංකුවේ පොත් හා වාර්තා සහ ගණන් බේරා වසා දැමීමට අදාළ වෙනත් ලේඛන තැන්පත් කිරීමට ඈවරකරුට විධාන කළ හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ අනුමතය ලැබීමෙන් පසුව, ඈවරකරු විසින් මහජනතාවගේ දැනගැනීම සඳහා ඒ අනුමතය පිළිබඳ දැන්වීමක්, යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු ය.

(7) (අ) (6) වන උපවගන්තිය යටතේ අනුමතය පිළිබඳ දැන්වීම පළ කිරීමෙන් පසුව, ඒ දැන්වීම සමාගම් පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද සමාගමකට අදාළ වේ නම්, සමාගම් පනතේ විධිවිධාන යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයෙන් ඒ සමාගමේ නම කපා හරින ලෙසට ඈවරකරු විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.

(ආ) එවිට, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, ඒ සමාගමේ නම ඒ රෙජිස්ටරයෙන් කපා හැර ඒ පිළිබඳ දැන්වීමක් යටත් පිරිසෙයින් ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පත් තුනකවත් පළ කරනු ලැබිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ සමාගමේ නම කපාහැරීම පිළිබඳ දැන්වීම පළ කරනු ලබන දින සිට බලපත්‍රලාභී බැංකුවට එරෙහි ගණන් බේරා වසා දැමීමේ කටයුතු අවසන් කළ යුතු අතර, එතැන් සිට සමාගම විසුරුවා හැරෙන්නේ ය.

(9) විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සහ ගණන් බේරා වසා දැමීම පිළිබඳ වාර්තාව අධිකරණය විසින් අනුමත කිරීම මගින් බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් වන කවර හෝ වගකීමකින් ඈවරකරු නිදහස් කෙරෙන්නේ ය.

(10) යම් අධ්‍යක්ෂවරයකුගේ, ප්‍රධාන විධායක නිලධරයකුගේ, වෙනත් නිලධරයකුගේ හෝ සමාගමේ අයිතිකරුගේ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වගකීමකට, (8) වන උපවගන්තිය යටතේ සමාගමක් විසුරුවා හැරීම මගින් බලපෑමක් සිදු නොවිය යුතු අතර, සමාගම විසුරුවා හරිනු නොලැබූ ලෙසට ඒ වගකීම් තවදුරටත් පැවතිය යුතු ය. තව ද, ඒ වගකීම් ඒ අනුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

බැංකුවේ අධ්‍යක්ෂවරුන් හෝ නිලධරයන් සිදු කරන වැරදි

**89.** (1) ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී බැංකුවක වර්තමාන හෝ අතීත අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වන්නා වූ-

(අ) ඒ බලපත්‍රලාභී බැංකුවේ චංචල සහ නිශ්චල දේපළ හෝ ඉන් කොටසක් ඒ බලපත්‍රලාභී බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර බැහැර කරනු ලැබ ඇති අවස්ථාවක දී හැර, ඒ දේපළ හෝ ඉන් කොටසක් බැහැර කරනු ලැබ ඇත්තේ කෙසේ ද, කවරකු වෙත ද සහ කුමන ප්‍රතිෂ්ඨාවක් සඳහා ද යන්න ඇතුළුව, ඒ බලපත්‍රලාභී බැංකුවේ සියලු චංචල සහ නිශ්චල දේපළවලට අදාළ තොරතුරු ඔහුගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව ඈවරකරුට හෙළිදරව් කිරීමට අපොහොසත් වන;

(ආ) ඈවරකරුට හෝ ඈවරකරු විධාන කරන පරිදි-

(i) ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා භාරයේ හෝ ඒ අධ්‍යක්ෂවරයාගේ හෝ නිලධරයාගේ පාලනය යටතේ ඇති ඒ බලපත්‍රලාභී බැංකුවේ සියලු චංචල සහ නිශ්චල දේපළ; හෝ

(ii) ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා භාරයේ හෝ ඒ අධ්‍යක්ෂවරයාගේ හෝ නිලධරයාගේ පාලනය යටතේ ඇති ඒ බලපත්‍රලාභී බැංකුවට අයත් සියලු පොත්පත්, වාර්තා, රෙජිස්ටර සහ ලේඛන,

ලබා දීමට අපොහොසත් වන;

(ඇ) ඒ බලපත්‍රලාභී බැංකුව ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පෙරාතුව ම වූ මාස දොළහක් තුළ හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක දී-

(i) ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලින් රුපියල් දස දහසක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති යම් කොටසක් සඟවා ඇති හෝ ඒ බලපත්‍රලාභී බැංකුවට අයවිය යුතු හෝ ඒ බලපත්‍රලාභී බැංකුව විසින් ගෙවිය යුතු යම් ණයක් සඟවා ඇති;

(ii) ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලින් රුපියල් දස දහසක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති යම් කොටසක් වංචනිකව ඉවත් කරනු ලැබ ඇති;

(iii) ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලට හෝ කටයුතුවලට බලපාන හෝ අදාළ වන යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ ලේඛනයක් සඟවා ඇති, විනාශ කර ඇති, විකෘති කර ඇති හෝ වංචනිකව වෙනස් කර ඇති හෝ සැඟවීමට, විනාශ කිරීමට, විකෘති කිරීමට හෝ වංචනිකව වෙනස් කිරීමට පෙරෙවියාව ඇති;

(iv) ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලට හෝ කටයුතුවලට බලපාන හෝ අදාළ වන යම් පොතක, රෙජිස්ටරයක, වාර්තාවක හෝ ලේඛනයක යම් අසත්‍ය සටහනක් යොදා ඇති හෝ එසේ යෙදීමට පෙරෙවියාව ඇති;

(v) ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලට හෝ කටයුතුවලට බලපාන හෝ අදාළ වන යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ ලේඛනයක් වංචනිකව වෙන් කර ඇති, වෙනස් කර ඇති හෝ ඒ තුළ යම් අත්හැරීමක් සිදු කර ඇති හෝ වංචනිකව වෙන් කිරීමට, වෙනස් කිරීමට හෝ ඒ තුළ යම් අත්හැරීමක් සිදු කිරීමට පෙරෙවියාව ඇති;

(vi) යම් අසත්‍ය නියෝජනයක් හෝ වෙනත් වංචාවක් මගින්, ඒ බලපත්‍රලාභී බැංකුව සඳහා හෝ ඒ බලපත්‍රලාභී බැංකුව වෙනුවෙන් යම් දේපළක්, ඒ බලපත්‍රලාභී බැංකුව පසුව ගෙවා නොමැති වූ ණයක් මත, ලබා ගෙන ඇති;

(vii) ඒ බලපත්‍රලාභී බැංකුව ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යන බවට අසත්‍ය ලෙස හඟවමින්, ඒ බලපත්‍රලාභී බැංකුව සඳහා හෝ ඒ බලපත්‍රලාභී බැංකුව වෙනුවෙන් යම් දේපළක්, ඒ බලපත්‍රලාභී බැංකුව පසුව ගෙවා නොමැති වූ ණයක් මත ලබාගෙන ඇති; හෝ

(viii) යම් දේපළ උකස් කිරීමක්, ඔඩපනය කිරීමක් හෝ බැහැර කිරීමක් ඒ බලපත්‍රලාභී බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර සිදු වී ඇත්නම් මිස, ණය මත ලබා ගෙන ඇති සහ ඒ සඳහා ගෙවීම් සිදු කර නොමැති ඒ බලපත්‍රලාභී බැංකුවේ යම් දේපළක් උකස් කර ඇති, ඔඩපනය කර ඇති හෝ බැහැර කර ඇති;

(ඈ) ඒ බලපත්‍රලාභී බැංකුවේ කටයුතුවලට අදාළ යම් ප්‍රකාශයක වැදගත් කරුණක් අත්හැරීම සිදු කරන;

(ඉ) යම් තැනැත්තකු විසින් සාවද්‍ය ණයක් බවට ඔප්පු කරනු ලැබ ඇති බව දනිමින් හෝ විශ්වාස කිරීමට හේතු තිබිය දී ඒ කරුණ පිළිබඳව ඇවරකරුට මාස එකක කාලසීමාවක් මුළුල්ලේ දැනුම්දීම පැහැරහරින;

(ඊ) ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලට හෝ කටයුතුවලට බලපාන හෝ අදාළ වන යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම වළක්වන;

(උ) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පෙරාතුව ම වූ මාස දොළහක් තුළ හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක දී ව්‍යාජ අලාභ හෝ වියදම් මගින් ඒ බලපත්‍රලාභී බැංකුවේ දේපළවලින් යම් කොටසක් ගිණුම්ගත කිරීමට උත්සාහ කර ඇති; හෝ

(ඌ) ගණන් බේරා වසා දැමීම ආරම්භ කිරීමට පෙරාතුව ම වූ මාස දොළහක් තුළ හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක දී බලපත්‍රලාභී බැංකුවේ කටයුතුවලට හෝ ගණන් බේරා වසා දැමීමට අදාළ ගිවිසුමකට බලපත්‍රලාභී බැංකුවේ ණයහිමියන්ගේ හෝ ඔවුන්ගෙන් යම් අයකුගේ කැමැත්ත ලබා ගැනීමේ කාර්යය සඳහා යම් අසත්‍ය නියෝජනයක් කර ඇති බවට හෝ වෙනත් යම් වංචනික කටයුත්තක් සිදු කර ඇති බවට හෝ ඒ යම් කටයුත්තක් සිදු කිරීමෙහි ලා සම්බන්ධ වී ඇති බවට සොයා ගනු ලැබ ඇති,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට හේතු වන්නා වූ අවස්ථානුගත කරුණු යටතේ යම් තැනැත්තකු විසින් යම් දේපළක් උකස් කරන, ඔඩපනය කරන හෝ බැහැර කරන අවස්ථාවක දී, ඒ අවස්ථානුගත කරුණු යටතේ එය උකස් කරන ලද, ඔඩපනය කරන ලද හෝ බැහැර කරන ලද බව දනිමින් ඒ දේපළ උකසට ගන්නා හෝ ඔඩපනයට ගන්නා හෝ අන්‍යාකාරයකින් ලබා ගන්නා සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන්නේ ය.

(3) යම් තැනැත්තකුට වංචාවක් සිදු කිරීමේ හෝ යම් තැනැත්තකු මුළා කිරීමේ චේතනාවෙන් බලපත්‍රලාභී බැංකුවට අයත් යම් පොතක්, රෙජිස්ටරයක්, වාර්තාවක්, ලේඛනයක් හෝ ගිණුමක් විනාශ කරන, විකෘති කරන, වෙනස් කරන හෝ වංචනිකව වෙනස් කරන හෝ යම් පොතක, රෙජිස්ටරයක, වාර්තාවක, ලේඛනයක හෝ ගිණුමක යම් අසත්‍ය හෝ වංචනික සටහනක් යොදන හෝ එවැන්නක් යෙදීමට පෙරෙවියාව ඇති, ගණන් බේරා වසා දැමීමට යටත් යම් බලපත්‍රලාභී බැංකුවක සෑම අධ්‍යක්ෂවරයකු ම, නිලධරයකු ම, සේවානියුක්තයකු ම හෝ සේවකයකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන්නේ ය.

සංස්ථාපිත මණ්ඩල විසින් සිදු කරන වැරදි

**90.** මේ පනත යටතේ වරදක් සිදු කරන තැනැත්තකු සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක දී, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව සිටි හෝ විධායක කටයුතු ඉටු කරන නිලධරයකුව සිටි හෝ ලේකම්වරයකුව සිටි සෑම තැනැත්තකු ම, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ ලේකම්වරයා විසින් ඔහුගේ දැනුමකින් තොරව ඒ වරද සිදු කරනු ලැබ ඇති බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට සියලු නිසි උද්‍යෝගයෙන් ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ ලේකම්වරයා විසින් කටයුතු කරනු ලැබූ බව අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් හෝ මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

දණ්ඩන

**91.** මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක්, නියෝගයක්, නියමයක් හෝ විධානයක් හෝ අවශ්‍යතාවයක් උල්ලංඝනය කිරීම හේතුවෙන් හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් වරදකට වරදකරු වන සෑම තැනැත්තෙක් ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ වසර තුනක් නොඉක්මවන

කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

ස්වකීය නිරාකරණය කිරීමේ අධිකාරී බලයේ ඕනෑම අංගයක් සම්බන්ධයෙන් මහ බැංකුවට විධාන නිකුත් කළ හැකි බව

**92.** මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අගතියක් නොමැතිව, මහ බැංකුව විසින්, බලපත්‍රලාභී බැංකුවක නිරාකරණයේ යම් අංගයක් සිදුකළ යුතු ආකාරය සම්බන්ධයෙන් ඒ බලපත්‍රලාභී බැංකුවට විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපනය

**93.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අත්හැර දැමූ දේපළ" යන්නෙන්, බැංකු පනතේ IX වන කොටසේ අර්ථ දක්වා ඇති පරිදි වූ දේපළ සහ මුදල් ව්‍යාපාර පනතේ 23 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අක්‍රීය තැන්පතු අදහස් වේ;

"ලංකා බැංකු ආඥාපනත" යන්නෙන්, (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත අදහස් වේ;

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"සේතු බැංකුව" යන්නෙන්, මහ බැංකුවේ මතය අනුව, පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති නිරාකරණයට යටත් බලපත්‍රලාභී බැංකුවක ඇතැම් තීරණාත්මක කර්තව්‍ය සහ ශක්‍ය මෙහෙයුම් පවරා ගැනීමට සහ අඛණ්ඩව මෙහෙයවීමට හෝ ඒ බලපත්‍රලාභී බැංකුවට අයත් හෝ එය විසින් නිකුත් කළ කොටස්, එක් වත්කමක් හෝ ඊට වැඩි ගණනක්, වගකීම්, නෛතික අයිතිවාසිකම් සහ බැඳීම් හෝ වෙනත් දේපළ සාධන පත්‍ර පැවරීමට මහ බැංකුව විසින් පිහිටුවන ලද ආයතනයක් අදහස් වේ;

"මහ බැංකුව" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"අවසානාත්මක ශුද්ධ අගය තීරණය කිරීම" යන්නෙන්, සමපාර්ශ්වීය සුරැකුම් වැඩපිළිවෙළක විධිවිධානයක් හෝ එවැනි විධිවිධානයක් නොමැති විට, ගිවිසුම්ගත පාර්ශ්වයකට අදාළව පූර්ව නිශ්චිත සිදුවීමක් සිදුවීමෙන් පසුව, ඒ විධිවිධානය මගින් ආවරණය වන, ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් එකිනෙකාට ඉටුකළ යුතු බැඳීම්, ඒ අවස්ථාවේ දී ඒවා ගෙවීමට නියමිත සහ ගෙවිය යුතු වුව ද, එසේ නොවූව ද, ස්වයංක්‍රීයව හෝ එක් පාර්ශ්වකරුවකුගේ තේරීම මත වහාම ගෙවිය යුතු වන, නවීකරණය, අවසන් කිරීම, හිලව් කිරීම හෝ වෙනත් ආකාරයකින් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට ගෙවීමට නියමිත සහ ගෙවිය යුතු, ඒකාබද්ධ බැඳීම්වල මුළු වටිනාකම නියෝජනය කරමින් තනි ශුද්ධ බැඳීමක් මගින් අඩු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම යන පදනම මත, යම් ව්‍යවස්ථාපිත රීතියක් ඇතුළත් ගිවිසුම්ගත විධිවිධානයක් අදහස් වේ;

"සමාගම් පනත" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත අදහස් වේ;

"අධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පිහිටුවා ඇත්තා වූ සහ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින්, ඒ මහාධිකරණය පිහිටුවා ඇත්තේ යම් පළාතක් සඳහා ද, ඒ පළාත ඇතුළත සිවිල් අධිකරණ බලය පවරනු ලැබ ඇත්තා වූ මහාධිකරණය හෝ ඒ සිවිල් අධිකරණ බලය පැවරුණු එවැනි යම් මහාධිකරණයක් යම් පළාතක් සඳහා පිහිටුවනු ලැබ නොමැති විටක දී, බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද මහාධිකරණය අදහස් වේ;

"අර්බුදකාරී කාල" යන්නෙන්, මූල්‍ය අරමුදල් අතරමැදිකරණය, අවදානම් කළමනාකරණය සහ ගෙවීම් පියවීම ඇතුළු ස්වකීය ප්‍රධාන කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීමට මූල්‍ය පද්ධතියට නොහැකි වන කාලසීමාවක් අදහස් වන අතර, අර්බුදකාරී නොවන කාල යන්න ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"තීරණාත්මක කර්තව්‍ය" යන්නෙන්, බලපත්‍රලාභී බැංකුවක් විසින් ඒ බලපත්‍රලාභී බැංකුව හැර වෙනත් තුන්වන පාර්ශ්ව සඳහා සහ තුන්වන පාර්ශ්ව වෙනුවෙන් ඉටුකරන්නා වූ ක්‍රියාකාරකම් වන්නා වූ ද, බලපත්‍රලාභී බැංකුවේ විශාලත්වය හෝ වෙළෙඳපොළ කොටස, බාහිර හා අභ්‍යන්තර අන්තර් සම්බන්ධිතභාවය, සංකීර්ණත්වය හෝ දේශාන්තර ක්‍රියාකාරකම් හේතුවෙන්, ඉන් කිසිවක් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් මූර්ත ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය සඳහා හෝ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වන බැංකු සේවාවලට බාධා ඇති කිරීමට මඟ පාදන්නා වූ ද, ක්‍රියාකාරකම් අදහස් වේ;

"තීරණාත්මක හවුල් සේවා" යන්නෙන්, බලපත්‍රලාභී බැංකුවක් විසින් ම ඉටු කරන හෝ තුන්වන පාර්ශ්වයක සේවා සපයන්නකු විසින් ඉටු කිරීම පිණිස බැහැරට ලබා දී ඇති ක්‍රියාකාරකම් වන්නා වූ ද, ඒ යම් කවර හෝ ක්‍රියාකාරකම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් බලපත්‍රලාභී බැංකුවට තීරණාත්මක කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වීමට ඉඩ ඇත්තා වූ ද, සහ එමඟින් මූර්ත ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය සඳහා හෝ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවාවලට බාධා ඇති කරන්නා වූ ද ක්‍රියාකාරකම් අදහස් වේ;

"අතිවිශේෂ රාජ්‍ය මූල්‍ය ආධාර" යන්නෙන්, පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති බලපත්‍රලාභී බැංකුවක් සඳහා මහ බැංකුවේ අරමුදල් නොවන අරමුදල් මගින් ප්‍රාග්ධනය යෙදවීම අදහස් වේ;

"මුදල් ව්‍යාපාර පනත" යන්නෙන්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත අදහස් වේ;

"මූල්‍ය ක්ෂේත්‍රය" යන්නෙන්, සංස්ථාපිත හෝ තනි පුද්ගල ගනුදෙනුකරුවන් වෙනුවෙන් අරමුදල් කළමනාකරණය කරන හෝ ආර්ථිකයක අරමුදල් පැවරීමට සහ වෙන් කිරීමට මූල්‍ය අතරමැදි සේවා සපයන ආයතනවලින් සමන්විත ආර්ථිකයේ අනු ක්ෂේත්‍රයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත" යන්නෙන්, 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත අදහස් වේ;

"බුන්වත්භාවය" යන්නෙන්, බලපත්‍රලාභී බැංකුවක ශේෂ පත්‍රයෙන් පිළිබිඹු වන පරිදි ඒ බලපත්‍රලාභී බැංකුවේ වගකීම් ඒ බලපත්‍රලාභී බැංකුවේ වත්කම්වලට වඩා වැඩි අවස්ථාවක් අදහස් වේ;

"රක්ෂිත තැන්පතු" යන්නෙන්, 44 වන වගන්තිය යටතේ තැන්පත්කරුවකුට ගෙවිය හැකි උපරිම වන්දි මුදලට යටත් වන සියලුම සුදුසුකම් ඇති තැන්පතු අදහස් වේ;

"රක්ෂිත තැන්පත්කරුවන්" යන්නෙන්, 44 වන වගන්තිය යටතේ තැන්පත්කරුවකුට ගෙවිය හැකි උපරිම වන්දි මුදලට යටත් වන සුදුසුකම් ඇති තැන්පතු දරන්නන් අදහස් වේ;

"ජාත්‍යන්තර මූල්‍ය ආයතන" යන්නට ආසියානු සංවර්ධන බැංකුව, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව, ජාත්‍යන්තර සංවර්ධන සමායතනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හෝ ඒ හා සමාන ආයතන ඇතුළත් වේ;

"ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය" යන්නෙන්, ණය, මූල්‍ය, භාණ්ඩාගාර, මෙහෙයුම්, අනුකූලතා, විගණන, අවදානම් කළමනාකරණ, සමාගම්

ලේකම්, තොරතුරු තාක්ෂණ, තොරතුරුවල ආරක්ෂාව සහ මහ බැංකුව විසින්, කලින් කලට, නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් කර්තව්‍යයක් ඇතුළු කර්තව්‍යවල ප්‍රධානීන් ඇතුළුව, බලපත්‍රලාභී බැංකුවක සමස්ත කළමනාකරණය සහ මෙහෙයවීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු ඒ බලපත්‍රලාභී බැංකුවේ සේවානියුක්තයන් අදහස් වේ;

"බලපත්‍රලාභී බැංකුව" යන්නෙන්, බැංකු පනත යටතේ මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් බලපත්‍රයක් දෙන ලද වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද විදේශීය බැංකුවක ශාඛාවක් ද ඇතුළත් වේ;

"බලපත්‍රලත් විනිමය ස්ථානය" යන්නෙන්, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලත් විනිමය ස්ථානයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතින් පිහිටුවන ලද මුදල් මණ්ඩලය අදහස් වේ;

"ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත" යන්නෙන්, 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත අදහස් වේ;

"ශුද්ධ අගය තීරණය කිරීම" යන්නෙන්, ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර අන්‍යෝන්‍ය ගනුදෙනු මත පදනම් වන හෝ ඒවායින් පැන නගින සියලු

හිමිකම්පෑම් හෝ බැඳීම් හිලව් කිරීමෙන් හෝ ගැලපීමෙන් පසුව ශුද්ධ හිමිකම්පෑම් හෝ බැඳීම් නිශ්චය කිරීම අදහස් වේ;

"බැංකු නොවන මූල්‍ය ආයතන" යන්නෙන්, මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර දෙන ලද මුදල් සමාගම් අදහස් වේ;

"මහජන බැංකු පනත" යන්නෙන්, 1961 අංක 29 දරන මහජන බැංකු පනත අදහස් වේ;

"ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත" යන්නෙන්, 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත අදහස් වේ;

"ප්‍රතිසාධන සැලැස්ම" යන්නෙන්, බලපත්‍රලාභී බැංකුවක මූල්‍ය තත්ත්වයේ පිරිහීමක් පවතින අවස්ථාවක දී, මහ බැංකුව විසින් ඒ බැංකුව වෙනුවෙන් නිරාකරණ ක්‍රියාමාර්ග ගැනීමට පෙරාතුව ඒ බලපත්‍රලාභී බැංකුව විසින් ගනු ලැබිය යුතු පියවර දැක්වෙන සැලැස්මක් අදහස් වේ;

"සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය ඉටු කරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ වෙනත් නිලධරයකු අදහස් වේ;

"නිරාකරණය" යන්නෙන්, බලපත්‍රලාභී බැංකුවේ තීරණාත්මක කර්තව්‍ය අඛණ්ඩව පවත්වාගෙන යාම, මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සහ බදු ගෙවන්නන්ට අවම පිරිවැයක් සහතික කිරීම ඇතුළුව මහජන යහපත ආරක්ෂා කිරීම පිණිස මහ බැංකුවේ නිරාකරණ බලතල ක්‍රියාත්මක කිරීම හරහා මහ බැංකුව විසින් ඒ බලපත්‍රලාභී බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීම අදහස් වේ;

"නිරාකරණය කිරීමේ සැලැස්ම" යන්නෙන්, බැංකු නිරාකරණය කිරීම සඳහා පවතින ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහපත් පරිචයන්ට අනුකූලව පද්ධතිමය වශයෙන් වැදගත්කමක් හෝ බලපෑමක් ඇති එක් එක් බලපත්‍රලාභී බැංකුව වෙනුවෙන් මහ බැංකුව විසින් පිළියෙල කරන ලද සැලැස්මක් අදහස් වේ;

"රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත අදහස් වේ;

"යටත් ණයහිමියා" යන්නෙන්, පහළ ශ්‍රේණිගත කිරීමක් සහිත හෝ බලපත්‍රලාභී බැංකුවක වෙනත් සියලු බැඳීම්වලට වඩා කනිෂ්ඨ වූ ද, ජ්‍යෙෂ්ඨ සුරකුම්පත් හිමියන්ගේ හිමිකම් ගෙවීමෙන් පසුව ගෙවනු ලබන්නා වූ ද, නිකුත් කරන්නාගේ වත්කම්වලට එරෙහි හිමිකම්පෑමක් ඇති ණයහිමියකු අදහස් වේ;

"තාවකාලික මූල්‍ය සහාය" යන්නෙන්, ආණ්ඩුව විසින් තාවකාලික කාලසීමාවක් සඳහා බලපත්‍රලාභී බැංකුවක නිරාකරණය සඳහා හෝ සේතු බැංකුවක් සඳහා මුදල් සැපයීමට දායක වීමට දෙනු ලබන මූල්‍ය සහාය අදහස් වේ;

"අවසන් කිරීම" යන්නෙන්, ව්‍යාපාරයක් ක්‍රමානුකූලව අඩු කිරීම හෝ වසාදැමීම අදහස් වේ; සහ

"ලියා හැරීම" යන්නෙන්, අලාභයක් හෝ වියදමක් පියවා ගැනීමට වත්කමක වටිනාකම අඩු කිරීම අදහස් වේ.

නඩු කටයුතුවලින් ආරක්ෂාව

94. මහ බැංකුවේ නිලධරයන් විසින් සහ 18 වන වගන්තිය යටතේ පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරු විසින්, මේ පනත යටතේ වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සහ ක්‍රියාත්මක කරන, කරන සහ ඉටු කරන අතරතුර දී සිදුකරන ලද යම් හානියක් සඳහා හෝ යම් ක්‍රියාවක් හෝ නොකර

හැරීමක් සඳහා ඒ හානිය, ක්‍රියාව හෝ නොකර හැරීම සද්භාවයෙන් තොරව සිදුකරන ලද බව හෝ එමගින් චේතනාන්විත වැරදි සහගත විෂමාචාරයක් හෝ සිතාමතා කරන ලද පැහැර හැරීමක් සංස්ථාපනය වන බව ඔප්පු කරනු ලැබ ඇත්තේ නම් මිස, වගකීමකට යටත් නොවිය යුතු ය.

අභියාචනා සඳහා වන විධිවිධාන

**95.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ තීරණය ඇතුළුව මහ බැංකුව විසින් ගනු ලැබූ තීරණයකින් හෝ මේ පනත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද යම් නියෝගයකින්, නියමයකින්, රීතියකින්, විධානයකින් හෝ නිශ්චය කිරීමකින්, කරන ලද ඉල්ලීමකින් හෝ කරන ලද නියම කිරීමකින් අතෘප්තියට පත් වූ හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ යම් තීරණයකින්, නියෝගයකින්, නියමයකින්, රීතියකින්, විධානයකින්, නිශ්චය කිරීමකින්, ඉල්ලීමකින් හෝ නියම කිරීමකින් තමාට බලපෑමක් ඇති වේ යයි වටහා ගන්නා වූ යම් තැනැත්තකුට ස්ථිර හෝ අතුරු ඉන්ජන්ෂන් තහනමකට, වාරණ නියෝගයකට, නැවැත්වීමේ ආඥාවකට හෝ මහ බැංකුව විසින් ඒ නියමය බලාත්මක කිරීමෙන් මහ බැංකුව නවත්වාලීමේ, වළක්වාලීමේ හෝ අවහිර කිරීමේ බලපෑම ඇති වෙනත් යම් ආඥාවකට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය, (1) වන උපවගන්තියේ දක්වා ඇති තීරණයකට, නියෝගයකට, නියමයකට, රීතියකට, විධානයකට, නිශ්චය කිරීමකට, ඉල්ලීමකට හෝ නියම කිරීමකට අදාළව අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) වන ඡේදයේ සඳහන් කරන ලද අධිකරණ බලය අයැද සිටින සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම වෙනුවෙන් හෝ ඒ ඉල්ලීමට අදාළ වූ හෝ ක්‍රියාව සිදු කිරීමේ දිනයේ සිට මාස එකක් ඇතුළත කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීම ගොනු කිරීමෙන් මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි ඇතුළත් වන කිසිවකින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීත්‍යානුකූලව අන්‍යාකාරයෙන්

ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතලවලට හෝ (2) වන උපවගන්තියේ දක්වා ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලපෑමක් සිදු නොවිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ කිසිදු ඉල්ලීමක් ඒ ඉල්ලීම පිළිබඳව මහ බැංකුවට දින හතක පූර්ව දැන්වීමක් සිදු කිරීමෙන් තොරව නොකළ යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලපැවැත්විය යුතු බව

**96.** (1) මේ පනතේ විධිවිධාන සහ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(2) ලංකා බැංකු ආඥාපනතේ, මහජන බැංකු පනතේ, ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනතේ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනතේ හෝ රජයට අයත් වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් පිහිටුවනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යවස්ථාවක විධිවිධානවල ඇතුළත් කිසිවක් මගින් මේ පනත යටතේ වූ මහ බැංකුවේ නිරාකරණය කිරීමේ අධිකාරී බලය අත්හැරීමක් හෝ සීමා කිරීමක් සිදුවන ලෙසට තේරුම් නොගත යුතු ය.

ඉතිරි කිරීම

**97.** (1) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය, නියමිත දින සිට බලපවත්වන පරිදි, මේ පනත යටතේ මහ බැංකුවේ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල, නියමිත දින සිට බලපවත්වන පරිදි, මේ පනත යටතේ මහ බැංකුවේ තැන්පතු රක්ෂණ අරමුදල ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ

බැරට පවතින මුදල් ප්‍රමාණය, නියමිත දින සිට බලපවත්වන පරිදි, මේ පනත යටතේ තැන්පතු රක්ෂණ අරමුදලේ බැරට පවතින මුදල් ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට ආරෝපණය කරන ලද සියලු අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, දේපළ, වගකීම්, බලතල, වරප්‍රසාද සහ අධිකාරී බලතල සහ ඒ යෝජනා ක්‍රමයේ ඒ අයිතිවාසිකම්වලින්, වත්කම්වලින්, දේපළවලින් සහ එම වගකීම්වලින් පැනනගින නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති බැඳියාවන්, නියමිත දින සිට බලපවත්වන පරිදි, මේ පනත යටතේ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, දේපළ, වගකීම්, බලතල, වරප්‍රසාද, අධිකාරී බලතල සහ බැඳියාවන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින්-

(අ) සාමාජික ආයතනවලින් එකතු කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලුම වාරික හෝ අතිරේක වාරික;

(ආ) සාමාජික ආයතන මත පනවන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලුම දණ්ඩන;

(ඇ) මුදල් මණ්ඩලය විසින් බලපත්‍රය අවලංගු කර ඇති සාමාජික ආයතනවල තැන්පතුකරුවන්ට ගෙවන ලද සහ ගෙවිය යුතු සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලුම වන්දි මුදල්;

(ඈ) යම් සාමාජික ආයතනයකට ප්‍රදානය කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලු රක්ෂිත ණය හෝ අත්තිකාරම් සහ ඒවායේ යම් අයකර ගැනීමක් සහ, අවස්ථාවෝචිත පරිදි, ඒ ණයවලට හෝ

අත්තිකාරම්වලට එරෙහිව ඔඩපනය කරන ලද සියලුම සමපාර්ශ්වීය සුරැකුම්;

(ඉ) කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලුම ආයෝජන සහ ඒ සඳහා ලැබුණු යම් ප්‍රතිලාභයක්;

(ඊ) පවත්වාගෙන යනු ලබන වෙනත් යම් දේපළකට අදාළ වන හෝ සම්බන්ධ වන සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සියලුම පොත්, ගිණුම් සහ වාර්තා හෝ ඉන් යම් කිසිවක්; සහ

(උ) නියමිත දිනයට පෙරාතුව ගෙවන ලද සියලුම බදු, තීරුබදු, ගාස්තු හෝ ඊට සමාන ස්වභාවයේ වෙනත් යම් අය කිරීම් හෝ ඉන් යම් කොටසක්,

නියමිත දින සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මගින් එකතු කරන ලද වාරික හෝ අතිරේක වාරික, පනවන ලද දණ්ඩන, ගෙවන ලද හෝ ගෙවිය යුතු වන්දි මුදල්, ප්‍රදානය කළ රක්ෂිත ණය හෝ අත්තිකාරම් සහ ඔඩපනය කරන ලද සමපාර්ශ්වීය සුරැකුම්, කරන ලද ආයෝජන සහ ලැබුණු ප්‍රතිලාභ, පවත්වාගෙන යනු ලබන පොත්, ගිණුම් සහ වාර්තා, සහ ගෙවන ලද බදු, තීරුබදු, ගාස්තු හෝ අයකිරීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) යම් නියෝගයක, නිවේදනයක, කොන්ත්‍රාත්තුවක, සාධන පත්‍රයක, වාර්තාවක, කොටස් සහතිකයක, ලේඛනයක, ඔප්පුවක, බැඳුම්කරයක, ගිවිසුමක, ඇපකරයක, ඇටෝර්නි බලපත්‍රයක, නෛතික නියෝජන ප්‍රදානයක සහ වෙනත් කවර හෝ ස්වභාවයක සාධන පත්‍රවල, මුදල් නීති පනත යටතේ මුදල් මණ්ඩලය විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට කර ඇති සෑම සඳහනක් ම, නියමිත දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා මේ පනත යටතේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මුදල් මණ්ඩලය විසින් නිරාකරණය කිරීමේ අධිකාරී බලය සහ දේශාන්තර සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි වෙනත් යම් නියාමන, අධීක්ෂණ හෝ රාජ්‍ය අධිකාරියක් සමඟ එළඹෙන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති යම් ගිවිසුමක්, අවබෝධතා ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක්, නියමිත දින සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ මහ බැංකුව විසින් එළඹෙන ලද ගිවිසුමක්, අවබෝධතා ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) මේ පනත ක්‍රියාත්මක වීම නොතකා, මුදල් මණ්ඩලය විසින් හෝ, අවස්ථාවෝචිත පරිදි, මුදල් නීති පනත, බැංකු පනත හෝ මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද මහ බැංකුවේ වෙනත් යම් නිලධරයකු විසින් ගන්නා ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ තවදුරටත් පවත්වාගෙන යන යම් නිරාකරණ ක්‍රියාමාර්ගයක් හෝ පූර්ව මැදිහත්වීමේ ක්‍රියාමාර්ගයක්, මේ පනත යටතේ ගන්නා ලද යම් නිරාකරණ ක්‍රියාමාර්ගයක් හෝ පූර්ව මැදිහත්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් කාලසීමාවක් සඳහා එකී පනත් යටතේ තවදුරටත් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**98.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය**

[6 වන වගන්තිය]

1. 1988 අංක 30 දරන බැංකු පනත
2. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත
3. 2007 අංක 07 දරන සමාගම් පනත
4. 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.